# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2024

## නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ 235

# 2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

# නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

# වැය ශීර්ෂ 235

## අන්තර්ගතය


| | | පිටු අංක |
|---|---|---|
| පරිච්ඡේදය 01 | - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 3-53 |
| පරිච්ඡේදය 02 | - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 54 |
| පරිච්ඡේදය 03 | - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 55-77 |
| පරිච්ඡේදය 04 | - කාර්ය සාධන දර්ශක | 78-79 |
| පරිච්ඡේදය 05 | - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 80-81 |
| පරිච්ඡේදය 06 | - මානව සම්පත් පැතිකඩ | 82-83 |
| පරිච්ඡේදය 07 | - අනුකූලතා වාර්තාව | 84-91 |

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර,නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව වේ. පරිපාලනය සඳහාත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහාත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

### 1.2 ආයතනයේ දැක්ම , මෙහෙවර, අරමුණු

**දැක්ම**

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

**මෙහෙවර**

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**අරමුණ**

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ,නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ.

### 1.3 ප්‍රධාන කාර්යයන්

I. නීතිය සංග්‍රහ ගත කිරීම.
II. නීතියේ විෂමතා නැති කිරීම.
III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතියද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.
IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.
V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.
VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.
VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.
VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

**IX.** අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්,අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

**X.** නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.

**XI.** සිංහල භාෂාවෙන්,දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

**නීති කොමිෂන් සභාවේ 2024 වර්ෂයේ සමාජිකයන්**

I. ජනාධිපති නීතිඥ ඉක්රම් මොහොමඩ් මහතා (සභාපති)
II. ජනාධිපති නීතිඥ පාලිත කුමාරසිංහ මහතා
III. ජනාධිපති නීතිඥ මනෝහාර ද සිල්වා මහත
IV. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
V. ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු මහතා
VI. ජනාධිපති නීතිඥ අනිල් සිල්වා මහතා
VII. ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා
VIII. ජනාධිපති නීතිඥ චානක ද සිල්වා මහතා
IX. ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
X. නීතිඥ අරිත වික්‍රමනායක මහතා
XI. නීතිඥ ප්‍රියන්ති පීරිස් මිය
XII. ජනාධිපති නීතිඥ මහාචාර්ය නාසිමා කමර්ඩීන් මිය
XIII. නීතිඥ නිර්මලන් විග්නේශ්වරන් මහතා, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්, නීතිපති දෙපාර්තමේන්තුව
XIV. නීතිඥ නිරාන් ඇන්කෙටෙල් මහතා

**නිලබලයෙන් පත් වූ සාමාජිකයන්:**

I. ජනාධිපති නීතිඥ පාරින්ද රණසිංහ මහතා, ගරු නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව
II. දිල්රුක්ෂි සමරසේකර මිය, නීති කෙටුම්පත් සම්පාදක, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
**III.** පියුමන්ති පීරිස් මිය, අතිරේක ලේකම් (නීති, අධිකරණ අමාත්‍යාංශය)

**දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය:**

I. සෙව්වන්දි අබේසේකර මිය,ලේකම් / නීති කොමිෂන් දෙපාර්තමේන්තුව.

II. ලිලන්ති පතිනාගොඩ මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් දෙපාර්තමේන්තුව.

III. යසාංජි චතුරංගිකා මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් දෙපාර්තමේන්තුව.

# 2024.01.01 සිට 2024.12.31 දින දක්වා නීති කොමිෂන් සභාවේ නිර්දේශිතයන්ගේ ප්‍රගතිය

**2024.01.01 සිට 2024.12.31 දක්වා නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාවල ප්‍රගතිය.**

**01. බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ.**

බංකොලොත්භාවය පිළිබඳ නීතිය ප්‍රතිසංස්කරණය හා අදාළ අංක 2023/Cab Memo / J/ L/60 දරන 2023 ජුනි 07 දිනැති කැබිනට් පත්‍රිකාව මගින් අභ්‍යන්තර ආර්ථිකය ශක්තිමත් කිරීමට හා අන්තර්ජාතික ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා වඩා කාර්යක්ෂම බංකොලොත්භාවය පිළිබඳ නීතියක අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

දැනට පවතින 1853 බංකොලොත්භාවය පිළිබඳ ආඥා පනත හා 2007 අංක 07 දරන සමාගම් පනතෙහි බංකොලොත්භාවය පිළිබඳව නීතියේ හිදැස් හා දුරස්ථභාවයන් කැබිනට් පත්‍රිකාව මගින් හඳුනා ගන්නා ලදී.

එමනිසා අන්තර්ජාතික නීතිමය පියවරයන් අනුගත කරමින් වඩා ශක්තිමත් බංකොලොත්භාවය පිළිබඳ නීතියක් යෝජනා කළ යුතු බව කැබිනට් මණ්ඩලය විසින් යෝජනා කර අනුමත කරන ලදී.

කැබිනට් මණ්ඩලය විසින් බංකොලොත්භාවය පිළිබඳව වන ඉහත කරුණු සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව සමග සාකච්ඡාකොට, අවශ්‍ය නව නීති ප්‍රතිසංස්කරණ කෙටුම්පත් කර, එම යෝජනා ඉදිරිපත් කිරීමට නීති කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී.

**වත්මන් තත්ත්වය සහ ප්‍රගතිය:**

**ආරම්භ කළ දිනය: 2023.06.26**

නීති කොමිෂන් සභාව විසින් බංකොලොත්භාවය පිළිබඳ නීතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලදී.

ජනාධිපති නීතිඥ පාරින්ද රණසිංහ මහතා (ගරු නීතිපති තුමා)

ජනාධිපති නීතිඥ වානක ද සිල්වා මහතා - සභාපති

ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා

නීතිඥ නිර්මලන් විග්නේෂ්වරන් මහතා (නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්)

නීතිඥ නිරාන් ඇන්කටෙල් මහතා

නීතිඥ ෂෙහාරා වීරකෝන් මිය - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව.

යෝජිත බංකොලොත්භාවය පිළිබඳ නීතිය ප්‍රතිසංස්කරණය කිරීමේ අවසානාත්මක කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සිංහල හා දෙමල භාෂා පරිවර්තන කටයුතු සිදුවෙමින් පවතින බව ජනාධිපති නීතිඥ වානක ද සිල්වා මහතා සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ෂෙහාරා වීරකෝන් මිය විසින් කොමිෂන් සභාව වෙත දන්වන ලද අතර පරිවර්තන කටයුතු අවසාන වූ පසු කැබිනට් මණ්ඩලය වෙත යොමු

කළ හැකි බවත් 2024.05.30 වන දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී දන්වන ලදී. අධිකරණ අමාත්‍යාංශය මගින් ලෝක බැංකු නියෝජිත කණ්ඩායම විසින් යෝජනා කරන ලද සංශෝධනයන් නීති කොමිෂන් සභාව වෙනුවෙන් එහි බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ සඳහා වන අනු කමිටුවේ සභාපති, ජනාධිපති නීතිඥ වානක ද සිල්වා මහතාගේ නිරීක්ෂණයට යොමු කරන ලදී. 2024 අගෝස්තු 2 වන දින එම ලෝක බැංකු නියෝජිත කණ්ඩායම විසින් යෝජනා කරන ලද සංශෝධනයන්ද ඇතුළුව එම අවසානාත්මක කෙටුම්පත නීති කොමිෂන් සභාව මගින් අනුමත කළ බව, ජනාධිපති නීතිඥ වානක ද සිල්වා මහතා විසින් අධිකරණ අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලදී. යෝජනා කරන ලද සංශෝධනද ඇතුළත්කොට එම කෙටුම්පත ව්‍යවස්ථානුකූලව සහතික කර ගැනීම සඳහා නීතිපති වෙත යොමු කරන ලෙසට අධිකරණ අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී.

2024.08.20 වන දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ෂෙහාරා වීරකෝන් මිය විසින් සිංහල හා දෙමළ පරිවර්තන කටයුතු අවසානවී අවසානාත්මක කෙටුම්පත කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ බව දැන්විය.

2024.08.26 වන දින බංකොලොත්භාවය පිළිබඳ නීතිය ප්‍රතිසංස්කරණය කිරීමේ අවසාන කරන ලද කෙටුම්පත සඳහා කැබිනට් අනුමැතිය ලැබුණු බවට අධිකරණ අමාත්‍යාංශයේ නීති අංශය විසින් නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ ලේකම් දැනුවත් කර ඇත (කැබිනට් පත්‍ර අංක: 24/1714/614/039-1).

නව කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මගින් අධිකරණ අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර ඇති බව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ෂෙහාරා වීරකෝන් මිය විසින් 2024.10.23 දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී දන්වා සිටියාය.

IMF නියෝජිතයන් විසින් නීති කොමිෂන් සභා සමාජිකයන් සමග 2024.10.19 වන දින බංකොලොත්භාවය පිළිබඳ නීති කෙටුම්පතේ ප්‍රගතිය සම්බන්ධයෙන් රැස්වීමක් පැවැත්විය. IMF සාමාජිකයන් විසින් යෝජිත පනතේ නීතිගත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් විමසන ලද අතර ආචාර්ය කබ්රාල් විසින් කෙටුම්පත අනුමැතිය ලබා ගැනීම සඳහා නව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බවට පැහැදිලි කරන ලදී. තවද, ඔහු විසින් අධිකරණ නිලධරයන්ගේ, නියාමන අධිකාරියේ නිලධරයන්ගේ ( සමාගම් රෙජිස්ට්‍රාර්), බැංකුකරුවන් සහ නීති වෘත්තිකයන්ගේ පුහුණු අවශ්‍යතා අවධාරණය කරන ලදී. 2024 නොවැම්බර් 19 වන දින IMF නියෝජිතයන් නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව බැහැදැකීමට පැමිණි අතර යෝජිත බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වන්නාවූ ප්‍රගතිය සහ ගතයුතු අනාගත ක්‍රියා සම්බන්ධයන් නීති කොමිෂන් සභා සාමාජිකයන් සමග රැස්වීමක් පවත්වන ලදී.

**අවසාන කරන ලද වාර්තා :01 (අවසානාත්මක කෙටුම්පතෙහි පිටු විශාල සංඛ්‍යාවක් අන්තර්ගත වන බැවින් මෙම වාර්තාවට ඇතුළත් නොකරන ලදී.එහි පටුන පමණක් ඇතුළත් කොට ඇත.)**

**පාර්ශ්වකරුවන් සමග රැස්වීම් ගණන:05**

**ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය සාකච්ඡා කළ නීති කොමිෂන් සභා රැස්වීම් ගණන: 08**

# පටුන

1. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය

2. අර්ථකථන සහ අර්ථ නිරූපණ

***1. වන කොටස ආයතනික වැඩපිළිවෙළ***

***1 වන පරිච්ඡේදය***

වස්තුභංගත්ව නියාමන අධිකාරිය.

3. වස්තුභංගත්ව නියාමන අධිකාරිය.

4. අධිකාරියේ බලතල, කර්තව්‍යය හා කාර්ය

5. යම් ක්‍රියාවක් ආරක්ෂා කිරීම, අත්හැරීම හෝ තීරණය කිරීම

6. අධිකාරියේ අරමුදල

7. ගිණුම හා විගණනය

***2 වන පරිච්ඡේදය***

**නිල දේපළ භාරගැනුම්කරු**

8. නිල දේපළ භාරගැනුම්කරු සහ නියෝජ්‍ය නිල දේපළ භාරගැනුම්කරු

9. නිල දේපළ භාරගැනුම්කරුගේ බලතල

10. නිල දේපළ භාරගැනුම්කරුගේ ධුරය සහ නම

11. යම් තැනැත්තකු ණයහිමියකු වන විට දී නිල දේපළ භාරකරු වශයෙන් ක්‍රියා කිරීම.

***3 වන පරිච්ඡේදය***

වස්තුභංත්වය පිළිබඳ වෘත්තිකයන්

12. ප්‍රධාන නිලතල දරන්නන් ලෙස පත් කිරීමට සහ ක්‍රියා කිරීමට සුදුසුකම්ලත් තැනැත්තන්

13. පුද්ගල මණ්ඩලයක් නිලතල දරන්නකු ලෙස පත් නොකළ යුතු බව සහ එසේ ක්‍රියා නොකළ යුතු බව.

14. ලියාපදිංචිය

15. කොන්දේසි

16. ලියාපදිංචිය අලුත් කිරීම

17. ලියාපදිංචිය අවලංගු කිරීම.

18. ලියාපදිංචිය අත්හිටුවීම

19. වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ලේඛනය

20. රක්ෂණය

21. නිශ්චිත සිදුවීම් පිළිබඳ දැන්වීම

23. ක්‍රියාකලාපය සහ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂණය

24. විනයානුකූල ක්‍රියාමාර්ග

25. අර්ථ නිරූපණය

## 4 වන පරිච්ඡේදය

## ආයතනික වැඩපිළිවෙළ : විවිධ

26. අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඇවරකරු පත් කිරීමට පෙලඹවීම

27. තහනම් නියෝග

28. අභියාචන

29. වැඩ බැලීමට අවසර දී නැති විට වැඩ බැලීම

30. සම්බන්ධතා ප්‍රකාශය

31. පූර්ව පරිපාලන වියදම් පිළිබඳ ප්‍රකාශය

## II වන කොටස පෞද්ගලික වස්තුභංගත්වය : ප්‍රතිපත්ති

32. පෞද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටි යටතේ ණයකරුවන්ගේ වගකීම්

33. ණයකරු මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය

34. ආරක්ෂිත දේපළ

35. අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, විශ්‍රාම වැටුප් සහ දායක මුදල් ගෙවීම සහ ඒ යටතේ ඇති හිමිකම් ව්‍යවස්ථාපිත පාරිතෝෂික සහ හිමිකම්පෑම

36. සාධාරණ ආදායමක් ආ රක්ෂා කිරීම

37. ඇතුළත් කරන ලද සහ අත්හරින ලද ණය

## III වන කොටස ණය ආරක්ෂා කිරීමේ සහ කල්දැමීමේ නියෝගය

38. ණය ආරක්ෂක ඉල්ලීම

39. ණය ආරක්ෂා කිරීම කල් දැමීමේ නියෝගය කිරීම සඳහා වූ නිර්ණායක

## *V වන කොටස ණය පුනරුත්ථාපන නියෝග*

65. ණය පුනරුත්ථාපන නියෝගය

66. ණය පුනරුත්ථාපනය නියෝගය ලබා ගැනීම සඳහා වූ සුදුසුකම්

67. ණය පුනරුත්ථාපන නියෝගය සඳහා වූ ඉල්ලීම

68. ණය පුනරුත්ථාපනය නියෝගයක් කිරීම සඳහා වූ නිර්ණායක

69. නිල දේපළ භාරගැනුම්කරුගේ නිර්දේශ: ණය පුනර්ථාපන නියෝගය

70. ණය පුනරුත්ථාපන නියෝග පිළිබඳ ඉල්ලීම අධිකරණය විසින් තිරණය කිරීම

71. ණය පුනරුත්ථාපන නියෝගයේ බලපෑම

72. ණය පුනරුත්ථාපන නියෝගයේ කාලසීමාව

73. ණයවලින් නිදහස්වීම

74. ණය පුනරුත්ථාපන නියෝගය නිල දේපළ භාරගැනුම්කරු විසින් අධීක්ෂණය කළ යුතු බව

75. ණය පුනරුත්ථාපන නියෝගය සඳහා ණයහිමියාගේ විරෝධය

76. ණය පුනරුත්ථාපන නියෝගය අවසන් කිරීම

77. බංකොලොත්භාවය පිළිබඳ නියෝග පැවරීම කිරීම

78. කල් තබාගැනීමේ නියමයක් සඳහා නිල දේපළ භාරගැනුම්කරු විසින් ඉල්ලිමක් කළ හැකි බව

79. ණය ව්‍යුහගත කිරීමේ නියමයෙන් නිදහස් කිරීම/ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

80. බලයලත් මැදිහත්කරුවන්

## **VI කොටස : බංකොලොත්භාවය**

### *1 වන පරිච්ඡේදය බංකොලොත්භාවය පිළිබඳ ඉල්ලීම් සහ බංකොලෙත්භාවය පිළිබඳ නියෝග.*

81. බංකොලොත්භාවය පිළිබඳ නියමයක් ලබා ගැනීම සඳහා වූ ණයකරුගේ ඉල්ලිම

82. ණයකරු ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටිය යුතු බව.

83. ණයකරුගේ ඉල්ලීම මත බංකොලොත්භාවය පිළිබඳ නියෝගය සඳහා වු නිර්ණායක

84. ණයකරුගේ ඉල්ලීම මත බංකොලොත්භාවය පිළිබඳ නියෝගය කිරීම

85. බංකොලොත්භාවය පිළිබඳ නියෝගය සඳහා වූ පෙත්සම

86. බංකොලොත්භාවය පිළිබඳ පෙත්සම : ණයකරුගේ කොන්දේසි

87. බංකොලොත්භාවය පිළිබඳ පෙත්සම : ඉල්ලා අස්කර ගැනීම, නවතා ගැනීම, නිශ්ප්‍රභ කිරීම සඳහා අධිකරණයට ඇති බලය

88. ණයහිමියාගේ පෙත්සමේ හේතු

89. බංකොලොත්භාවය පිළිබඳ දැන්වීම සහ මුදල් ගෙවීමට ඇති නොහැකියාව

90. බංකොලොත්භාවය නියෝගය සඳහා පෙත්සම පිළිබඳ අධිකරණයේ තීරණය

91. අතුරු දේපළ භාරගන්නා

### 2 වන පරිච්ඡේදය බංකොලොත්භාවය පිළිබඳ නියෝග බලපෑම

92. බංකොලොත්භාවය ආරම්භ වීම

93. නඩු කටයුතු නැවැත්වීම සහ ප්‍රතිකර්ම

94. මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය

95. අතිවිශේෂ අවස්ථාවල දී ණයහිමියන් හමුවීම

96. විශේෂ අවස්ථාවල දී බංකොලොත්භාවය පිළිබඳව මහජනතාව විසින් පරීක්ෂා කිරීම

### 3 වන පරිච්ඡේදය : නිල දේපළ භාරගැනුම්කරුවන් සහ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවන් පත් කිරීම

97. නිල දේපළ භාරගැනුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරු බවට පත්වීම

98. භාරකරුවන් පත් කිරීම

99. භාරකරුවන් ඉවත් කිරීම සහ ධූරය අත්හැරීම

100. භාරකරුවන් නිදහස් කිරීම

### 4 වන පරිච්ඡේදය :බංකොලොත්භාවය පිළිබඳ නිල දේපළ භාරගැනුම්කරුගේ කාර්ය සහ කර්තව්‍ය

101. බංකොලොත්භාවය පිළිබඳ නිල දේපළ භාරගැනුම්කරුගේ සාමාන්‍ය කර්තව්‍ය සහ නිල නාමය

102. බංකොලොත්භාවය පිළිබඳ නිල දේපළ භාරගැනුම්කරුගේ බලතල

103. නිල දේපළ භාරගැනුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරු නොවන අවස්ථාවල දී ණයහිමියන්ගේ කමිටුව

104. බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ කටයුතු අධිකරණය විසින් සමාලෝචනය කිරීම

105. භාරකරුගේ පරිශ්‍රමක, වියදම් සහ පාරිතෝෂිකය

106. භාරකරු විසින් ගිණුම් තබා ගත යුතු බව සහ තොරතුරු ලබා දිය යුතු බව

107. බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ ගිණුම් විගණනය කිරීම

108. මුදල්වලට අදාළව බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ කාර්යභාරය

### *5 වන පරිච්ඡේදය : බංකොලොත්භාවය තුළ ණය*

109. බංකොලොත්භාවය තුළ ඔප්පු කළ යුතු ණය

110. අන්‍යෝන්‍ය ණය සහ හිලව් කිරීම්

111. බංකොලොත්භාවය තුළ දී ණයවල ප්‍රමුඛතාවය

### 6 *වන පරිච්ඡේදය : බංකොලොත්භාවය තුළදී ණයකරුගේ කාර්ය භාරය.*

112. බංකොලොත්භාවයට ලක් වී ඇති ණයකරුගේ සාමාන්‍ය වගකීම්

113. දේපළ සොයා ගැනීම සහ අත්කර ගැනීම පිළිබඳ ණයකරුගේ බැඳීම

114. මූල්‍ය තොරතුරු

### *7 වන පරිච්ඡේදය : බංකොලොත්භාවය තුළ ණයකරුගේ දේපළ*

115. බංකොලොත්භාවය පිළිබඳ බූදලයේ විස්තර

116. බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ දේපළ පවරා ගැනීම

117. පසුව අත්කරගත් දේපළ

118. භාරකරු විසින් දේපළ සන්තකයේ තබා ගැනීම

119. බංකොලොත්භාවයට පත් තැනැත්තාගේ දේපළ තහනමට ගැනීම

120. දේපළ හිමි නොවන බවට ප්‍රකාශ කිරීම

121. දේපළ කළමනාකරණය කිරීමට ණයහිමියන්ට අවසර දීමට ඇති බලය

122. කුලී සින්නක්කර පදනම මත භාණ්ඩ මිල දී ගැනීම

123. ඇතැම් අවස්ථාවල දී නිල දේපළ භාරගැනුම්කරු සහ භාරකරු වගකීමෙන් නිදහස් කිරීම

124. දෙවන බංකොලොත්භාවය

125. ණය ආපසු ගෙවීමේ නියෝගය

126. ණය ආපසු ගෙවීමේ ගිවිසුම

127. අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මියගිය තැනැත්තාගේ බූදලය

### *8 වන පරිච්ඡේදය : ඇතැම් ගනුදෙනුවල දී බංකොලොත්භාවයේ බලපෑම*

128. හිරිහැර කිරීමේ ප්‍රමාද කිරීමේ හෝ ණයකරු වෙත පැවරීමේ අරමුණ ඇතිව අවලංගු කළ හැකි ප්‍රමුඛතා අවලංගු කළ හැකි පිළිබැඳිම් සහ දේපළ අන්සතු කිරීම

129. අඩු වටිනාකමකට කරනු ලබන ගනුදෙනු

130. දැන්වීමකින් තොරව සද්භාවයෙන් සිදු කරන ලබන ගනුදෙනු ආරක්ෂා කිරීම

131. බංකොලොත්භාවය පිළිබඳ ණයකරුට සහ පැවරුම්ලාභියා ගෙවන ලද මුදල් වලංගුභාවයට පත් කිරීම

132. පොත් ණය පිළිබඳ සාමාන්‍ය පැවරීම්

133. ත්‍රාසග්‍රහණ ණය ගනුදෙනු

134. බංකොලොත්භාවයට පෙර අවසන් කරනු ලැබුවහොත් මිස ලියා අත්සන් කිරීමේ හෝ වෙනත් ක්‍රියාවලියක ප්‍රතිලාභ නොතිබීම.

135. බංකොලොත්භාවය අතරතුර පිස්කල්වරයාගේ කාර්යභාරය

*9 වන පරිච්ඡේදය : දේපළ බෙදාදීම.*

136. බංකොලොත්භාවය තුළ දී දේපළ බෙදාහැරීම

*10 වන පරිච්ඡේදය : බංකොලොත්භාවය අවසන්වීම*

137. බංකොලොත්භාවයේ කාලසීමාව

138. නිදහස් කිරීම

139. නිදහස් කිරීම ඉහළ වටිනාකමක් ඇති බංකොලොත්භාවයන්

140. නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා වූ ඉල්ලීම

141. නිදහස් කිරීම තාවකාලිකව අත්හිටුවීම

142. නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා වූ ඉල්ලීම : බංකොලොත්භාවය පිළිබඳ වාර්තාව

143. නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා වූ ඉල්ලිම පිළිබඳව අධිකරණය විසින් තීරණය කිරීම

144. බංකොලොත්භාවයෙන් නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම

145. බංකොලොත්භාවය පිළිබඳ නියෝගය අවලංගු කිරීම

146. බංකොලොත්භාවය පවතින අතරතුර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වූ ඉල්ලිම

*11 වන පරිච්ඡේදය : නිල දේපළ භාරගැනුම්කරු*

147. බංකොලොත්භාවයට පත් වී ඇති කාලය තුළ දී ණයකරුගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරුගේ බලතල

148. බංකොලොත්භාවය පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරුගේ සාමාන්‍ය කාර්යපටිපාටිය

*12 වන පරිච්ඡේදය : බංකොලෙත්භාවය අතරතුර හවුල් ව්‍යාපාර*

149. හවුල් ව්‍යාපාරය පිළිබඳ අවස්ථාවල දී බංකොලොත්භාවය පිළිබඳ ඉල්ලීම් සහ බංකොලොත්භාවය පිළිබඳ පෙත්සම්

150. ඇතැම් වගඋත්තකරුවන්ට එරෙහිව ඇති පෙත්සම් නිශ්ප්‍රභ කිරීමේ බලතල

151. කොටස්කරුවන්ගේ දේපළ එකම භාරකරු වෙත සතු කළ යුතු බව

152. බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් සහ බංකොලොත්භාවයේ පිළිබඳ ණයකරුවකුගේ කොටස් හිමියන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග

153. ඒකාබද්ධ කොන්ත්‍රාත් පිළිබඳ ක්‍රියාමාර්ග

154. හවුල් ව්‍යාපාරයේ නමින් නඩු කටයුතු පවත්වාගෙන යාම

***VII කොටස පුද්ගලික වස්තුභංගත්වලේඛනය***

155. පුද්ගලික වස්තුභංගත්ව*ලේඛනය* පවත්වාගෙන යාම සඳහා වූ අධිකාරි බලය

156. පුද්ගලික වස්තුභංගත්වයේ ලේඛනයේ කාර්ය

157. පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය වාර්තාගත කළ යුතු තොරතුරු

158. පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ තොරතුරු ඉවත් කිරීම

159. පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයට ප්‍රවේශය ලබා ගැනීම

160. යම් ක්‍රියාවක් හෝ අත්හැරීමක් සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරු හෝ අධිකාරිය වගකිව යුතු නොවන බව

161. පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය සහ ණය තොරතුරු කාර්යාංශය

***VIII කොටස පුද්ගලික වස්තුභංගත්ව වැරදි***

### *1 වන පරිච්ඡේදය : වැරදි - සාමාන්‍යය : විධිවිධාන*

162. අරමුණ

163. මේ කොටස යටතේ දණ්ඩන සහ වැරදි

164. නිදහස් කිරීමෙන් පසුව අපරාධ වගකීම්

### *2 වන පරිච්ඡේදය : පුද්ගලික වස්තුභංගත්ව වැරදි*

165. පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටි ඉල්ලීම් : අසත්‍ය තොරතුරු

166. පුද්ගල වස්තුභංගත්ව කාර්යපටිපාටි : ණය හිමියන්ගේ වගකීම්වලට අනුකූලව ක්‍රියා නොකිරීම

167. පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටිය : ලේඛන සහ වාර්තා

168. පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටිය දේපළ බැහැර කිරීම

169. පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටි : ණය සහ ව්‍යාපාර

### *3 වන පරිච්ඡේදය බංකොලොත්භාවය : පිළිබඳ වැරදි*

170. බංකොලොත්භාවය පිළිබඳ වැරදි : නියෝජන සහ කරුණු හෙළිදරව් නොකිරීම

171. බංකොලොත්භාවය පිළිබඳ වැරදි : දේපළ

172. බංකොලොත්භාවය පිළිබඳ වැරදි : ලේඛන

173. බංකොලොත්භාවය පිළිබඳ වැරදි : ණය සහ ණයට ගැනීම

174. බංකොලොත්භාවය පිළිබඳ වැරදි : අසත්‍ය හිමිකම්පෑම්

175. බංකොලොත්භාවය පිළිබඳ වැරදි : ශ්‍රී ලංකාව හැරයාම

176. බංකොලොත්භාවය : ණයකරුවන්ගේ නියෝජනවලට අනුකූලව ක්‍රියා නොකිරීම සහ වගකීම්

177. බංකොලොත්භාවය සැඟවීමේ අරමුණ ඇතිව වාර්තා ඉදිරිපත් නොකිරීම.

IX ***වන කොටස X වන කොටස සමාගම් බේරා ගැනීම***

IX ***වන කොටස අද්මිනිස්ත්‍රාසි කිරීම***

### *1 වන පරිච්ඡේදය අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය*

178. අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය

2 වන පරිච්ඡේදය අද්මිනිස්ත්‍රාසිකරණ ක්‍රියාපිළිවෙළ

179. අද්මිනිස්ත්‍රාසි කටයුතු ආරම්භ වීම

180. අද්මිනිස්ත්‍රාසිකරණයේ ක්‍රම

### *3 වන පරිච්ඡේදය අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම*

181. අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් ක්‍රියාකිරීම සඳහා පත් කළ හැකි තැනැත්තන් කවුරුන් ද යන වග

182. පත් කිරීම සඳහා හෝ වැඩ බැලීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා නුසුදුසුකම්

183. අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කළ හැක්කේ කවර තැනැත්තකුටද

184. අද්මිනිස්ත්‍රාසිකරුවන් දෙදෙනෙකු හෝ වැඩි ප්‍රමාණයක් පත් කිරීම

185. සමාගම විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම

186. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම

187. සමාගම විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම පිළිබඳ සීමා කිරීම්

188. ඇවරකරුවකු විසින් හෝ තාවකාලික ඇවරකරුවකු විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම

189. සුරක්ෂිත ණයහිමියකු විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම

190. අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම

191. අද්මිනිස්ත්‍රාසිකරුගේ කටයුතු ආරම්භ වීම වාර්තා ගත කල යුතු බව

192. අද්මිනිස්ත්‍රාසිකරුවන් පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කළ නොහැකි බව

193. අද්මිනිස්ත්‍රාසිකරුගේ පත් කිරීම පිළිබඳ දැන්වීම සහ විස්තර

194. ලේඛන මගින් අද්මිනිස්ත්‍රාසි කිරීම පිලිබඳ  සඳහන් කළ යුතු බව

195. නම වෙනස් කිරීම පිළිබඳව අද්මිනිස්ත්‍රාසි ලේඛනවල සඳහන් කළ යුතු බව

### *4 වන පරිච්ඡේදය අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම*

196. අද්මිනිස්ත්‍රාසිකරණ කිරීම අතරතුර බැඳීම් ක්‍රියාත්මක නොකළ යුතු බව

197. අද්මිනිස්ත්‍රාසිකරණය කිරීම අතරතුර දේපළ ආපසු ලබා නොගත යුතු බව

198. අද්මිනිස්ත්‍රාසිකරණය කිරීම අතරතුර නඩු කටයුතු ආරම්භ කිරීම හෝ දිගටම පවත්වාගෙන යාම ආරම්භ නොකළ යුතු බව

199. අද්මිනිස්ත්‍රාසිකරණය මගින් අතරතුර ක්‍රියාවේ යෙදවීම හෝ  වෙනත් කාර්යපටිපාටියක් ක්‍රියාත්මක නොකළ යුතු බව

200. අද්මිනිස්ත්‍රාසිකරණය කිරීමට පෙර  අවසන් කරනු ලැබුවහොත් මිස ක්‍රියාවේ යෙදවීමේ හෝ වෙනත් ක්‍රියාවලියක ප්‍රතිලාභ අත්කර නොගත යුතු බව

201. අද්මිනිස්ත්‍රාසි කිරීම අතරතුර  පිස්කල්ගේ කාර්යභාරය

202. අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙර ක්‍රියාත්මක කරනු ලබන බලතල

203. ස්ථිර ඇප ක්‍රියාත්මක කිරීම සඳහා  අවසර ගැනීම සඳහා තීරණ කාලය තුළ දී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම

204. දැන්වීම් නිකුත් කිරීම සඳහා කැමැත්ත හෝ අවසරය අවශ්‍ය නොවන බව

205. සමාගමේ අධ්‍යක්ෂවරුන් සහ වෙනත් නියෝජිතයන් කෙරෙහි අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම

206. අද්මිනිස්ත්‍රාසිකරු වෙත තොරතුරු සැපයීම සඳහා වූ නියමය

207. සේවානියුක්තයන් කෙරෙහි අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම

208. දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදි අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම

209. කොටස් පැවරීම මත අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම

210. අද්මිනිස්ත්‍රාසිකරණය කිරීමේ අත්‍යවශ්‍ය සේවා

### 5 වන පරිච්ඡේදය අද්මිනිස්ත්‍රාසි කිරීමේ ක්‍රම

**අ- සාමාන්‍ය සහ කඩිනම් කරන ලද ක්‍රමවලට අදාළ විධිවිධාන**

211. සාමාන්‍ය සහ කඩිනම් කරන ලද ක්‍රමවලට අදාළ විධිවිධාන

ආ - සාමාන්‍ය ක්‍රම

212. ආරම්භක රැස්වීම

213. ප්‍රතිඵල ලබාදීමේ රැස්වීම

214. ප්‍රතිඵල ලබාදෙන රැස්වීමේ කටයුතු

**ඇ- කඩිනම් කිරීමේ ක්‍රම**

215. ඒකාබද්ධ කරන ලද ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීම

216. ඔප්පු සමාලෝචනය කිරීමේ පරීක්ෂණය

**ඈ- ක්‍රම දෙකටම අදාළ වන කරුණු**

217. අද්මිනිස්ත්‍රාසිකරණය කිරිමේදි ණය හිමියන්ගේ කමිටුව

218. කොටස් හිමියන්ගේ ණය හිමියන්ගේ සහ කමිටුවේ අද්මිනිස්ත්‍රාසිකරණය කිරීම පිළිබඳ රැස්වීම්

219. අද්මිනිස්ත්‍රාසිකරණ කිරිම පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ

220. අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වන අවස්ථාව

### 6 වන පරිච්ඡේදය සමාගමේ වැඩපිළිවෙල පිලිබඳ ඔප්පු සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන්

### සමාගමේ වැඩ පිළිවෙල පිළිබඳ ඔප්පු

221. ඔප්පුවක ඇතුළත් විය යුතු කරුණු

222. ඔප්පුවක් යටතේ තුන්වන පාර්ශවයන් නිදහස් කිරීම

223. ඔප්පුවක අවශ්‍යතාවය

224. ඔප්පුවකින් බැඳී සිටින ප්‍රමාණය

**ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන්**

225. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන්

226. ඔප්පු *අද්මිනිස්ත්‍රාසිකරුවෙකු* ලෙස පත් කරනු ලැබිය හැකිවනුයේ සහ ක්‍රියා කල හැකි වනුයේ කවර තැනැත්තන්ද

227. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් දෙදෙනෙකු හෝ වැඩි ප්‍රමාණයක් පත්කිරීම

228. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය කිරීම ආරම්භ වන අවස්ථාව සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන්පත් කරන අවස්ථාව

229. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් පත්කිරීම සඳහා වන ඇප

230. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන්පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කළ නොහැකි බව

***සමාගමේ ඔප්පු වැඩපිළිවෙලේ වලංගුභාවය වෙනස් කිරීම සහ අවසන් කිරීම***

231. ඔප්පුවක වලංගුභාවය පිළිබඳව අධිකරණය විසින් තිරණය කල හැකි බව

7 වන පරිච්ඡේදය අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල

232. අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල

233. සහයෝගය ලබා දෙන ලෙස අද්මිනිස්ත්‍රාසිකරුගෙන් ඉල්ලා සිටීම

234. පත් කල තැනැත්තාගේ පත්වීම හෝ ලබා ගැනීම අවසන් වන බවට අද්මිනිස්ත්‍රාසිකරුගේ දැන්වීම

235. අද්මිනිස්ත්‍රාසිකරු විසින් කොටස් පිළිබඳ ඇමතුම් කිරීම

236. අද්මිනිස්ත්‍රාසිකරු විසින් ලේඛන ලියා අත්සන් කිරීම

237. බැඳීමකට යටත්ව ඇති දේපළක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති බලතල

## ***8 වන පරිච්ඡේදය - අද්මිනිස්ත්‍රාසිකරු සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්ය භාරය***

***අ- විමර්ශනය කිරීම සඳහා වූ කාර්ය භාරය***

238. සමාගමේ කටයුතු විමර්ශනය කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය භාරය

***ආ වාර්තා කිරීමට ඇති කාර්ය භාරය***

239. වැරදි ක්‍රියා වාර්තා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය භාරය

240. සිදු කරන ලද වරදක් වාර්තා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය භාරය

241. ගිණුම් පිළියෙල කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය භාරය

242. අවසාන වාර්තාව යැවීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය භාරය

243. අවසාන වාර්තාව යැවීමට ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය භාරය

***ඇ- විවිධ කාර්ය භාර***

244. මුදල්වලට අදාළව අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය භාරය

245. ගිණුම් වාර්තා පිළිබඳව අද්මිනිස්ත්‍රාසිකරුට සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය භාරය

## ***9 වන පරිච්ඡේදය අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය සහ අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙර වියදම් අනුමත කිරීම***

246. අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය

247. අද්මිනිස්ත්‍රාසිකරුට පෙර වියදම් අනුමත කිරීම

### *10 වන පරිච්ඡේදය - අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම*

248. අද්මිනිස්ත්‍රාසිකරුගේ හානිපූර්ණය

249. කලින් පැවැති සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම යටතේ අද්මිනිස්ත්‍රාසිකරුගේ බැරකම

250. ගිවිසුම් පිළිබඳව කුලිය පිලිබඳව අද්මිනිස්ත්‍රාසිකරුගේ බැරකම

251. යම් දෝෂයක් සිදුවීමේදි වගකීමෙන් නිදහස්වීම

### *11 වන පරිච්ඡේදය -අද්මිනිස්ත්‍රාසිකරු සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය කිරීම - විවිධ*

252. අද්මිනිස්ත්‍රාසිකරු විසින් සිදු කරන ලද ක්‍රියාවක් නිර්බල කිරීම

253. අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරය අත්හැරීම

254. ණය හිමියන් විසින් අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයෙන් ඉවත් කිරීම

255. අද්මිනිස්ත්‍රාසිකරුගේ ප්‍රතියෝජනය කිරීම

256. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කිරීම සහ ප්‍රතියෝජනය කිරීම

257. ඇවරකරට හෝ තාවකාලික ඇවරකරුට වැඩ ආරම්භ කරන ලෙස නියෝග කිරීම

258. අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කිරීම

259. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු වෙත ලේඛන යොමුකිරීම

260. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ අවසන් වන අවස්ථාව

### *12 වන පරිච්ඡේදය -අද්මිනිස්ත්‍රාසිකරු සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු පිළිබඳව අධිකරණයට ඇති බලතල*

261. අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ ඔප්පුඅද්මිනිස්ත්‍රාසිකරුගේ විසින් විධාන කිරීම සඳහා වු ඉල්ලීම

262. අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය හෝ පත්වීම පිළිබඳ නියෝග

263. අද්මිනිස්ත්‍රාසිකරුගේ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පිළිබඳ අධිකරණයේ සාමාන්‍ය බලතල

264. අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා වු නියෝගය

265. අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ධුරයෙන් ඉවත් කිරීම

266. ව්‍යාපාර හෝ දේපළ ආරක්ෂා කර ගැනිම සඳහා වූ නියෝග

267. ණය හිමියන්ගේ සහ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

268. අද්මිනිසිත්‍රාසිකරණයේදි ණය හිමියන් ආරක්ෂා කිරීම සඳහා වු නියෝග

## X කොටස - සමගි සම්මුතිය

269. අර්ථනිරූපණය

270. සමගි සම්මුතිය යෝජනාව

271. යෝජිත සමගි සම්මුතිය පිලිබඳ දැන්විම

272. සමගි සම්මුතියේ බලපෑම

273. සමගි සම්මුතිය වෙනස් කිරීම

274. සමගි සම්මුතියට අදාළව අධිකරණය සතු බලතල

275. සමගි සම්මුතියේ පිරිවැය

## XI කොටස MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල

276. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල :

277. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල :සාමාන්‍ය කොන්දේසි

278. MSMEසමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල : සුදුසුකම් ලැබීමේ නිර්ණායක

279. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල : විධානාත්මක විධිවිධාන

280. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල : සුරක්ෂිත ණය හිමියන් සහ දේපළ අයිතිවාසිකම්

281. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල : පුද්ගලික වස්තුභංගත්ව යෝජිතයෙකු පත් කිරීම

282. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල :MSME ණය හිමියන්ගේ යෝජනා පිළියෙල කිරීම

283. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල සාකච්ඡා කිරීමේ රැස්වීම්

284. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල : ණය හිමියන් විසින් අනුමත කිරීම

285. අනුමත කල MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල නිල භාරකරුට ඉදිරිපත් කිරීම

286. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල අධිකරණය විසින් ස්ථිර කිරීම

287. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල අධිකරණය විසින් ස්ථිර කිරීමේ බලපෑම

288. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල : අභියෝගයට ලක් කිරීම

289. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල : වෙනස් කිරීම

290. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල : අවසන් කිරීම

291. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල : සම්පූර්ණ කිරීම

292. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවෙකුගේ කාර්ය භාරය

293. පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරු MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල :

294. පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු : MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල :

295. MSME සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල : අධිකරණයේ නියෝග

## ***XII* කොටස ඇවර කිරීම**

### *1 වන පරිච්ඡේදය - ඇවරකරුගේ කාර්ය භාරය*

296. ඇවරකරුගේ කාර්ය භාරය

### *2 වන පරිච්ඡේදය - ඇවර කිරීමේ ක්‍රියා පිළිවෙල*

297. ඇවර කිරීම ආරම්භ වනුයේ කවර අවස්ථාවේදිද?

298. ඇවරකරු පත්කිරීම

299. සමාගම හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇවරකරු පත්කිරීම පිළිබඳ සිමා කිරිම්

300. ඇවරකිරීම ආරම්භ කල බව වාර්තාගත කල යුතු බව

301. ප්‍රතිඵල රැස්විමේදි ඇවරකරු පත්කිරීම

302. ණය ගෙවීමේ හැකියාව පිළිබඳ ප්‍රකාශය

303. ණය ගෙවිමට ඇති නොහැකියාව පිළිබඳ සාක්ෂි

304. තාවකාලික ඇවරකරුවෙකු පත්කිරීම

305. ඇවරකිරීමේදි අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

306. ණය හිමියන්ගේ රැස්විමක් ඇවරකරු විසින් කැඳවිය යුතු බව

307. ඇවරකරු ප්‍රතීයෝජනය කිරීම

308. ඈවරකිරීමේදි ණය හිමියන්ගේ කමිටුව පත් කිරීම

309. ඈවරකිරීම පිළිබඳ දායකවීමේ කමිටුව

310. ඈවරකිරීමේදි කොටස් හිමියන්ගේ ණය හිමියන්ගේ දායක වන සහදායකයන්ගේ සහ කමිටුවල රැස්වීම

311. ඈවර කිරීම අවසන්වීම

### *3 වන පරිච්ඡේදය ඈවරකරුවෙකු හෝ තාවකාලික ඈවරකරවෙකු පත් කිරීම*

312. ඈවරකරුවෙකු වශයෙන් පත් කල යුත්තේ සහ ක්‍රියාකල යුත්තේ කවුරුන්ද යන වග

313. ඈවරකරුවෙකු වශයෙන් පත් කිරීම හෝ ක්‍රියා කිරීම සඳහා වන නුසුදුසුකම්

314. ඈවකවරුන් හෝ තාවකාලික ඈවරකරුවන් දෙදෙනෙකු හෝ වැඩි පිරිසක් පත්කිරීම

315. ඈවරකරු පත්කිරීමේ දැන්වීම සහ විස්තර

316. ඈවරුකරු වෙත යොමු කල යුතු ලේඛන

### *4 වන පරිච්ඡේදය - ඈවරකිරීමේ බලපෑම*

317. ඈවරකිරීම තුළදි බැඳීමක් ක්‍රියාත්මක නොකළ යුතු බව

318. ඈවරකිරීමේ ක්‍රියාවලිය තුළදි නඩු කටයුතු පවත්වාගෙන යාම හෝ ආරම්භ කිරීම නොකළ යුතු බව

319. ඈවැකිරීම අතරතුරු ලියා අත්සන් කිරිම හෝ වෙනත් ක්‍රීයාවලියක් සිදු නොකළ යුතු බව

320. ඈවර කිරීමට පෙර අවසන් කරනු ලැබුවහොත් මිස ලියා අත්සන් කිරීමේ හෝ වෙනත් ක්‍රියාවලියක ප්‍රතිලාභ ලබා නොගත යුතු බව

321. ඈවරකිරීම අතරතුර පිස්කල්වරයාගේ කාර්ය භාරය

322. ඈවරකිරීම ආරම්භ කිරීමට පෙර ක්‍රියාත්මක කරනු ලබන බලතල

323. සමාගමේ අධ්‍යක්ෂවරුන් සහ වෙනත් නියෝජිතයන් කෙරෙහි ඈවරකිරීමේ බලපෑම

324. ඈවරකරුට තොරතුරු ලබාදිය යුතු බවට වූ නියමය

325. දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදි ඈවර කිරීමේ බලපෑම

326. කොටස් පැවරීමේදි ඈවර කිරීමේ බලපෑම

327. ඈවරකිරීමේ අතවශ්‍ය සේවා

328. තාවකාලික ඈවරකරුවන්ට මෙම පරිච්ඡේදයේ ( ඈවරකිරීමේ බලපෑම යන පරිච්ඡේදය) අදාළවීම

### 5 වන පරිච්ඡේදය - ඈවරකරුගේ බලතල

405. දේපළ භාරගැනුම්කරුගේ කාර්ය භාරය ක්‍රියාත්මක කිරීම සඳහා වූ නියෝගය

406. අධිකරණය විසින් දේපළ භාරගැනුම්කරු ධූරයෙන් ඉවත් කිරීම

407. දේපළ භාරගැණුම්කාරත්වය සතු දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ නියෝග

## *XIV කොටස දේශ සීමා හරහා වන වස්තුභංගත්වය*

408. විදේශීය සමාගම්

## *XV කොටස වස්තු බංගත්වය*

### *1 වන පරිච්ඡේදය -ණය ගෙවීමට නොහැකිවීම සහ වැරදි සහගත වෙළඳාම්*

409. ණය ගෙවීමට නොහැකිවීම

410. අධිකරණය විසින් ඉල්ලීම ප්‍රතික්ෂේප කල හැකි බව

411. වැරදි සහගත වෙළඳාම

### *2 වන පරිච්ඡේදය- අවලංගු කල හැකි ගණුදෙනු*

412. අවලංගු කල හැකි ප්‍රමුඛතා

413. අවලංගු කල හැකි බැඳීම්

414. යම් ණයහිමියකුගෙන් සැඟවීම සඳහා ණය ගෙවීම ප්‍රමාද කිරීම සඳහා හෝ ණයහිමියකුට වංචා කිරීම සඳහා දේපළ අන්සතු කිරීම

415. අවලංගු ප්‍රමුඛතාවයක් අවලංගු බැඳීමක් හෝ දේපල අන්සතු කිරීමක් අවලංගු කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය

416. අවලංගු කල හැකි ප්‍රමුඛතාවයක් අවලංගු කළ හැකි බැඳීමක් හෝ අන්සතු කිරීමක් ඉවත් කිරීම පිළිබඳ අධිකරණ ආඥා

417. අවලංගු කල හැකි ප්‍රමාණතාවයක් අවලංගු කල හැකි බැඳීමක් හෝ අන්සතු කිරීමක් අවලංගු කිරීම සඳහා අධිකරණ ආඥා

418. අඩු තක්සේරුවක් මත ගණුදෙනු කිරීම

419. වැරදි ක්‍රියා

420. අර්ථ නිරූපණය

### *3 වන පරිච්ඡේදය -ෆිනික්ස් සමාගම්*

421. ෆිනික්ස් සමාගම

422. පෞද්ගලික බැරකම

423. සමාගම් දැන්වීමේ අනුප්‍රාප්තිකයා ලෙස නම් කර ඇති තැනැත්තා වෙනුවට ව්‍යතිරේකය

424. තාවකාලික කාලය සඳහා ව්‍යතිරේකය

425. ක්‍රියාකාරී වන සමාගමක් සම්බන්ධයෙන් වන ව්‍යතිරේකය

## *4 වන පරිච්ඡේදය -ණය ගත් බව හිලව් කිරීම බෙදා හැරීම සහ ලේඛන යැවීම පිළිබඳ සාක්ෂි*

426. ණය පිළිබඳ සාක්ෂි සහ ණය ඔප්පු කිරීම

### *අ- හිලව් කිරීම*

427. බංකොලොත් ණයකරුවෙකු සහ වෙනත් පාර්ශවයන් අතර හිලව්කිරීම

428. සමාගමක් සහ වෙනත් පාර්ශ්වයක් අතර හිලව් කිරීම

### *ආ- බෙදාහැරීම්*

429. බෙදා හැරීම්

### *ඇ ණය හිමියන්ට ලේඛන යැවීම සහ ඉවත්වීම*

430. ණය හිමියන්ට සහ ඉවත් වී ඇති ණය හිමියන්ට ලේඛන යැවීම

## *XVI කොටස සාමාන්‍ය සහ විවිධ*

### *1 වන පරිච්ඡේදය*

### *සාමාන්‍යය*

431. වස්තුභංගත්ව ගිණුම සහ වස්තුභංගත්ව අතිරික්ත ගිණුම

432. අතිරික්ත මුදල් පිළිබඳ ඉල්ලීම

433. ණය හිමියාගේ යෝජනා සම්මතය

434. සහදායක යෝජනා සම්මතය

435. දේපළ තහනමට ගැනීම හෝ බැහැර කිරීම සම්බන්ධයෙන් වූ ආරක්ෂාව

436. ක්‍රියාවල වලංගුභාවය

437. කාල සීමාව දීර්ඝ කිරීම

438. විශේෂ තනතුරු දරන්නාට අවශ්‍ය ලේඛන

439. ඉල්ලීම් සහ දූන්වීම්

### *2 වන පරිච්ඡේදය - වැරදි*

440. අද්මිනිස්ත්‍රාසි කිරීමට හෝ ඈවර කිරීමට පෙර අධ්‍යක්ෂවරයෙකුගේ හෝ වෙනත් නිලධරයෙකුගේ වැරදි ක්‍රියාවක්

441. වංචනික වෙළඳාම්

442. අද්මිනිස්ත්‍රාසි කිරීමට හෝ ඈවර කිරීමට අදාළ වැරදි

443. තහනම් කරන ලද ක්‍රියා කලාප

444. නිසි පරිදි ගිණුම් තබා නැති අවස්ථාවලදි බැරකම

445. අසත්‍ය හෝ නොමඟ යවන සුළු ප්‍රකාශ

446. සේවක අර්ථසාධක අරමුදල ,සේවක භාර අරමුදල සහ පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත යන පනත් අද්මිනිස්ත්‍රාසි කිරීමට සහ ඈවර කිරීමට අදාළවීම

### *3 වන පරිච්ඡේදය -අධිකරණ බලය සහ කාර්ය පටිපාටිය*

447. අධිකරණ බලය

448. වැරදි පිළිබඳ නඩු විභාගය සහ දඬුවම් පැනවීම

449. කාර්ය පටිපාටිය

450. අතුරු සහන

451. පිරිවැය

452. අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම

453. වැරදි සම්බන්ධයෙන් වන සාමාන්‍ය විධිවිධාන

### *නඩු පැවරීම සඳහා වූ පවරන ලද බලතල*

454. අධිකරණ නියෝග

455. නියෝග

456. රීති , ප්‍රමිති ,පරිචය විධාන, ආචාර ධර්ම පද්ධති සහ මාර්ගෝපදේශ

## *XVII කොටස - අවසානය*

### *ඉල්ලීම*

457. ඉල්ලීම

### *සංශෝධන*

458. සමාගම් පනතේ 46 වන වගන්තිය

459. සමාගම් පනතේ 71 වන වගන්තිය

460. සමාගම් පනතේ 88 වන වගන්තිය

461. සමාගම් පනතේ 92 වන වගන්තිය

462. සමාගම් පනතේ 97 වන වගන්තිය

463. සමාගම් පනතේ 213 වන වගන්තිය

464. සමාගම් පනතේ 214 වන වගන්තිය

465. සමාගම් පනතේ 220 වන වගන්තිය

466. සමාගම් පනතේ 228 වන වගන්තිය

467. සමාගම් පනතේ 246 වන වගන්තිය

468. සමාගම් පනතේ X කොටස

469. සමාගම් පනතේ 394 වන වගන්තිය

470. සමාගම් පනතේ 431 වන වගන්තිය

471. සමාගම් පනතේ 433වන වගන්තිය

472. සමාගම් පනතේ 529 වන වගන්තිය

473. සමාගම් පනතේ පළවන වන උපලේඛනය

474. සමාගම් පනතේ හය වන උපලේඛනය

475. සමථ මණ්ඩල පනතේ තුන්වන වන උපලේඛනය

476. දේශිය ආදායම් බදු පනතේ 175 වන වගන්තිය

***ඉවත් කිරීම්***

477. ඉවත් කිරීම්

***අන්තර්කාලින විධිවිධාන සහ ඉතිරිකිරීම්***

478. අන්තර්කාලින විධිවිධාන සහ ඉතිරිකිරීම්

479. අන්තර්කාලින විධිවිධාන : වස්තුබංත්ව වෘත්තිකයන්

පළමුවන උපලේඛනය

අධිකාරියේ සංයුතිය

දෙවන උපලේඛනය

බැහැර කරන ලද අස්ථිත්වයන්

තුන්වන උපලේඛනය

සම්බන්ධිත පාර්ශවයන්

හතරවන උපලේඛනය

ඇවර කිරීමේදි වරණිය හිමිකම්පෑම්

පස්වන උපලේඛනය

ණය හිමියන්ගේ සහ සහදායකයන්ගේ රැස්වීම් සඳහා වූ කාර්ය පටිපාටිය

හය වන වගන්තිය

අන්තිම කැමති පත්‍රයක් නොතබා මිය ගිය තැනැත්තකුගේ බංකොලොත්භාවයට පත් වූ බූදලය කළමනාකරණය කිරීම

හත් වන උපලේඛනය

අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල

අට වන උපලේඛනය

සුරක්ෂිත කරන ලද ණය හිමියන්ගේ විකල්ප

නව වන උපලේඛනය

ඇවරකරුවකුගේ බලතල

දසවන උපලේඛනය

දේපළ භාරගැනුම්කරුගේ බලතල

**02. 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතේ විධිවිධාන සංශෝධනය කිරීම.**

**ආරම්භ කළ දිනය: 2024.01.18**

නීති කොමිෂන් සභාව විසින් මෙකී පනතට අදාළව අවශ්‍ය සංශෝධන සලකා බැලීම සඳහා වන අනු කමිටුව සඳහා පහත සාමාජිකයන් පත් කරන ලදී.

1. ජනාධිපති නීතිඥ පාරින්ද රණසිංහ මහතා (ගරු නීතිපති තුමා)
2. නීතිඥ නිර්මලන් විග්නේෂ්වරන් මහතා (නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්)
3. නීතිඥ නිරාන් ඇන්කටෙල් මහතා

**වත්මන් තත්ත්වය සහ ප්‍රගතිය:**

ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත ක්‍රියාත්මක කිරීමේදී එහි අරමුණුවලට පටහැනිව අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවන බව ජනාධිපති නීතිඥ පාරින්ද රණසිංහ මහතා කොමිෂන් සභාවේ අවධානයට යොමු කළේය. ශ්‍රී ලංකා රජය පාර්ශ්වකරුවකු වන ගිවිසුමට අනුව, මෙරටට රැගෙන එන බාලවයස්කාර දරුවන් සති හයක් ඇතුළත ඔවුන්ගේ සුපුරුදු වාසස්ථානයට ආපසු යැවිය යුතුය. එසේම, ප්‍රකාශිත කොන්දේසිවලින් නොවුවද, එවැනි කරුණු ඉක්මනින් නෙරපා හැරිය යුතු බව අපගේ නීතියේ දක්වන බවද අවධානයට ලක් කෙරුණි. තවද, පනතින් අභියාචනාවක් කිරීම සඳහා විධිවිධාන නොමැති නමුත්, අතෘප්තිමත් පාර්ශ්ව විසින් අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන ඉල්ලා සිටින බවත්, විශේෂ අවසරයකින් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන බවත්, ඒ අනුව ගොනු කර ඇති කරුණු අවසන් කරන බවත් ජනාධිපති නීතිඥ පාරින්ද රණසිංහ මහතා කොමිෂන් සභාවේ අවධානයට යොමු කළේය. මේ සඳහා එකී පනත යටතේ දීර්ඝ කාලයක් ගතවන අතර බාලවයස්කාර ළමයා වයස අවුරුදු 16ට එළඹි විට, මෙම ප්‍රමාදය හේතුවෙන් නීතියේ විධිවිධාන ක්‍රියාත්මක වීම නවතින අතර නීතියේ පරමාර්ථය ඉටු නොවේ.

තවද මෙම තත්ත්වය, අයුතු ලෙස බැහැරට රැගෙන යන ලද බාලවයස්කාර ළමයින් ඔවුන්ගේ අධිකරණ බල ප්‍රදේශයට ආපසු යැවීම සඳහා වෙනත් රටවල් විසින් කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් වන විටදීද රජය අපහසුතාවයට පත් කරයි.

එමනිසා, එකී නීතියට සුදුසු සංශෝධන නිර්දේශ කිරීමේ අරමුණින්ද එම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් සහ එම නීතිය යටතේ නඩු කටයුතු ප්‍රමාදවීම් වැළැක්වීමේ අරමුණින් මෙම කරුණු සොයා බලන ලෙස ජනාධිපති නීතිඥ පාරින්ද රණසිංහ මහතා කොමිෂන් සභාවට යෝජනා කළේය.

නිර්මලන් විග්නේෂ්වරන් මහතා විසින් 2020 අගෝස්තු මස 31 වන දින දී කලින් පැවති නීති කොමිෂන් සභාව වෙත සකසා ඉදිරිපත් කරන ලද 2021 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත සම්බන්ධ සංශෝධන පිළිබඳ වාර්තාව සහාගත කර සාකච්ඡා කරන ලදී. කෙටුම්පත වැඩි දියුණු කර 2024.08.29 වන දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී සාකච්ඡා කරන ලද යෝජනාද ඇතුළත් කර එම වාර්තාව නැවත ඉදිරිපත් කිරීමට අනු කමිටුව එකඟ විය.

2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත සම්බන්ධයෙන් නිර්මලන් විග්නේෂ්වරන් මහතා විසින් සකසන ලද අතිරේක වාර්තාව 2024.10.23 දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී සභාගත කර සාකච්ඡා කරන ලදී. යෝජිත සංශෝධනයන් පහත දැක්වෙන කරුණු සමග එකඟ වන බවට නීතිඥ නිර්මලන් විග්නේෂ්වරන් මහතා කොමිෂන් සභාවට පැහැදිලි කළේය.

අ) වාචික සාක්ෂිය සුවිශේෂී අවස්ථාවන්ට සීමා කිරීම.

ආ) හරස් ප්‍රශ්න ඇසීමට නියෝග කළහොත් නඩුව දිනපතා විභාග කිරීම.

ඇ) විදේශීය සාක්ෂිකරුවන්ගේ වියදම් සඳහා ආරක්ෂාව සැපයීම.

ඈ) නිවාඩු සමග ශ්‍රේෂ්ඨාධිකරණයට ඍජු අභියාචනයක් කිරීම.

ඉහත අ, ආ සහ ඇ ක්‍රියාත්මක කිරීම සඳහා වත්මන් පනතේ 15 වන වගන්තිය සංශෝධනය කළ යුතු බව නීතිඥ නිර්මලන් විග්නේෂ්වරන් මහතා විසින් 2024.10.23 දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී පැහැදිලි කරන ලදී. තවද, ඉහත ඈ ලබාදීම සඳහා 23 (අ) වගන්තිය ලෙස නව වගන්තියක් හඳුන්වා දිය යුතු බවද ඔහු පෙන්වා දුන්නේය. ජනාධිපති නීතිඥ චානක ද සිල්වා මහතා විසින්ද හරස් ප්‍රශ්න ඇසීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන ලදී. නීතිඥ නිරාන් ඇන්කටෙල් මහතා විසින් වැඩිදුරටත් පැහැදිලි කර දැක්වූයේ ඉවත් කිරීම් කිරීමේදී " දරුවන්ගේ හොඳම යහපත" යන සංකල්පය නවීන ජාත්‍යන්තර අධිකරණවල භාවිතාවක් බවයි. ඉහත කරුණු පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් මීළඟ නීති කොමිෂන් සභාවේදී ඉදිරිපත් කරන බව නීතිඥ ඇන්කටෙල් මහතා දන්වා සිටියේය.

**සාකච්ඡා කරන ලද පර්යේෂණ පත්‍රිකා ගණන : 03 (එක් පර්යේෂණ වාර්තාවක දීර්ඝ වශයෙන් නඩු තීන්දු විග්‍රහ කිරීමක් අන්තර්ගත වී ඇති බැවින් හා සැළකිය යුතු පිටු ගණනක් අන්තර්ගත බැවින් එම වාර්තාවේ පිටපතක් ඇතුළත් නොකරන ලදී)**

**ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය සාකච්ඡා කළ නීති කොමිෂන් සභා රැස්වීම් ගණන: 08**

**<u>2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතේ විධිවිධාන සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන නීති කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන වාර්තාව.</u>**

<u>හැඳින්වීම.</u>

1. 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතේ (ළමා පැහැරගෙන යාම පනත) සංශෝධන නිර්දේශ කරමින් නීති කොමිෂන් සභාව වෙත වාර්තාවක් ("පළමු වාර්තාව") ඉදිරිපත් කර ඇත. ළමා පැහැරගෙන යාම පනතේ විධිවිධාන "ළමයාගේ උපරිම ශුභ සිද්ධිය" යන මූලධර්මය ප්‍රමාණවත් ලෙස ඇතුළත් නොකිරීම මත මෙම සංශෝධනයන් යෝජනා කර ඇති බව පෙනේ. ළමා පැහැරගෙන යාම පනත සහ "ළමයකුගේ උපරිම ශුභ සිද්ධිය වෙනුවෙන් ක්‍රියා කිරීම" යන මූලධර්මය අතර ඇති නොගැලපීම මත මෙම තර්කය පදනම් වී ඇත. මෙම යෝජනාවට පාදක වී ඇත්තේ, (පනත පදනම් වී ඇති) හේග් හි දී සම්මත කර ගන්නා ලද ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ වූ සම්මුතිය ("හේග් සම්මුතිය") සහ (ළමයාගේ උපරිම ශුභ සිද්ධිය පිළිබඳ මූලධර්මය අනාවරණය කරනු ලබන) ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අතර පවතින නොගැලපීම් සම්බන්ධයෙන් වෙනත් සමහර අධිකරණ බල ප්‍රදේශවල ඉදිරිපත් කරන ලද තර්කයන් වේ.

2. ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, ඉහත තර්කයන්, ළමා පැහැරගෙන යාම පනත සහ 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ("අයි. සී. සී. පී. ආර්. පනත") අතර නොගැලපීමක් යැයි කියනු ලබන්නකට ප්‍රකාශනය වේ. වඩා නිශ්චිතව දක්වන්නේ නම්, (පැහැරගෙන ගිය ළමයෙකු ආපසු යැවීමේ ප්‍රමුඛස්ථානය ලබාදෙන) ළමා පැහැරගෙන යාම පනතේ 10 හා 11 වගන්ති අතර සහ (සියලුම අධිකරණ කටයුතුවලදී ළමයා ප්‍රමුඛ විය යුතු බව නියම කරනු ලබන උපරිම ශුභ සිද්ධිය පිළිබඳ මූලධර්මය දක්වන) අයි. සී. සී. පී. ආර්. පනතේ 5 (2) වගන්තිය ලෙසට වේ.

3. මෙම වාර්තාව මගින් ප්‍රතිවිරුද්ධ මතයක් දක්වයි. ළමයාගේ උපරිම ශුභ සිද්ධිය දැනටමත් ළමා පැහැරගෙන යාම පනතට ඇතුළත් කර ඇති බවත්, යෝජිත සංශෝධන මගින් හේග් සම්මුතියේ අරමුණු පසෙකලනවා පමණක් නොව ළමයින්ගේ සුපුරුදු වාසස්ථානවලින් ඔවුන් අයුතු ලෙස රැගෙන ඒමට අනුබල දෙන බවත් වාර්තාව මගින් පැහැදිලි කරන අතර එය පොදුවේ දරුවන්ගේ සුබසාධනයට බරපතල තර්ජනයක් ද වේ. විශේෂයෙන් ගෝලීයකරණය වැඩිවීමේ සන්දර්භය තුළ සහ විවිධ ජාතීන්ට අයත් දෙමාපියන් සිටින පවුල් ඒකක තුළදී අයුතු ලෙස රැගෙන ඒමට දිරිගැන්වීමේ ප්‍රතිවිපාක විනාශකාරී බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇත. තවද, යෝජිත සංශෝධන මගින් ශ්‍රී ලංකාව හේග් සම්මුතිය යටතේ ඇති වගකීම් කඩ කිරීම් සිදුවනු ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකික පුරවැසියන්ට වෙනත් රාජ්‍යයන් විසින් හේග් සම්මුතිය යටතේ ආරක්ෂාව ප්‍රතික්ෂේප කරනු ඇත.

4. කෙසේවෙතත්, ළමා පැහැරගෙන යාම පනත ක්‍රියාත්මක කිරීමේදී බරපතල ගැටළු පැනනගින බවට මෙම වාර්තාව දක්වයි. ළමා පැහැරගෙන යාම පනත යටතේ පනවා ඇති නඩු විභාග අවසන් කිරීමේ අසීමිත ප්‍රමාදය, පැහැරගෙන යන දෙමාපියන්ට පද්ධතිය තුළ "නුසුදුසු අයුරින් ක්‍රියා කිරීමට" සහ ඔවුන්ගේම වැරදි ක්‍රියාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට අවස්ථා සලසයි. මෙම තත්ත්වය තුළ, මෙම වාර්තාව ළමා පැහැරගෙන යාම පනතේ යම් යම් සංශෝධන නිර්දේශ කරනුයේ, ප්‍රමාදයන් අවම කිරීම සඳහා සැලසුම් කිරීමට වේ. දීර්ඝ කාලීන නීතිමය ක්‍රියාමාර්ග ළමයාගේ උපරිම ශුභ සිද්ධියට හේතු වන බවට තර්කයක් තිබිය නොහැක. එම තත්ත්වයන් තුළ මෙම යෝජනා කොමිෂන් සභාව විසින් ඒකමතිකව පිළිගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

5. මෙම වාර්තාව පහත ආකාරයට ව්‍යුහගත කර ඇත. 1වන වගන්තිය මෙම වාර්තාවේ දළ විශ්ලේෂණයක් සපයයි. 2 වන වගන්තිය මගින් ළමා පැහැරගෙන යාම පනතේ (හේග් සම්මුතිය) ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානයෙන් අයුතු ලෙස පැහැරගෙන ගිය ළමයෙකු ආපසු පැමිණීම සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන විධිවිධාන සහ පනතට ගොඩනගා ඇති ආරක්ෂණ සහ පරීක්ෂණ ඉස්මතු කරයි. 3 වැනි වගන්තියේ පළමු වාර්තාවේ නීති කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කර ඇති තර්ක සාරාංශ ගත කර ඇත. 4 වැනි වගන්තියේ, කොමිෂන් සභාව ඉදිරියේ ඇති යෝජනා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ තර්ක ඉදිරිපත් කර ඇත. 5 වැනි වගන්තියේ, ළමා පැහැරගෙන යාම පනත යටතේ නඩු කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන් පිළිබඳ විස්තර සහ එවැනි ප්‍රමාදයන් අවම කිරීමේ යෝජනා සමග දක්වා ඇත.

***<u>ළමා පැහැරගෙන යාම පනතේ සහ සම්මුතියේ විධිවිධාන.</u>***

6. මෙම කොටස පහත සඳහන් ක්ෂේත්‍රවල කරුණු දක්වයි:

(අ) හේග් සම්මුතියේ අරමුණ සහ කාර්යය.

(ආ) ළමා පැහැරගෙන යාම පනත යටතේ වන නඩු භාරකාර නඩු විභාග **නොවේ.**

(ඇ) ළමා පැහැරගෙන යාම පනත මගින් ළමයාගේ උපරිම ශුභ සිද්ධිය ආරක්ෂා කරන බව සහතික කරයි.

*සම්මුතියේ අරමුණ.*

7. හේග් සම්මුතියේ [1] , එම සම්මුතියේ පූර්විකා වගන්තිය මගින් පෙන්නුම් කර ඇති පරිදි ළමයාගේ උපරිම ශුභ සිද්ධිය සලකා බැලීම ඇතුළත් කර ඇත.

වත්මන් සම්මුතියට අත්සන් කර ඇති රාජ්‍යයන් විසින්,

ළමයින්ගේ භාරකාරත්වය සම්බන්ධ කාරණාවලදී ළමයින්ගේ උපරිම ශුභ සිද්ධිය සඳහා ප්‍රමුඛස්ථානය දීම වැදගත් බව තරයේ ඒත්තු ගැන්වීම,

ජාත්‍යන්තරව ළමුන් අයුතු රැගෙන ඒමට හෝ රඳවා තබා ගැනීමේ හානිකර බලපෑම්වලින් ආරක්ෂා කිරීමට සහ ඔවුන්ගේ සුපුරුදු පදිංචි වාසස්ථානයට ඔවුන් කඩිනමින් ආපසු පැමිණීම සහතික කිරීම සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමට මෙන්ම ප්‍රවේශවීමේ අයිතිවාසිකම් සඳහා ආරක්ෂාව සුරක්ෂිත කිරීමට අපේක්ෂා කිරීම සම්බන්ධව,

සම්මුතියක් අවසන් කිරීමට තීරණය කර ඇති අතර, පහත සඳහන් විධිවිධානවලට එකඟ වී ඇත.

[1] හේග් හී දී සම්මත කර ගන්නා ලද ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය (1980).

8. ළමා පැහැරගෙන යාම පනතේ (සහ හේග් සම්මුතියේ) පරමාර්ථය වන්නේ, ජාත්‍යන්තර දේශසීමා හරහා දෙමාපියෙකු හෝ හරකරුවෙකු විසින් ළමයකු (මෙහි මින් මතු "පැහැරගෙන යාම" යනුවෙන් සඳහන් කරනු ලබන) අයුතු ලෙස බැහැරට රැගෙන යාම සහ/හෝ රඳවා තබා ගැනීම සහ/හෝ පැහැර ගැනීම වැළැක්වීම වේ. එබැවින්, එය 'භාරකාර' නඩුවකින් වෙනස් වේ.

*සම්මුතියේ මූලික අරමුණ වනුයේ,* ***භාරකාර අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් වෙනත් කොන්ත්‍රාත් රාජ්‍යකට ගෙන යන ලද හෝ රඳවා තබා ගෙන සිටින ළමයින් වහාම ආපසු යැවීම සහතික කිරීමයි.*** *ක්ෂණික ප්‍රතිලාභය පෙර පැවති තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමට අදහස් කෙරේ. ප්‍රතිෂ්ඨාපනය කිරීමට නියමිත උල්ලංඝනය කරන ලද භාරකාර අයිතිය බැහැරට රැගෙන යාමේදී හෝ රඳවා තබා ගන්නා අවස්ථාවේදී පැවතිය යුතු වේ".* [2]

9. හේග් සම්මුතියේ අරමුණු නම්:[3]
*(අ) කිසියම් කොන්ත්‍රාත් රාජ්‍යයකට අයුතු ලෙස බැහැරට රැගෙන යන ලද හෝ රඳවා තබා ගන්නා ලද ළමයින් ඉක්මනින් ආපසු යැවීම සුරක්ෂිත කිරීම;*

*(ආ) එක් කොන්ත්‍රාත් රාජ්‍යයක නීතිය යටතේ භාරකාරත්වයේ සහ ප්‍රවේශයේ අයිතිවාසිකම් අනෙක් කොන්ත්‍රාත් රාජ්‍යයේ ඵලදායී ලෙස ගරු කරනු ලබන බව සහතික කිරීම.*

10. ළමා පැහැරගෙන යාම පනතේ අරමුණ සහ කාර්යය හේග් සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිණිස සඳහා වූ පනතක් වීමද ඉහත කරුණුවලට සමාන වේ.

*මෙම නඩු කටයුතු භාරකාර නඩු විභාග* ***නොවේ.***

11. ළමා පැහැරගෙන යාම පනතේ 19 වැනි වගන්තියට අනුව, ළමයකුගේ ආපසු පැමිණීම සම්බන්ධයෙන් කරන ලද ඕනෑම නියෝගයක්, භාරකාරත්වයේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් තීරණයක් හෝ නිශ්චය කිරීමක් ලෙස සැලකිය **නොහැකි** බව සැලකිල්ලට ගත යුතුය. මෙම කොටස හේග් සම්මුතියේ 19 වන වගන්තිය ප්‍රතිරාවය කිරීම සඳහා ක්‍රියාත්මක වන අතර එහි දැක්වෙනුයේ, *"ළමයා ආපසු පැමිණීම සම්බන්ධයෙන් මෙම සම්මුතිය යටතේ තීරණයක් කිසිදු භාරකාර ගැටළුවක කුසලතාවක් පිළිබඳව තීරණයක් ලෙස නොගත යුතුය" යනුවෙනි.*

12. ජාත්‍යන්තර ළමා පැහැරගැනීම් අවස්ථාවලදී, යම් යම් ආරක්ෂාවන්ට යටත්ව, හිමිකම් පෑම ආරම්භ වූ රට වෙත ළමයා කඩිනමින් ආපසු පැමිණීම සහතික කිරීම තුළින් ළමයාගේ අවශ්‍යතාවය හොඳින් ඉටුවන බවට උපකල්පනයක් පවතී. [4] එවිට පහළින් පවතින මූලධර්මය නම්, භාරකාර අයිතිවාසිකම් ආරවුල තීරණය කළ යුත්තේ එසේ කිරීමට වඩාත් සුදුසු සංසදය විසිනි. මන්දයත් එසේ කිරීම ළමයාගේ යහපතට හේතු වනු ඇත. බාලවයස්කාර උසාවියකට හෝ වෙනත් විශේෂිත උසාවියකට නඩු පැවරීමේදී භාවිත කරනු ලබන එකම මූලධර්මය මෙයයි.

[2] HC/E/DE 321 [17/08/1999; Oberlandesgericht Celle (අභියාචනාධිකරණය) (ජර්මනිය) අභියාචනාධිකරණය] 18 UF 34/99, Oberlandesgericht Celle (අභියාචනාධිකරණය) (ජර්මනිය), 17 අගෝස්තු 1999.

[3] පෞද්ගලික ජාත්‍යන්තර නීතිය පිළිබඳ හේග් සම්මුතියේ 1 වැනි වගන්තිය, හේග් හිදී සම්මත කර ගන්නා ලද ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ වූ සම්මුතිය, 1980 ඔක්තෝබර් 25, හේග් XXVIII, බලන්න:

https://www.refworld.org/docid/3ae6b3951c.html [ප්‍රවේශය 202 අප්‍රේල් 13]

[4] ජාත්‍යන්තර ළමා ආරක්ෂණය - විනිසුරුවරයන්ගේ පුවත් පත්‍රිකාව, 1 වෙළුම, 1999 වසන්තය පි.7.

*ළමා පැහැරගෙන යාම පනතේ ආරක්ෂාව.*

13. ළමා පැහැරගෙන යාම පනතේ විධිවිධාන සෘජුවම ළමයාගේ හොඳම යහපත ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සම්මුතියේ අන්තර්ගත මූලධර්ම අවශෝෂණය කරයි. [5] ළමා පැහැරගෙන යාම පනතේ 11 වැනි වගන්තියට අනුව වැදගත් ආරක්ෂාවන් තුනක් දක්වා ඇත. මෙයින් යමක් ඉදිරිපත් කරයි නම්, ශ්‍රී ලංකා අධිකරණය විසින් ආපසු යැවීම සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකිය. මෙම තත්ත්වයන් වන්නේ:

(අ) ආපසු යැවීම අපේක්ෂා කරන තැනැත්තාට පැහැර ගැනීමේ ස්ථානයේදී හෝ පැහැර ගැනීමට එකඟ වීමේදී හෝ පසුව එයට එකඟ වූ විට, භාරකාරත්ව අයිතියක් නොමැති නම්; [6]

**(ආ) ඒ ළමයා ආපසු යැවීමෙන් ඒ ළමයා ශාරීරික හෝ මානසික පීඩාවකට භාජනය වීමේ හෝ අන්‍යාකාරයකින් ඉවසිය නොහැකි තත්ත්වයකට පත්වීමේ බරපතල අවධානමක් ඇති නම්;** [7]

(ඇ) **ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යවනු ලැබීමට ඒ ළමයා විරුද්ධ වන්නේ නම් සහ ඒ ළමයාගේ මතය සැලකිල්ලට ගැනීම උචිත වන වයසකට හා පරිනත තත්ත්වයකට ඒ ළමයා පත්ව ඇති බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම්,** [8] **යනාදිය වේ.**

14. ඉහත කරුණු කිසිවක් හෝ තිබේ නම්, පැහැරගෙන ගිය ළමයා ආපසු ලබා දෙන ලෙස අධිකරණය නියෝග **නොකරනු** ඇත. පැහැදිලිව පෙනෙන පරිදි (අ) ළමයකු ශාරීරික හෝ මානසික හානියක් හෝ වෙනත් නොඉවසිය හැකි තත්ත්වයකට පත් නොකිරීම සහ (ආ) ළමයාගේ අභිමතය පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ළමයකු යම් පරිනතභාවයකට පැමිණ ඇති බව සහතික කිරීම සඳහා ඉතා විශේෂිත ළමා ආරක්ෂණ දෙකක් ඇතුළත් වේ.

15. ඉහත ආරක්ෂණවලට අමතරව තවත් වැඩිදුර ආරක්ෂාවක්ද සපයා ඇත. හේග් සම්මුතියේ 12 වන වගන්තිය මගින් අයුතු ලෙස පැහැරගෙන ගිය ළමයකුට ආපසු යැවීමට පහසුකම් සැලසීම සඳහා නඩු කටයුතු ආරම්භ කිරීමට අවසර දෙනු ලබයි. එහි අයුතු ලෙස බැහැරට රැගෙන යාමෙන් **වසරක් ඇතුළත** නඩු කටයුතු ආරම්භ වන අවස්ථා සහ **වසරක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසු** ඉල්ලීම ඉදිරිපත්කරනු ලබන අවස්ථාවන්හිදී, **ළමයා ඔහුගේ හෝ ඇයගේ නව පරිසරයේ ස්ථිරව පදිංචිව සිටින බවට සෑහීමකට පත් වුවහොත්** මිස, අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබීමට අවශ්‍ය නොවනු ඇත. [9]

---

[5] හේග් සම්මුතියේ 13 වැනි වගන්තිය.

[6] ළමා පැහැරගෙන යාම පනතේ 11 (1) (අ) වගන්තිය -
ළමයකු ආපසු යැවීමට විරුද්ධ වන තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින් -
(අ) අවස්ථාවෝචිත පරිදි, එසේ රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීම කරනු ලැබූ කාලයේදී, ළමයාගේ ශාරීරික රැකවරණය ඇතිව සිටින තැනැත්තා, ආයතනය හෝ පුද්ගල මණ්ඩලය විසින් ඒ භාරකාරත්ව අයිතිය ක්‍රියාත්මක

නොකරන බව හෝ අවස්ථාවෝචිත පරිදි එසේ රැගෙන ඒමට හෝ රඳවා තබා ගැනීමට කැමැත්ත දී ඇති බවට හෝ පසුව එකඟ වී ඇති බවට
මහාධිකරණය සෑහීමකට පත් කරනු ලැබුවහොත් ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය පිහිටි රටට ආපසු යැවීම සඳහා, 10 වන වගන්තිය යටතේ වන ආඥාවක් කිරීම මහාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

[7] ළමා පැහැරගෙන යාම පනතේ11 (1) (අ) වගන්තිය.

[8] ළමා පැහැරගෙන යාම පනතේ11 (2) වගන්තිය.

[9]පනතේ 10 වන වගන්තිය -
9 වන වගන්තිය යටතේ  මහාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණය විසින් සෑහීමට පත් වන අවස්ථාවක,
මහාධිකරණය විසින් 11 වන වගන්තියට යටත්ව,

16. ළමා කේන්ද්‍රීය ආරක්ෂාව පහත පරිදි සාරාංශ කළ හැකිය.
(අ) ළමයා ශාරීරික හෝ මානසික පීඩාවකට භාජනය වීමේ බරපතල අවදානමක් ඇති විට ආපසු යැවීම ප්‍රතික්ෂේප කිරීම;

(ආ)ළමයා ප්‍රමාණවත් පරිනත තත්ත්වයකට පත්ව ඇති විට ළමයාගේ මතය සැලකිල්ලට ගැනීම; සහ

(ඇ) ළමයා ශ්‍රී ලංකාවේ ස්ථිරව පදිංචිව සිටින්නේ නම්, ඉල්ලීම කර ඇත්තේ අවුරුදු එකකට පසුව නම්, ළමයා ආපසු යැවීම ප්‍රතික්ෂේප කිරීම.

17. (ළමයා අයුතු ලෙස පැහැරගෙන යාමක් පළමුව සිදුවුවද) ළමයා එම නව පරිසරයේ ස්ථිරව පදිංචිව සිටී නම්, ආපසු යැවීම ළමයාගේ හොඳම යහපත සඳහා හේතු විය නොහැකි නිසාවෙන් ඉහත තුන්වන ව්‍යතිරේකය ඇතුළත් කර ඇත. කෙසේවෙතත්, මෙම සලකා බැලීම සිදුකරනු ලබනුයේ, පැහැරගෙන යාමෙන් අනතුරුව අවුරුදු එකකට පසුව ඉල්ලීම සිදුකර ඇත්නම් පමණි. වසරක් ඇතුළතදී ඉල්ලීම සිදුකර ඇත්නම්, උපකල්පනය කෙරෙනුයේ ළමයාට නව පරිසරයේ ස්ථිරව පදිංචිව සිටිය නොහැක් බවයි.

18. මෙම සියලු ආරක්ෂාවන් ළමයාලේ හොඳම යහපත පිළිබඳ මූලධර්මයේ ප්‍රකාශනයන් ලෙස සැලකිය හැකිය. එබැවින්, පනත ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් ළමයාගේ හොඳම යහපත පිළිබඳ මූලධර්මය යොදා ගැනීම පුදුමයක් නොවේ. [10] ළමයාගේ හොඳම යහපත සලකනු ලබන අභියාචනාධිකරණයේ තීන්දුව වන පුද්ගලික ජාත්‍යන්තර නීතියේ - දකුණු ආසියාතික ජනපදවල ප්‍රායෝගික භාවිතය පැසසුමට ලක් වී ඇත. [11]

**<u>කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පළමු වාර්තාවේ සාරාංශය.</u>**

19. නීති කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවෙන් යෝජනා කිරීමට උත්සාහ කරන්නේ, එවැනි මෙහෙයවීම් ප්‍රමිතියකින් ළමයාගේ හොඳම යහපත සිදු නොවන බැවින් පනතේ 10 සහ 11 වගන්තිවලට අනුව මහාධිකරණයට ඵලදායී නියෝගයක් කළ නොහැකි බවයි.

---

(අ) ඉල්ලීම කරනු ලැබ ඇත්තේ යම් ළමයකු සම්බන්ධයෙන්ද, ඒළමයා 3 වන වගන්තියේ අර්ථානුකූලව, අවස්ථාවෝචිත පරිදි, අයුතු ලෙස, ශ්‍රී ලංකාවට රැගෙන ආ බව හෝ ශ්‍රී ලංකාව තුළ රඳවා තබා ගන්නා ලද බව; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, රැගෙන ඒම හෝ රඳවා  තබා ගැනීම කරන ලදැයි කියනු ලබන දිනය සහ ඒ ඉල්ලීමේ දිනය අතර අවුරුදු එකකට අඩු කාල සීමාවක් ඉකුත් වී ඇති බව,

සම්බන්ධයෙන් මහාධිකරණය සෑහීමකට පත්වන අවස්ථාවක, ඒ ළමයාගේ සුපුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටට ඔහු හෝ ඇය ආපසු යැවීම සඳහා ආඥාවක් වහාම කරනු ලැබිය හැකිය:

එසේවුවද, ළමයකු ඔහුගේ හෝ ඇයගේ නව පරිසරයේ ස්ථිරව පදිංචිව සිටින බවට සෑහීමකට පත් වුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීම කරන ලදැයි කියනු ලබන දිනය සහ ඉල්ලීම කරන ලද දිනය අතර අවුරුදු එකකට වඩා වැඩි කාලයක් ඉකුත් වී තිබුනද, මහාධිකරණය විසින්, ඒ ළමයා ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යැවීමේ ආඥාවක් කරනු ලැබිය  හැකිය.

[10] බලන්න, Suhada Gamlath  එදිරිව Kristina Ivanauskaite-Rosario සහ Prageeth Rosario, CA/Revision/(PHC) APN /3/2010, 2011 ජුනි 1 වන දින තීන්දු කර, අනිල් ගුණරත්න ජේ. ගේ විනිශ්චයට සමගාමීව 6 වන පිටුවේ, http://courtofappeal.lk/index.php?option=com_phocadownload&view=category&download=375:ca-phc-apn-32010-suhada-samalath-vs-kristina-ivasauskaite-rosairo&id=12:june&Itemid= 116  මගින් ලබාගත හැකියි.

[11] බලන්න, Rose Wijesekera, අන්තර් රට තුළ වන ළමා පැහැර ගැනීම - පුද්ගලික ජාත්‍යන්තර නීතියේ - දකුණු ආසියාතික ජනපදවල ප්‍රායෝගික භාවිතයට ශ්‍රී ලංකා නෛතික ප්‍රතිචාරය, සංස්. Garimella, Sai Ramency සහ Jolly, Stellina,2017,243 හි 259-61.

20. 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 5 (2) වගන්තියට අනුකූලව ළමුන් සම්බන්ධ සියලු කාරණාවලදී ශ්‍රී ලංකාව අදාළ විය යුතු බවට නීත්‍යානුකූල බැඳීමක් ඇති බවට වාර්තාව ප්‍රකාශ කරයි. 2001 අංක 10 දරන පනත, ළමයාගේ සුපුරුදු වාසස්ථානය සම්බන්ධයෙන් විශේෂත්වයක්  ඇති බව වාර්තාවේ වැඩි දුරටත් සඳහන් වේ. ළමයාගේ හොඳම යහපත සඳහා වන ආරවුල තීරණය කිරීමේදී යෙදිය යුතු ප්‍රමිතීන් ලබාදීමෙන් පවතින අපැහැදිලිතා මගහරවා ගැනීම සඳහා ව්‍යවස්ථාදායක මැදිහත්වීමක් අවශ්‍ය වේ.

**<u>පළමු වාර්තාව නැවත සලකා බැලීම සඳහා තාර්කිකත්වය.</u>**

21. පළමු වාර්තාවේ නිර්දේශ නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාවට හේතු කිහිපයක් තිබේ. ඒවා නම්:
(අ) අයි. සී.සී.පී.ආර්. පනත සහ ළමාපැහැරගෙන යාම පනත අතර නොගැලපීමක් නැත.
(ආ) ඕනෑම අවස්ථාවකදී, ළමයාගේ හොඳම යහපත පිළිබඳ මූලධර්මය, සුදුසු පරිදි, ළමා පැහැරගෙන යාම පනතට ඇතුළත් කර ඇත.
(ඇ) යෝජිත නිර්දේශ ළමා පැහැරගෙන යාම පනත නිෂේධනීය කරයි.
(ඈ) පළමු වාර්තාවේ නිර්දෙශ ක්‍රියාත්මක කළහොත්, ශ්‍රී ලංකාව සිය ජාත්‍යන්තර බැඳීම කඩකරනු ඇත.

**ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම සම්බන්ධයෙන් වන හේග් සම්මුතිය අතර නොගැලපීමක් නැත.**

22. මෙම වාර්තාවේ ආරම්භයේ පැහැදිලි කර ඇති පරිදි, පනත යටතේ අධිකරණයේ කාර්යය වන්නේ ළමයා අයුතු ලෙස පැහැරගෙන ගිය ලද අධිකරණ බල ප්‍රදේශයට ළමයා ආපසු යැවීම මිස භාරකාරත්වයේ අයිතිවාසිකම් පිළිබඳ තීරණ ගැනීම නොවේ.

23. පළමු වාර්තාවේ ව්‍යාකූලත්වයට හේතුවනුයේ, පනත යටතේ සහ භාරකාර නඩු විභාගයකදී අධිකරණයේ ක්‍රියා පටිපාටීන් එකිනෙක ගැටීමයි. මෙයට හේතුව බොහෝවිට ළමයින් පැහැරගෙන යනු ලබන බොහෝ දෙමාපියන් විසින් පනත යටතේ ඇති නඩු විභාගය, භාරකාර නඩු විභාගයක් බවට පරිවර්තනය කිරීමට උත්සාහ කිරීම වේ. අදාළ පනත් යටතේ අධිකරණවල

ක්‍රියාපටිපාටීන් අවබෝධ කර ගතහොත් ළමා පැහැරගෙන යාම පනත සහ අයි. සී.සී.පී.ආර්. පනත (හෝ හේග් සම්මුතිය සහ ළමා අයිතිවාසිකම් සම්මුතිය අතර) ගැටුමක් නොමැති බව පැහැදිලිව දක්නට ඇත.

24. ළමයකු ආපසු ලබා දීමේ ආඥාවකින් අදහස් වන්නේ, ළමයා තම සුපුරුදු වාසස්ථානයේ ජීවත් වන බව නොවන අතරම ආපසු පැමිණි පසු ළමයා අවසානයේදී පැහැරගත් දෙමාපියන්ගේ භාරයේ සිටීමද අවශ්‍ය නොවේ. එසේම, ආපසු පැමිණීම, භාරකාර ප්‍රශ්නයේ අවසාන විසඳුම බලාපොරොත්තුවෙන් සිටින දෙමාපියන් වෙත ළමයාගේ භාරකාරත්වය යොමු නොවේ. එය හුදෙක්ම, සුපුරුදු වාසස්ථානය වෙත සහ එම අධිකරණය වෙත ළමයා ඉදිරිපත්කරනු ලබයි. [12]

25. පනත යටතේ සිදුවන සියලුම කටයුතු අධිකරණ සහයෝගීතාවයේ වැයමක් ක්‍රියාත්මක කිරීමක් වන බැවින් ගැටුම් පිළිබඳ ප්‍රශ්න පැන නොනැගේ.

[12] B.D.Inglis, 21 වන සියවසේ නවසීලන්ත පවුල් නීතිය, 544 (2007).

26. හේග් සම්මුතිය යටතේ නිර්මාණය කරන ලද යාන්ත්‍රණය පූර්ණ පරිමාණයේ අධිකරණ ක්‍රියාවලියක් නොවන අතර ළමයා සම්බන්ධයෙන් වන භාරකාරත්වයේ අවසාන තීරණය සඳහා සුපුරුදු වාසස්ථානයේ අධිකරණයට ළමයාගේ හොඳම යහපත සඳහා කටයුතු කිරීමට හැකි වන තෙක් "ගින්න නිවා දැමීම" අරමුණින් සිදු කරනු ලබන මූලික අධිකරණ ප්‍රතිචාරයකි. [13]

27. ඉහත දෘෂ්ඨිකෝණයෙන් බලන විට, ළමා පැහැරගෙන යාම පනත යටතේ අධිකරණයේ කාර්යභාර්යය වෙනස් බැවින්, ගැටුමක් සඳහා අවකාශ නොමැත. පළමු අවධියේදී, තීරණය කළ යුතු එකම කාරණය වන්නේ, ළමයාගේ අනාගතය තවදුරටත් විනිශ්චය කළ යුත්තේ කුමන අධිකරණය විසින්ද යන්නයි. ළමයාගේ හොඳම යහපත ඉටුවිය යුත්තේආපසු පැමිණීමේ ක්‍රියාවම ළසයාගේ අවශ්‍යතා උල්ලංඝනය කළ විට පමණි. [14]

**28. පනත යටතේ තීරණය කළ යුතු එකම කරුණ වන්නේ, ළමයාගේ භාරකාරත්වය පිළිබඳ කරුණු විනිශ්චය කිරීම සඳහා ළමයාගේ සුපුරුදු වාසස්ථානයට නැවත ළමයා ගෙන යා යුතුද යන්නයි.** එම තීරණයද ගනුලබන්නේ ළමයාගේ හොඳම යහපත සුරක්ෂිත වන බවට සහතිකකොට ප්‍රමාණවත් ආරක්ෂාවක්ද සහිතවය.

29. මේ අනුව, අයුතු ලෙස පැහැරගත් ළමයකුට පැහැරගත් දෙමාපියන්ගෙන් හෝ දැනට සිටිනා දෙමාපියන්ගෙන් කවරකු වඩා හොඳදැයි තීරණය කිරීමට අධිකරණයක් අවශ්‍ය නැත. නමුත්, එම තීරණය සහතික කිරීමට අධිකරණය සුදුසුම තැන වේ.

*30.* ඇමරිකා එක්සත් ජනපදයේ 5 වන ඒකකය සඳහා වන අභියාචනාධිකරණය විසින් Sealed Appellant එරෙහිව Sealed Appellee හිදී [15] දෙමාපියන්ට නීත්‍යානුකූලව භාරකාරත්ව අයිතිවාසිකම් ලබාදී නොමැති කාරණාවකදී, ළමයාව අයුතු ලෙස බැහැරට රැගෙන ගොස් තිබේද යන්න සම්බන්ධයෙන් පහත පරිදි නිරීක්ෂණය කරන ලදී; *මෙ සඳහා සම්මුතියෙන් නියම කරනුයේ: ළමයකු අයුතු ලෙස ඔහුගේ සුපුරුදු වාසස්ථානය පිහිටි රටෙන් බැහැරට ගෙනගොස් ඇති විටදී "ළමයා සිටින කොන්ත්‍රාත් රාජ්‍යයේ අධිකරණය හෝ පරිපාලන අධිකාරිය ...වහාම ළමයා ආපසු ලබාදෙන ලෙස නියෝග කරයි" සම්මුතියේ 12 වන ව්‍යවස්ථාව (අවධාරණය එකතු කර ඇත). තවද, ළමයාගේ සුපුරුදු වාසස්ථානය පිහිටි රට හැර වෙනත් රටවල අධිකරණවලට අයත් භාරකාර අවුලේ කුසලතාව මත නිශ්චය කිරීම තහනම් කරනු ලබයි". Nunez-Escudero එදිරිව Tice-Menley, 58 F.3d 374, 376 (8 වන ඒකකය. 1995) ; තවද 42 U.S.C. § 11601 (ආ)*

*(4) බලන්න; සම්මුතියේ 19 වන ව්‍යවස්ථාව. දිස්ත්‍රික් අධිකරණය මගින් මේ බව නිසි පරිදි පිළිගෙන, "ළමයින්ට අදාළ සියලුම භාරකාර කරුණු ඔස්ට්‍රේලියානු අධිකරණවල සුවිශේෂී අධිකරණ බලයට යටත් වන අතර ඒවා එහිදි තීරණය කළ යුතු බවට ප්‍රකාශ කළේය".*

***පාර්ශ්වයක් භාරකාර අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන්නේද යන්න තීරණය කිරීම එම අයිතිවාසිකම්වල ස්වභාවය සහ තරම තීරණය කිරීමට සමීපව සමාන වේ. සම්මුතිය යටතේ "ක්‍රියාත්මක කිරීම" තීරණය කිරීමේදී අධිකරණය විසින් භාරකාර ආරවුල පිළිබඳව සලකා බැලීම ඉක්මවා යාමක් නොකල යුතුය.***

[13] CA 7206/93 Gabai එදිරිව Gabai 51(2) PD 241,251 [1997] (ඊශ්‍රායලය).

[14] Eran Sthoeger, ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම සහ ළමා අයිතිවාසිකම්: එකම අවසානයට ක්‍රම දෙකක්, 32 MICH.J. ජාත්‍යන්තර නීතිය 511,534 (2011) .

[15] Sealed Appellant එදිරිව Sealed Appellee , 394 F.3d 338, 344 (5 වන ඒකකය.2004).

31. ***Abbott එදිරිව Abbott හිදී,*** *[16]* එක්සත් ජනපද අභියාචනාධිකරණය නිගමනය කරනු ලැබුවේ, සම්මුතියේ කේන්ද්‍රීය ක්‍රියාකාරී ලක්ෂණය වන්නේ ආපසු යැවීමේ පිළියම බවය. වයස අවුරුදු 16ට අඩු ළමයකු අයුතු ලෙස බැහැරට රැගෙන යන ලද හෝ රඳවා තබන ලද විටෙක යම් යම් ව්‍යතිරේක අදාළ වන්නේ නම් මිස, ළමයා ගෙන ආ රටට "ළමයා ආපසු යැවීමට වහාම නියෝගයක් කළ යුතුය". ***ආපසු පැමිණීමේ පිළියමක් මගින් පැහැරගැනීමට පෙර වූ භාරකාර අයිතිවාසිකම් වෙනස් නොකරන නමුත් පුරුද්දක් ලෙස භාරකාර තීරණ සඳහා ස්ථිර වාසස්ථානය පිහිටි රටේ අධිකරණයට භාර දෙනු ලබයි. 19 වන ව්‍යවස්ථාව,11.***

32. ළමයාගේ හොඳම යහපත සඳහා ඉල්ලීම් කිරීම, ළමයා ආපසු ලබා දීමේ "අතුරු" තීරණයේ සන්දර්භය තුළ පමණී. මෙම සන්දර්භය තුළ, ළමයාගේ හොඳම යහපත සුරක්ෂිත කිරීම සඳහා ළමා පැහැරගෙන යාම පනත තුළප්‍රමාණවත් ආරක්ෂාවක් ලබාදී ඇත.

***ඕනෑම අවස්ථාවක, ළමා පැහැරගෙන යාම පනතට අදාළ වන පරිදි ළමයාගේ හොඳම යහපත පිළිබඳ මූලධර්මය ඇතුළත් වේ.***

33. හේග් සම්මුතිය සහ අයි. සී.සී.පී.ආර්. පනත යන දෙකම විවිධ ආකාරවලින් ළමයාගේ හොඳම යහපත තහවුරු කරනු ලබයි. පෙර පැහැදිලි කර පරිදි, ළමා පැහැරගෙන යාම පනත (හේග් සම්මුතියට අනුකූලව) බහුවිධ හා ඵලදායී ආකාරවලින් ළමයාගේ හොඳම යහපත සැලකිල්ලට ගනු ඇත. කෙසේවෙතත්, ළමයාගේ හොඳම යහපත පිළිබඳ මූලධර්මය විවිධ ආකාරවලින් අදාළ වීම, පනත් දෙකේ හෝ සම්මුතීන් දෙකේ ගැටුම් ඇති කරන බව අදහස් නොවේ.

34. වාර්තාකරුවකු වන Elisa Pérez-Vera හේග් සම්මුතියේ පැහැදිලි කිරීමේ වාර්තාවේ මෙසේ සඳහන් කරයි; *එබැවින් සම්මුතියේ අරමුණු දෙකින් - එකක් වැළැක්වීමක් වන අතර අනෙක ළමයාගේ සුපුරුදු වාසස්ථානයට නැවත ක්ෂණික ඒකාබද්ධ කිරීම සුරක්ෂිත කිරීම සඳහා නිර්මාණය කර ඇති බව ප්‍රකාශ කිරීම නීත්‍යානුකූල වේ. මේ ආකාර දෙකම ළමයාගේ හොඳම යහපත සඳහා වන නිශ්චිත අදහසකට අනුරූප වේ. කෙසේවෙතත්, මෙම දෘෂ්ටිකෝණයෙන් බලන විට පවා, ළමයා ඉවත් කිරීම සමහරවිට ළමයා එම පුද්ගලයා සමග හෝ ළමයා වඩාත් සමීපව සම්බන්ධ වී ඇති පරිසරය සමග සම්බන්ධ වන වෛෂික හේතූන් මත සාධාරණීකරණය කළ හැකි බව පිළිගත යුතුය. එබැවින් නීති විරෝධී ලෙස රැගෙන යන ලද හෝ රඳවා ගෙන සිටින*

*ළමුන් ඉක්මනින්ම ආපසු ලබා දීම සඳහා රාජ්‍යන් විසින් උපකල්පනය කරන ලද පොදු වගකීම් සඳහා යම් යම් ව්‍යතිරේකයන්ගේ අවශ්‍යතාවය පිළිගනු ලබයි.* [17]

35. ළමයාගේ හොඳම යහපත සඳහා වන අවශ්‍යතා තීරණය කිරීම සඳහා වඩාත් සුදුසු අධිකරණ බල ප්‍රදේශයට ළමයා ආපසු යැවීම පිළිබඳව වන මෙම අධිකරණමය සහයෝගී ක්‍රියාවම ළමයකුගේ හොඳම යහපත පිළිබඳ මූලධර්මයේ ප්‍රකාශනයකි. **ළමයා පුරුද්දක් ලෙස පදිංචිව සිටින අධිකරණ බල ප්‍රදේශයේ අධිකරණය මගින් ළමයාගේ භාරකාර අයිතිවාසිකම් පිළිබඳ තීරණය කිරීම ළමයාගේ යහපතට හේතු වේ.** භාරකාර අයිතිවාසිකම් තීරණය කිරීම සඳහා ළමයා පුරුද්දක් ලෙස පදිංචිව සිටින අධිකරණ බල ප්‍රදේශය **නොවන අධිකරණ බල** ප්‍රදේශයක අධිකරණයක් වඩා හොඳ යැයි බරපතල ලෙස තර්ක කිරීම කළ නොහැක.

---

[16] Abbott එදිරිව Abbott, 130 වගන්තිය, ct. 1983ල 1989 (2010).

[17] Elisa Pérez-Vera විසින් රචිත පුද්ගලික ජාත්‍යන්තර නීතිය පිළිබඳ හේග් සමුළුවේදී 1980 හේග් ළමා පැහැරගෙන යාමේ සම්මුතිය පිළිබඳ පැහැදිලි කිරීමේ වාර්තාව (14 වන සැසිවාරයේ පනත් හා ලේඛන සාකච්ඡා කිරීම, වෙළුම IHI , 1980) , ¶ 25.
[https:assets.hcch.net/docs/a5fb103c-2ceb-4d17-87e3-a7528a0d368c.pdf]

36. පැහැදිලි කිරීමේ වාර්තාව ජාතීන් අතර අධිකරණ සහයෝගීතාවයේ වැදගත්කම ඉස්මතුකර දක්වයි:
*ඇත්තෙන්ම, සම්මුතිය සම්මතයක් ලෙස මෙම නීති විරෝධී ළමා ඉවත් කිරීම් සංසිද්ධිය ඒකමතිකව ප්‍රතික්ෂේප කිරීම සහ ජාත්‍යන්තර මට්ටමින් ඔවුන්ට එරෙහිව සටන් කිරීමට හොඳම ක්‍රමය ඔවුන්ට නීතිමය පිළිගැනීමක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම බව ඒත්තු ගැන්වීම මත රඳා පවතී.* ***මෙම මූ!ලධර්මයේ ප්‍රායෝගික භාවිතය සඳහා අත්සන කරන ලද රාජ්‍යයන් ඔවුන්ගේ වෙනස්කම් නොතකා, ඔවුන් අයත් වන්නේ එකම නීති ප්‍රජාවට ඒත්තු ගැන්වීමට අවශ්‍ය වන අතර, එක් එක් ප්‍රාන්තයේ බලධාරීන් ඔවුන්ගෙන් එක් අයකුගේ බලධාරීන්ගේ භාරකාරත්වය සහ ප්‍රවේශය පිළිබඳ ප්‍රශ්න තීරණය කිරීම ප්‍රතිපත්තිමය වශයෙන් වඩාත් සුදුසු බව පිළිගනී.*** *එහි ප්‍රතිඵලයක් වශයෙන්, පැහැරගත් තැනැත්තා විසින් ළමයාගේ වාසස්ථානය සඳහා තෝරා ගන්නා ලද සංසදය ආදේශ කරමින්, ඉහතකී ව්‍යතිරේක ක්‍රමානුකූලව ආයාචනා කිරීම, සම්මුතියේ ආශ්වාදය වන අන්‍යෝන්‍ය විශ්වාසය අහිමි කිරීමෙන් සම්මුතියේ සමස්ථ ව්‍යුහයම බිඳ වැටීමට තුඩු දෙනු ඇත".*

**යෝජනා කරන ලද සංශෝධන මගින් ළමා පැහැරගෙන යාම දිරිමත් කරනු ඇත.**

37. ***<u>Abbott එදිරිව Abbott හිදී</u>***, එක්සත් ජනපද අධිකරණය නිරීක්ෂණය කළේ,
*පැහැරගෙන යන දෙමව්පියෙකුට ආපසු පැමිණීමේ පිළියමක් වළකා ගැනීම සඳහා සම්මුතිය අර්ථකථනය කිරීම, අනෙක් දෙමාපියන්ට ne exeat අයිතියක් ඇතත්, ආරවුල් තීරණය කිරීම සඳහා මිත්‍රශීලී සංසදයක් සොයා ගැනීමට උත්සාහ කරන දෙමාපියන් විසින් ළමා පැහැර ගැනීම් වැළැක්වීමේ සම්මුතියේ අරමුණට පටහැනි වනු ඇත.* [18]

38. ළමයාගේ භාරකාරත්වය සම්බන්ධ ගිවිසුම්වල විධිවිධාන වෙනම තබා නොගන්නේ නම්, forum shopping හැකියාවද අධිකරණය විසින් අවධාරණය කරන ලදී.
*Ne exeat අයිතිය උල්ලංඝනය කරමින් ළමයා වෙනත් රටකට ගෙන ඒමෙන් මෙම ප්‍රශ්න විනිශ්චය කරන්නේ කුමන රටද යන්න තෝරා ගැනීමට දෙමාපියන්ට අවසර දීමට සම්මුතිය*

*අර්ථකථනය නොකළ යුතුය. එවැනි අයිතීන් උල්ලංඝනය කිරීම සඳහා ආපසු ප්‍රතිකර්මයක් ප්‍රතික්ෂේප කිරීම "ළමයා ඉවත් කිරීම නීත්‍යානුකූල කරයි - මව් රට, එහි භාරකාර නියෝගය (හෝ වෙනත් නීතියේ විධිවිධාන) හරහා වැළැක්වීමට උත්සාහ කරයි" සහ "දෙමාපියන්ට සම්මුතියේ අරමුණු වළකාලීමට ඉඩ සලසයි".*

39. පළමු වාර්තාවේ නිර්දේශ කර ඇති ප්‍රවේශය සම්මුතිය සහ ළමා පැහැරගෙන යාම පනත පදනම් වී ඇති මූලික පදනමට පිළිකුලක් නොවන අතර එය අලුත් භාරකාර නඩු විභාගයකට හේතු වනු ඇත. පැහැර ගැනීම අධෛර්යමත් කරනවා වෙනුවට, පැහැරගෙන යන දෙමව්පියන්ට තමන්ට වාසියක් ඇතැයි හැගෙන ස්ථානවලට ළමයින් ඔවුන්ගේ සුපුරුදු වාසස්ථානවලින් ඉවත්කිරීමට දෙමාපියන් දිරිමත් කරනු ඇත. මෙය හුදෙක් අනුමත කළ හැකි ප්‍රවේශයක් නොවේ.

---

[18] ඉහත 17 බලන්න.

40. බොහෝ රටවල් එවැනි පැහැරගැනීම් අපරාධයක් ලෙස සලකන බව මතක තබා ගැනීම විශේෂයෙන්ම භයානක වනු ඇත. නිදසුනක් ලෙස, එක්සත් ජනපදයේ, 1993 ජාත්‍යන්තර මාපිය පැහැරගැනීමේ අපරාධ පනත මගින් ළමයකු එක්සත් ජනපදයෙන් ඉවත් කිරීම හෝ මාපියන්ගෙන් භාරකාර අයිතිවාසිකම්වලට බාධා කිරීමේ චේතනාවෙන් එක්සත් ජනපදයෙන් පිටත ළමයකු රඳවා තබා ගැනීම හෝ එසේ කිරීමට උත්සාහ කිරීම ෆෙඩරල් අපරාධයකි. [19] මෙය වසර තුනක් දක්වා සිර දඬුවම් ලැබිය හැකි වරදකි. ඕස්ට්‍රේලියාව [20] , කැනඩාව [21] , එක්සත් රාජධානිය [22] ,ස්කොට්ලන්තය [23] , උතුරු අයර්ලන්තය [24] වැනි තවත් බොහෝ රටවල සමාන විධිවිධාන දක්නට ලැබේ.

***ශ්‍රී ලංකාව සිය ජාත්‍යන්තර බැඳීම් කඩ කරනු ඇත.***

41. ඉහත කී හේතූන් මත එවැනි සංශෝධනයක් ඉදිරියට ගෙන ගිය හොත් ශ්‍රී ලංකාව සිය ජාත්‍යන්තර බැඳීම් කඩ කරන බව පැහැදිලිව පෙනේ.

42. ශ්‍රී ලංකාව සිය ජාත්‍යන්තර බැඳීම් කඩ කරයා නම්, වෙනත් රාජ්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ සහය ඉල්ලීම් නොසලකනු ඇත. මෙය විශේෂයෙන්ම ශ්‍රී ලාංකික දෙමාපියන්ට දුෂ්කර වනුයේ ඔවුන්ට එම ප්‍රාන්තයේ මධ්‍යම අධිකාරියේ සහය නොමැතිව විදේශීය අධිකරණ බල ප්‍රදේශයක භාරකාරත්වය සහ ඔවුන්ගේ දරුවන්ට ප්‍රවේශය නැවත ලබා දීම සඳහා සටනක් කිරීමට සිදුවන නිසාවෙනි. ශ්‍රී ලාංකිකයන්ට නම් මෙය ඊටත් වඩා මිල අධික හා කාලය නිකරුනේ ගතවෙන කරුණකි.

43. එබැවින්, යෝජිත සංශෝධනයන් ශ්‍රී ලාංකිකයන්ට ප්‍රතිඵලදායක වනු ඇත.

---

[19] එක්සත්ජනපද විධිවිධාන සංග්‍රහය (U.S.C.), 18 මාතෘකාව : අපරාධ සහ අපරාධ නඩු විධානය, 1204 වගන්තිය: ජාත්‍යන්තර මාපිය පැහැර ගැනීම.

[20] *2018 සිවිල් නීතිය සහ යුක්තිය පිළිබඳ නීති සංශෝධන පනත* 2018 ඔක්තෝබර් 25 වන දින රාජකීය අනුමැතිය ලැබුනු අතර *පවුල් නීති පනත* යටතේ වැරදි මාලාවක් ස්ථාපිත කර ඇත. ඕස්ට්‍රේලියාවේ සිට ජාත්‍යන්තර මාපියන් විසින් ළමයින් පැහැරගෙන යාමේ වරදට දැන් වසර 3ක සිර දඬුවමක් හිමිවනු ඇත.

[21] *අපරාධ නීති සංග්‍රහයේ 282 වගන්තිය* මගින් කැනේඩියානු අධිකරණයක් මගින් කරන ලද භාරකාර නියෝගයක් ඇති අවස්ථාවකදී දෙමාපියන් විසින් ළමයින් පැහැර ගැනීම තහනම් කරයි. 283 වගන්තිය අදාළවනුයේ, කැනේඩියානු

භාරකාර නියෝගයක් නොමැති අවස්ථාවක හෝ නීතිය ක්‍රියාත්මක කිරීමෙන් දෙමාපියන් තම ළමයාගේ ඒකාබද්ධ භාරකාරත්වය දිගටම පවත්වාගෙන යන විට, ලිඛිත ගිවිසුමක් ඇති විට, විදේශීය භාරකාර නියෝගයක් ඇති විට, හෝ පැහැරගත් මාපියන් විශ්වාස නොකළ වලංගු හෝ භාරකාර නියෝගයක් ඇති බව දැන නොසිටි අවස්ථාවලට වේ. මෙම වැරදි අදාළ වනුයේ වයස අවුරුදු 14ට අඩු ළමුන්ටය.

[22] 1984 ළමා පැහැරගෙන යාම පනතට අනුව, එංගලන්තයේ සහ වේල්සයේ ළමයකු හා සම්බන්ධ ඕනෑම පුද්ගලයකු ළමයා සම්බන්ධයෙන් දෙමාපියන්ගේ වගකීම් දරන වෙනත් කිසිවකුගේ අනුමැතියකින් තොරව ළමයා එක්සත් රාජධානියෙන් පිටතට ගැනීම හෝ යැවීම සාපරාධී වරදකි.

[23] 1984 ළමා පැහැරගෙන යාම පනත (ස්කොට්ලන්තය).

[24] 1985 ළමා පැහැරගෙන යාම පනත (උතුරු අයර්ලන්තය).

**<u>යෝජිත සංශෝධන.</u>**

44. ආරම්භයේදී ප්‍රකාශ කළ පරිදි, ළමාපැහැරගෙන යාම් සම්බන්ධයෙන් දීර්ඝකලීනව නඩු පැවරීම පැහැදිලිවම ළමයාගේ හොඳම යහපතට හේතු නොවේ. යම් යම් තත්ත්වයන් යටතේ, නඩු සඳහා ගතවන කාලය අවම කිරීම මත පදනම්වූ පහත සඳහන් සංශෝධන සඳහා බරපතල විරෝධයන් තිබිය නොහැක.

***ශ්‍රේෂ්ඨාධිකරණය වෙත සෘජු අභියාචනයක් ඉදිරිපත් කිරීම*** *සඳහා 23අ වගන්තිය ඇතුළත් කිරීම.*

45. මෙම ස්වභාවයේ කරුණක් සඳහා අභියාචනා ස්ථර කිහිපයක් අවශ්‍ය නොවේ. අදාළ ළමයාගේ අවශ්‍යතා සහ ළමා පැහැරගෙන යාම පනතේ පටු සීමාවන් සැලකිල්ලට ගෙන, අවසන් තීරණයට කඩිනමින් එළඹීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත සෘජු අභියාචනයක් ඉදිරිපත් කිරීමට යෝජනා කෙරේ. ඒ අනුව, ළමා පැහැරගෙන යාම පනතේ 23අ වගන්තිය ලෙස පහත පාඨය යෝජනා කෙරේ.

*(1) මහාධිකරණය විසින් ප්‍රකාශ කරන ලද ඕනෑම තැනැත්තකු, සත්‍යය හෝ නීතියේ යම් දෝශයක් සඳහා එවැනි තීන්දුවකට එරෙහිව* ***ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට කැමති විය හැකිය.***

*(2) ඉහත (1) උපවගන්තියේ සපයා ඇති පරිදි හැර, මෙම පනත යටතේ මහාධිකරණය විසින් කරන ලද කිසිදු නියෝගයකට හෝ තීන්දුවකට එරෙහිව කිසිදු අභියාචනයක් හෝ සංශෝධනයක් ඉදිරිපත් නොකළ යුතුය.*

***වාචික සාක්ෂිය සුවිශේෂී අවස්ථාවන්ට සීමා විය යුතුය.***

46. නඩු විභාගය ප්‍රමාද වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ගතවන දීර්ඝ කාලයයි. මෙවැනි කරුණක් සඳහා හරස් ප්‍රශ්න ඇසීමට අවසර දිය යුත්තේ සුවිශේෂී අවස්ථාවන්හිදි පමණි. යම් තත්ත්වයන් යටතේ, ළමා පැහැරගෙන යාම පනතේ 15 වන වගන්තියට පහත සංශෝධනය යෝජනා කෙරේ:

***(3) හරස් ප්‍රශ්න විභාගයක් අවශ්‍ය වන සුවිශේෂී අවස්ථා පවතින බවට මහාධිකරණයේ මතය නම් මිස, සියලු සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ යුතුය.***

*(4) (3) වන උපවගන්තිය යටතේ හරස් ප්‍රශ්න ඇසීම අවශ්‍ය බව මහාධිකරණයේ අදහස වන්නේ නම්, එවැනි නඩු එදිනෙදා සිදු කළ නොහැකි බව මහාධිකරණයේ අදහස වන්නේ නම් මිස, එවැනි නඩු කටයුතු එදිනෙදා සිදු කළ යුතුය.*

*(5) (3) සහ (4) යන උපවගන්ති යටතේ වන තීරණ සඳහා හේතු මහාධිකරණය විසින් ලිඛිතව සටහන් කළ යුතුය.*

*(6) (3) වන උපවගන්තිය යටතේ මහාධිකරණය විසින් අවශ්‍ය යැයි සලකනු ලැබුවහොත් අදාළ ළමයාගෙන් වාචික සාක්ෂි ලබා ගැනීමෙන් මහාධිකරණයට බාධාවක් නොවනු ඇත.*

නිර්මලන් විග්නේශ්වරන්

2020 අගෝස්තු 31.

**2001 අංක 11 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය.**

2001 අංක 10 පනතේ 11 (1) වගන්තිය මගින් පහත සඳහන් අවස්ථාවලදී, එනම්,

*(අ) අවස්ථාවෝචිත පරිදි එසේ රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීම කරනු ලැබූ කාලයේදී, ළමයාගේ ශාරීරික රැකවරණය ඇතිව සිටින තැනැත්තා, ආයතනය හෝ පුද්ගල මණ්ඩලය විසින් ඒ භාරකාරත්ව අයිතිය ක්‍රියාත්මක නොකරන බව හෝ අවස්ථාවෝචිත පරිදි එසේ රැගෙන ඒමට හෝ රඳවා තබා ගැනීමට කැමැත්ත දී ඇති බවට හෝ පසුව එකඟ වී ඇති බවට ; නැතහොත්*

*(ආ) ඒ ළමයා ආපසු යැවීමෙන් ඒ ළමයා ශාරීරික හෝ මානසික පීඩාවකට භාජනය වීමේ හෝ අන්‍යාකාරයකින් ඉවසිය නොහැකි තත්ත්වයකට පත්වීමේ බරපතල අවදානමක් ඇති බවට,*

අධිකරණය සෑහීමකට පත් කරනු ලැබුවහොත්, ළමයෙකු ඔහුගේ/ ඇයගේ සුපුරුදු වාසස්ථානය පිහිටි රටට ආපසු යැවීම සඳහා ප්‍රතික්ෂේප කිරීමේ අභිමතය අධිකරණයට සපයනු ලබයි.

**ළමයාගේ හොඳම යහපත සහ හේග් සම්මුතිය.**

දැඩි ලෙස සම්මුතිය පිළිපදිනු ලබන්නන් අවධාරණය කර සිටිනුයේ, සම්මුතිය කෙටුම්පත් කරනු ලබන අවස්ථාවේදී රාජ්‍යයන් අතර ඇති කර ගත් සම්මුතිය ළමයාගේ උපරිම ශුභ සිද්ධිය පිළිබිඹු කරන බවයි. මන්දයත් සියලුම ළමයින්ට අධිකරණ තීන්දුවක් නොමැතිව ඔවුන්ගේ සුපුරුදු වාසස්ථානයෙන් බැහැරට රැගෙන නොයෑමේ අයිතිවාසිකමක් ඇති අතර එවැනි බැහැරට රැගෙන යාමක් ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ උපරිම ශුභ සිද්ධිය තීරණය කරන ලද අධිකරණ බලයක්ද යන්න දැනගැනීමටත් අයිතිවාසිකමක් ඇත. වැළැක්වීමේ අවශ්‍යතාවයක් සහ පුළුල් නඩු විභාගයකින් තොරව ළමයාගේ ආපසු පැමිණීමේ සාරාංශයක් මගින් ළමයාගේ උපරිම ශුභ සිද්ධිය හොඳින්ම අත්පත් කර ගත හැකි බව ඔවුන් උපුටා දක්වයි. ළමයාගේ උපරිම ශුභ සිද්ධිය වෙනුවෙන් ආඥාවක් කිරීම සඳහා සුපුරුදු වාසස්ථානය සහිත අධිකරණ බලය යෝග්‍ය ලෙස ස්ථානගත වන බවටද ඔවුන් තර්ක කරති.

මේ කෙසේවෙතත්, ළමයා ආපසු නොයැවීමට හේතුවක් ලෙස ළමයාගේ උපරිම ශුභ සිද්ධිය සඳහා නිශ්චිත සඳහනක් නොමැති වීම සම්බන්ධයෙන් බරපතල ගැටළු තිබේ. අධිකරණයේදී හෝ වෙනත් ආකාරයකින් හෝ, ළමයින් සම්බන්ධ සියලු ක්‍රියාවලදී ළමයාගේ උපරිම ශුභ සිද්ධිය මූලිකවම සලකා බැලිය යුතු බව සහතික කිරීමට ශ්‍රී ලංකාව නීත්‍යානුකූලව බැඳී සිටින ජාත්‍යන්තර බැඳීමක් යටතේ සිටින බැවින් මෙය විශේෂයෙන්ම සිදු වේ.

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 3 (1) වගන්තියේ මෙසේ සඳහන් වේ: " *රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ හෝ සමාජ සුභසාධන ආයතන, අධිකරණ, පරිපාලන බලධාරීන් හෝ ව්‍යවස්ථාදායක මණ්ඩල යන කවරක් හෝ විසින් ළමයින්ට අදාළ වන යම් කාරණයක් භාරගනු ලැබුවේ වුවද, ඒ සියලු කාරණයකදීම ළමයාගේ උපරිම ශුභ සිද්ධියට* ***මූලික*** *සැලකිල්ලක් දෙනු ලැබිය යුතුය* ". (අවධාරණය එකතු කර ඇත).

තවද, ළමයින් සම්බන්ධ සියලු කාරණා සඳහා උපරිම ශුභ සිද්ධි ප්‍රමිතිය අදාළ වන බව පාර්ලිමේන්තුව දැන් තීරණය කර ඇත. අයි. සී. සී. පී. ආර්. පනතේ 5(2) වගන්තිය මෙසේ දක්වයි : " *රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ හෝ සමාජ සුභසාධන ආයතන, අධිකරණ, පරිපාලන බලධාරීන් හෝ ව්‍යවස්ථාදායක මණ්ඩල යන කවරක් හෝ විසින් ළමයින්ට අදාළ වන යම් කාරණයක් භාරගනු ලැබුවේ වුවද, ඒ සියලු*

*කාරණයකදීම ළමයාගේ උපරිම ශුභ සිද්ධියට* ***ප්‍රමුඛස්ථානය*** *සැලකිල්ලක් දෙනු ලැබිය යුතුය* ". (අවධාරණය එකතු කර ඇත).

එසේවුවද, හේග් සම්මුතිය මත වන අතීත අදහස් සමහරක්, ළමයෙකු ආපසු යැවීම පිළිබඳව වන නඩු කටයුතුවලදී (ළමයෙකු සුපුරුදු වාසස්ථානයට ආපසු යැවීම සඳහා අයදුම්පතක් සලකා බලන අවස්ථාවකදී නම්) ළමයාගේ උපරිම ශුභ සිද්ධිය සලකා බැලීමට අධිකරණවලට නුසුදුසු බව පිළිඹිබු කරන ලද අතර මෙම යෝජනාව සඳහාද අධිකාරයක් ඇත.

මේ අනුව, නීතියේ අනවශ්‍ය අපැහැදිලිතාවයන් වැලැක්වීම සඳහා හේග් සම්මුති ක්‍රියාවලියට උපරිම ශුභ සිද්ධි ප්‍රමිතිය අදාළ වන බව, නැවත ප්‍රකාශ කිරීමෙන් පවතින යම් අපැහැදිලිතාවයක් විසඳීම පාර්ලිමේන්තුවට යෝග්‍ය විය හැක.

**සංසන්දනාත්මක අත්දැකීම්.**

ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ හේග් සම්මුතියේ විධිවිධාන සමග පරිශ්‍රමයක් දක්වනු ලබන එකම අධිකරණ බලය ශ්‍රී ලංකාව නොවේ.

Neulinger සහ Shuruk එදිරිව ස්විට්සර්ලන්තය [1] නඩුවේදී, යුරෝපයේ මානව හිමිකම් [2] පිළිබඳ මහා මණ්ඩලය මෙම මූලධර්ම විශ්ලේෂණය අවසන් කරනු ලැබුවේ, මානව හිමිකම් පිළිබඳ යුරෝපීය සම්මුතියේ 8 වැනි වගන්තියෙන් ළමයෙකුගේ නැවත පැමිණීම ස්වයංක්‍රියව හෝ යාන්ත්‍රිකව තීන්දු කිරීම 1980 හේග් සම්මුතිය අදාළ වන විට, සිදු කළ නොහැකි බව සඳහන් කරමිනි. පුද්ගල සංවර්ධන දෘෂ්ඨිකෝණයකින් ළමයාගේ උපරිම ශුභ සිද්ධිය විවිධ පුද්ගල තත්ත්වයන් මත රඳා පවතී. විශේෂයෙන්, ඔහුගේ වයස සහ පරිනත මට්ටම, ඔහුගේ දෙමව්පියන්ගේ පැමිණීම හෝ නොපැමිණීම සහ ඔහුගේ පරිසරය සහ අත්දැකීම් යනාදිය වේ. ඒ හේතුකොටගෙන, එක් එක් අවස්ථාවන්හිදී එකී උපරිම ශුභ සිද්ධිය තක්සේරු කළ යුතු විය. මෙය මූලික වශයෙන් දේශීය බලධාරීන්ගේ කාර්යයක් වූ අතර ඔවුන් යම් අගය කිරීමක්ද භුක්ති විඳි නමුත් මෙය යුරෝපීය අධීක්ෂණයකට යටත්වූ අතර එම බලය ක්‍රියාත්මක කිරීමේදී එම බලධාරීන් ගෙන ඇති තීරණ ECHR යටතේ අධිකරණය විසින් සමාලෝචනය කරනු ඇත.

දේශීය තීරණ ගැනීමේ ක්‍රියාවලිය සාධාරණ බව සහතික කළ යුතු බවත්, අදාළ අයට ඔවුන්ගේ නඩුව සම්පූර්ණයෙන් ඉදිරිපත්කිරීමට ඉඩ සලසන බවත් අධිකරණය වැඩිදුරටත් පැවසීය. පැහැරගත් ළමයා සඳහා ඔහුගේඋපන් රටට නැවත පැමිණීම සඳහා වන අයදුම්පත්‍රයේ සන්දර්භය තුළ, හොඳම විසඳුම කුමක්ද යන්න තීරණය කිරීමට නිරන්තර සැලකිල්ලක් ඇතිව, දේශීය අධිකරණ විසින් සමස්ථ පවුල් තත්ත්ව පිළිබඳව පුළුල් පරීක්ෂණයක් සිදු කර, එක් එක් පුද්ගලයාගේ අදාළ අවශ්‍යතා පිළිබඳව සමබර හා සාධාරණ තක්සේරුවක් කර තිබේද යන්න තහවුරු කර ගැනීම අධිකරණය සතු වේ.

අධිකරණය විසින් මෙම ප්‍රවේශය තවත් නඩු දෙකකදී අනුගමනය කර ඇත : Sneersone සහ Campanella එදිරිව ඉතාලිය (14737/09) සහ X එදිරිව ලැට්වියාව (27853/09). මෙම සිද්ධීන් දෙකටම අදාළ වූයේ ළමයින්ගේ සුපුරුදු වාසස්ථානයෙන් ළමයින් පැහැරගෙන ගිය බව කියන මවකි. ළමයාගේ ආපසු පැමිණීමේ සාරාංශය යුරෝපීය සම්මුතියේ 8 වැනි වගන්තිය කඩ කළ බවත්, එම වගන්තියට ළමයාගේද ඇතුළුව පාර්ශ්වයන්ගේ තරඟකාරී අවශ්‍යතා පිළිබඳ සවිස්තරාත්මක තක්සේරුවක් අවශ්‍ය බවත් අධිකරණය තීරණය කළේය.

[1] Neulinger සහ Shuruk එදිරිව ස්විට්සර්ලන්තය (ඉල්ලුම් පත්‍ර අංක 41615/07), මහා මණ්ඩලය, INCADAT යොමුව HC/E/1323.

[2] සම්මුතියේ 8 (1) වගන්තිය දක්වන පරිදි: "සෑම කෙනෙකුටම ඔහුගේ පෞද්ගලික සහ පවුල් ජීවිතය, ඔහුගේ නිවස සහ ඔහුගේ ලිපි හුවමාරුව සඳහා ගරු කිරීමට අයිතියක් ඇත".

__ප්‍රායෝගික යථාර්තයන්.__

ප්‍රාථමික නොවන භාරකරු විසින් ප්‍රාථමික භාරකරුගෙන් ළමයාව ඉවත් කරගෙන වෙනත් රටකට ගෙන යනු ලබන අවස්ථා බොහෝමයකට හේග් සම්මුතිය අදාළවන බවට එම සම්මුතිය මගින් පරිකල්පනය කර ඇති බව ට්‍රැවෝක්ස් සූදානම් කිරීම් හෙළි කරනු ලබයි.

කෙසේවෙතත්, 2022 හේග් සම්මුතියේ එක් පත්‍රිකාවක සටහන් වන පරිදි, සම්මුතිය කෙටුම්පත් කරන්නන් විසින් අපේක්ෂා කරන ලද්දේ, "පැහැරගෙන යනු ලබන මාපියා බොහෝවිට ප්‍රාථමික භාරකරු / මව[3] වන නිසා, සම්මුතිය කෙටුම්පත් කිරීමෙන් පසු ගතවූ වසර කිහිපය තුළදී, පැහැරගෙන යනු ලබන දෙමාපියන්ගේ පැතිකඩ කෙටුම්පත්කරුගේ මූලික සංකල්ප බොරුකර ඇති බවයි".

එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු රීම් අල්සලම් විසින් රචිත, කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, එහි හේතු සහ ඵලවිපාක පිළිබඳව වන 2023 වාර්තාවද හේග් සම්මුතිය සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

36 සහ 37 ඡේදවල ඇය මෙලෙස සඳහන් කරයි :

*36. හේග් හී දී සම්මත කර ගන්නා ලද ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය (1980) මගින් ජාත්‍යන්තර දෙමාපියන් ළමයින් පැහැර ගැනීම ආවරණය කරන අතර හේග් සම්මුතියේ එක් රාජ්‍ය පාර්ශ්වයක භූමි ප්‍රදේශයකින් සම්මුතියේ වෙනත් රාජ්‍ය පාර්ශ්වයක ප්‍රදේශයක දෙමාපියකු විසින් ජාත්‍යන්තරව පැහැර ගන්නා ලදළමයකුගේ ආපසු පැමිණීම සඳහා කඩිනම් ක්‍රියාවලියක් සපයන අතර භාරකාරත්වය පිළිබඳ ආරවුල එම අධිකරණ බල ප්‍රදේශයේ අධිකරණය මගින් විසඳාගත හැකි වේ. කෙසේවෙතත්, සම්මුතිය තුළ ගෘහස්ථහිංසනය සම්බන්ධයෙන් හෝ අපයෝජනයට ලක්වූ මවුවරුන් සඳහා ආරක්ෂාව පිළිබඳ සඳහන් නොවේ. 91 එහි ප්‍රතිඵලයක් වශයෙන්, මවුවරුන් තමදරුවන් සමඟ ජාත්‍යන්තර දේශ සීමා හරහා යන විටදී සම්මුතියේ 37 යටතේ අධිකරණය විසින් "පැහැරගෙන යන" දෙමාපියෙකු ලෙස සලකනු ලැබීමකට ඔවුන් ගොදුරු වේ.*

*37. __හේග් සම්මුතිය යටතේ ගොනු කර ඇති සියලුම නඩු වලින් හතරෙන්-තුනක් පමණම මවුවරුන්ට එරෙහිව වන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ගෘහස්ථ හිංසනයෙන් පලා යන අයවලුන් හෝ තම දරුවන් අපයෝජනයෙන් ආරක්ෂා කිරීමට උත්සාහ දරන අයවලුන් වෙති.__ 92. සම්මුතියේ 13 වගන්තියේ සඳහන් වනුයේ, හානියක් වීමේ "බරපතල අවදානමක්" පවතී නම්, ආපසු පැමිණීම සඳහා වන්නාවූ නියෝගයක් ප්‍රතික්ෂේප කළ හැකි බවයි. කෙසේවෙතත්, ළමයින් වෙනත් රාජ්‍ය පාර්ශ්වයකට ආපසු නොපැමිණීමට හේතුවක් ලෙස ගෘහස්ථ හිංසනයට නිරාවරණය වීම පිළිගැනීමට අධිකරණය මැලිකමක් දක්වයි. ඇතැම් අවස්ථාවලදී, ළමයින්ට එරෙහිව හිංසනයක් සිදුවී ඇති බව සොයා ගත්විට පවා අධිකරණය විසින් ළමයින් ඔවුන්ගේ සුපුරුදු වාසස්ථාන වෙත ආපසු යවා ඇත. 93. එය, කාන්තාවන්ට සහ ළමයින්ට අපයෝජන සහ ජීවිත තර්ජනාත්මක තත්ත්වයන්ට නැවත පැමිණීමට නිතරම බල කරනු ලබයි. 94. පවුල් ආධාර සඳහා තම මව් රටවලට ආපසු යාමට අපේක්ෂා කරන සංක්‍රමණික කාන්තාවන්ට ළමා*

*පැහැරගැනීමේ චෝදනා හේතුවෙන් බලහත්කාරයෙන් ආපසු යාමට සිදුවුවහොත් අමතර බාධකවලට මුහුණදීමට සිදුවේ. 95. (අවධාරණය එකතු කර ඇත).*

ඉන්පසුව ඇය නිර්දේශ කරනුයේ, "පවුලක් සහ පවුලේ ගෘහස්ථ හිංසනය තිබේ නම්, ආපසු පැමිණීමට එරෙහිව ශක්තිමත්ආරක්ෂාවක් ලබා දීමෙන් අපයෝජනයට ලක්වූ කාන්තාවන් සහ ඔවුන්ගේ ළමයින් වඩා හොඳින් ආරක්ෂා කිරීම සඳහා සම්මුතිය සංශෝධනය කළ යුතු බවයි".

[3] ඩෙබෝරා රීස්ල හේග් ළමා පැහැරගෙන යාම් සිද්ධිවලට පවුල් ප්‍රචණ්ඩත්වයන්ට නිරාවරණය වීම, 36 එමොරි ජාත්‍යන්තර නී.සං.81 (2024).

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, අපගේ අධිකරණ මගින් විසඳනු ඇතැයි සිතිය හැකි බොහෝමයක් හේග් නඩුවල ශ්‍රී ලාංකික සම්භවයක් ඇති මවෙකු හා පියෙකු ඇතුළත් වන අතර බොහෝවිට රැකියා අවස්ථා සඳහා විදේශගතවූ විට වෙනත් ජාතිකයකු සමග සම්බන්ධවීමට අවස්ථාව ඇති වන අතර එහිදී මව නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන විට හෝ විවාහයෙන් වෙන් වීම ඉක්මන් කිරීමක් විය හැකිය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා තිබෙන්නට හෝ නොතිබෙන්නට හැකිය. මවුවරුන් ශ්‍රී ලංකාවට නැවත පැමිණෙන අවස්ථා බොහෝමයකම ප්‍රාථමික උපසුථායකයා වන්නේ මව බව පෙනෙන්නට තිබේ.

මෙම තත්ත්වයන් යටතේ, ශ්‍රී ලංකාවට පැමිණීමට පියාට ඇති හැකියාවට එරෙහිව, වීසා සහ රැකියාව යන කරුණු සමබරව ඇතුළතු කරමින්, වෙනත් රටකට යාමට මවකගේ සාධාරණ අපේක්ෂාවන් සලකා බැලීමට අධිකරණයට නොහැකි නම්, ගෘහස්ථ හිංසනය පිළිබඳ ගැටළුව සහ මවගේ සැබෑ අපේක්ෂාව වන්නාවූ එම රටවල යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රනයන්ට ප්‍රවේශ වීමට හැකිවීම සහ ඒ ආශ්‍රිත වෙනත් ගැටළු හේතුවෙන් ළමයාව ප්‍රාථමික භාරකරුගෙන් සදහටම වෙන් කිරීම හෝ අසතුටුදායක හෝ තිබුනාටත් වඩා ප්‍රචණ්ඩ විවාහයකට මවට නැවත පියා වෙත යාමට බලකිරීමේදී මව විසින් ළමයා වෙනත් පරිසරයක තැබීම.

මේවා නීති සම්පාදකයන් විසින් බැරෑරුම් ලෙස සලකා බැලිය යුතු ප්‍රායෝගික යථාර්තයන් වේ.

<u>**අවසාන නිගමනය.**</u>

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් පහත දැක්වෙන කරුණු යෝජනා කළ හැකිය :

1. "ඒ ළමයා ආපසු යැවීමෙන් ඒ ළමයා ශාරීරික හෝ මානසික පීඩාවකට භාජනය වීමේ හෝ අන්‍යාකාරයකින් ඉවසිය නොහැකි තත්ත්වයකට පත්වීමේ බරපතල අවදානමක් ඇති බවට" යන්න අවලංගු කර "ළමයාගේ උපරිම ශුභ සිද්ධිය සඳහා නොවේ" යන්න ප්‍රතිස්ථාපනය කරන්න.

   නැතහොත්

2. (අ) සහ (ආ) තබාගෙන (ඇ) ලෙසට "ළමයාගේ ආපසු යැවීම ළමයාගේ උපරිම ශුභ සිද්ධිය සඳහා නොවේ" යන්න ඇතුළත් කරන්න.

   නැතහොත්

3. (ආ) "ළමයාගේ ආපසු යැවීම ළමයාගේ උපරිම ශුභ සිද්ධිය සඳහා නොවේ හෝ ඒ ළමයා ආපසු යැවීමෙන් ඒ ළමයා ශාරීරික හෝ මානසික පීඩාවකට භාජනය වීමේ හෝ අන්‍යාකාරයකින් ඉවසිය නොහැකි තත්ත්වයකට පත්වීමේ බරපතල අවදානමක් ඇත" යනුවෙන් කියැවෙන පරිදි සංශෝධනය කරන්න.

## 03. හවුල් ව්‍යාපාර නීතියට අදාළ සංශෝධන.

**ආරම්භ කළ දිනය: 2024.03.28**

නීති කොමිෂන් සභාව විසින් හවුල් ව්‍යාපාර නීතියට අදාළව අවශ්‍ය සංශෝධන සලකා බැලීම සඳහා වන අනු කමිටුව සඳහා පහත සාමාජිකයින් පත් කරන ලදී.

1. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
2. ජනාධිපති නීතිඥ චානක ද සිල්වා මහතා
3. මහාචාර්ය නසීමා කමර්ඩීන්
4. ආචාර්ය මිල්හාන් මොහමඩ්.

අනු කමිටුවේ සාමාජික  මහාචාර්ය නසීමා කමර්ඩීන් විසින් ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර නීතිය සම්බන්ධ ප්‍රතිසංස්කරණ පිළිබඳ අතුරු වාර්තාව සභාගත කර සාකච්ඡා කෙරුණි. ඉහත මාතෘකාව සම්බන්ධයෙන් මතු දැක්වෙන අංශ අනු කමිටුව විසින් සැලකිල්ලට ගත් බව මහාචාර්ය කමර්ඩීන් විසින් කොමිෂන් සභාව වෙත දන්වන ලදී.

1. ආචාර්ය ජේ. ස්වාමිනාදන් විසින් සකසන ලද කෙටුම්පත සහ සංකල්ප සටහන සාකච්ඡා කරන ලදී.
2. ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ ඌණතා සැලකිල්ලට ගන්නා ලදී.
3. පොදුවේ හවුල් ව්‍යාපාර නීතියේ සහ විශේෂයෙන්ම සීමිත වගකීම් හවුල් ව්‍යාපාරවල නව්‍ය සංවර්ධන අංශ යනාදිය ඇගයීමට ලක් කළ යුතුය.

**ගත යුතු ක්‍රියාමාර්ග:**

1. මෙ සම්බන්ධයෙන් නව්‍ය සංවර්ධනයන් තහවුරු කර ගැනීම සඳහා විදේශීය අධිකරණ බලතල පරීක්ෂා කිරීම (උදා. සිංගප්පූරුව).
2. නීතිය මගින් නියාමනය කළ යුතු විධිවිධාන මොනවාදැයි සොයාබැලීම සඳහා නීති සමාගම්වල හවුල් ව්‍යාපාර ගිවිසුම් පරීක්ෂා කිරීම.
3. ආචාර්ය ස්වාමිනාදන් විසින් කෙටුම්පත් කරන ලද ලේඛන අධ්‍යනය කර වත්මන් කාර්යය සඳහා භාවිත කළ හැකි දේ සොයාබැලීම.
4. හවුල් ව්‍යාපාර නීතියේ සංවර්ධනය සඳහා යොදාගත හැකි, හවුල් ව්‍යාපාර නීතිය සම්බන්ධ ඕනෑම දේශීය අධිකාරීන්/ නඩු සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම.

අවසාන කරන ලද කෙටුම්පත හැකි ඉක්මනින් ඉදිරිපත් කරන බව මහාචාර්ය නසීමා කමර්ඩීන් වැඩිදුරටත් දන්වා සිටියාය.

**අනු කමිටු රැස්වීම් ගණන: 02 (2024 දෙවන කාර්තුවේදී)**

**ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය සාකච්ඡා කළ නීති කොමිෂන් සභා රැස්වීම් ගණන: 08**

**න්‍යාය පත්‍රයේවූ ප්‍රධාන මාතෘකා හැරුණුකොට සාකච්ඡා කරන ලද වෙනත් මාතෘකා.**

1. **<u>2024 අංක 43 දරන පනතින් ඇති කරන ලද විෂමතා ඉවත් කිරීම.</u>**

   ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මයා විසින් කෙටුම්පත් ගත කරන ලද ඉහත මාතෘකාව සම්බන්ධයෙන් වන පර්යේෂණ පත්‍රය 2024.10.23 දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී සභාගත කර සාකච්ඡා කරන ලදී. ඊළඟ රැස්වීමේදී වැඩිදුර සාකච්ඡාවක් පැවැත්වීමට සාමාජිකයන් එකඟ වුණි.

**සාකච්ඡා කරන ලද පර්යේෂණ පත්‍රිකා ගණන : 01**

2. **<u>2023 සඳහා ශ්‍රී ලංකාවේ නඩු සංඛ්‍යා ලේඛන පිළිබඳ වාර්තාව.</u>**

අංක MOJ/PLN/Stat/General – 2023 දරන සහ 2024 ඔක්තෝබර් 10 දිනැති ලිපිය මගින් අධිකරණ අමාත්‍යාංශය විසින් එවන ලද ඉහත වාර්තාව සභාගත කර සාකච්ඡා කරන ලදී. සභාපති තුමා විසින් එම වාර්තාව අධ්‍යනය කර කොමිෂන් සභාව වෙත අදහස් ඉදිරිපත් කිරීම සඳහා ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු නීතිඥ නිර්මලන් විග්නේෂ්වරන් මහතා සහ නීතිඥ නිරාන් ඇන්කටෙල් මහතා සාමාජිකයන් වන අනු කමිටුවක් පත් කරන ලදී.

**<u>2024 අංක 43 දරන පනතින් ඇති කරන ලද විෂමතා ඉවත් කිරීම.</u>**

පනත්වල විෂමතා ඉවත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම යනු, නීති කොමිෂන් සභා පනතේ 4 වන වගන්තිය මගින් නීති කොමිෂන් සභාව වෙත පැවරී ඇති බොහෝමයක් රාජකාරිවලින් එකකි.

එබැවින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9 වගන්තියේ (අ) සඳහා, නීතිගත කිරීමට පෙර නීති කොමිෂන් සභාව වෙත යොමු නොකර, 2024 අංක 43 පතන මගින් මෑතකදී සිදුකරන ලද සංශෝධනය කෙරෙහි නීති කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ සාමාජිකයන්ගේ හදිසි අවධානය යොමු කරනු ලැබේ.

"විත්තිකාර පාර්ශ්වකරුවකු පදිංචිව සිටින්නේ" යන පූර්ව සූත්‍රයට පටහැනිව "පැමිණිලිකාර පාර්ශ්වකරුවකු හෝ විත්තිකාර පාර්ශ්වකරුවකු පදිංචිව සිටින්නේ" යන්නෙන් වන මෙම සංශෝධනය ඕනෑම පැමිණිලිකරුවකුට නඩු කටයුත්තක් ආරම්භ කිරීමේ හිමිකම ලබා දෙයි.

මෙය දික්කසාද නඩුවලදී ඇති විශේෂ ප්‍රතිපාදන සමග සැසඳිය නොහැක්කේ, විවාහය දෙදරා යන තෙක්ම, සැමියා සහ බිරිඳ එක් අධිකරණ බල ප්‍රදේශයක එකට ජීවත්වූ බැවිනි. දික්කසාද නඩුවලදී අධිකරණ බල ප්‍රදේශය තුළ නඩුව ගොනු කිරීමට අවසර දීමේ තාර්කිකත්වය එය විය යුතුය.

මෙම සංශෝධන වගන්තිය මගින් මුල් සූත්‍ර ගත කිරීම පිටුපස ඇති තාර්කිකත්වය පරාජය කරනු ලබයි.

නිකුත් කරන ලද සංශෝධනයට පෙර 9 (අ) වගන්තියෙහි මුල් සූත්‍ර ගත කිරීම පිටුපස ඇති තාර්කිකත්වය, **<u>හුසාන් එදිරිව පීරිස් (1932) 34 න.නී.වා. 238</u>** හි පැහැදිලි කර ඇත.

ඉහත තීන්දුවේ 242 – 243 යන පිටුවල සිවිල් නඩු විධාන සංග්‍රහයේ 14 වගන්තියට අනුව, "විත්තිකාර පාර්ශ්වකරු" යන්නෙන් අදහස් කරනුයේ "යම් සහනයක් ලබා ගැනීමේ අයිතිවාසිකම, යම් තැනැත්තන්ට විරුද්ධව ඇතැයි කියනු ලබයි" නම් **<u>මෙම යෙදුමේ නිර්වචනය පැමිණිලිකරුවකු විසින් යම් දිස්ත්‍රික්කයක එම දිස්ත්‍රික්කයේම පදිංචි පැමිණිලිකරුගේම පොදු සම්බන්ධතා ඇති අයෙකුට විරුද්ධව නඩුවක් පැවරීම වළකන අතර ඔහු නාමික විත්තිකරුවකු පමණක් වේ</u>** - එනම් බේකර් එදිරිව වෙට් හී විස්තර කරන පරිදි "පොකට්ටු විත්තිකරුවෙක්" - එනම්, **<u>තම දිස්ත්‍රික්කයෙන් පිටතට පැමිණ සහනයක් ලබා ගැනීමේ අයිතිවාසිකම ඇතැයි කියනු ලබන සැබෑ තැනැත්තාට එරෙහිව නඩුවක් පැවරීමට බල කරනු ලබයි.</u>**

"මේ සඳහා උදාහරණයක් වනුයේ, උකස්ලාභියා වෙනත් දිස්ත්‍රික්කයක පදිංචිකරුවකු වුවද, අධිකරණ බලය සෙවීම සඳහා පළමු උකස්කරුගේ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවකු වන puisne උකස්කරුට එරෙහිව, ඔහුව විත්තිකරු කරමින්, පළමු උකස්කරු විසින් ඔහුගේ දිස්ත්‍රික්කයේ නඩුවක් ආරම්භ කිරීමක් සහ තවත් උදාහරණයක් වනුයේ, ගනුදෙනුව සාකච්ඡා කර ගත හැකි යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් වන නඩුවකදී, එම භාණ්ඩයේ අයිතිකරු විසින් අණකරු පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ අධිකරණය වෙත නඩුව ගෙන ආ විටදී වෙනත් දිස්ත්‍රික්කයක පදිංචිව සිටින්නාවූ සැබවින්ම සහනය සෙවූ පාර්ශ්වයන්ට, භාර ගන්නා අයට සහ පිටසන්කරුවන්ට එරෙහිව අණකරු , පැමිණුලිකරුගේ සම්පූර්ණ සම්බන්ධතාවක් සඳහා වන විටදී වේ. ජේම්ස් V.C. ට අනුව, ඉහත දැක්වූ පරිදි, බේකර් එදිරිව වෙට් නඩුවේ කරුණු වන්නේද මේවාම වේ. "පැමිණිලිකරු හට ඔහුගේ 'පොකට්ටු' විත්තිකරුව පමණක් මෙම දිස්ත්‍රික්කය තුළ සිටීනම් සහ වෙනත් කිසිදු විත්තිකරුවන් පදිංචි නොවන, මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාන්ත අධිකරණයේ ගොනු කරන ලද පැමිණිල්ලක් සමග කටයුතු කරගෙන යාමට සිදුවේ නම්, මෙවැනි කරුණු සම්බන්ධයෙන් කරන ලද සියලුම ආඥා සම්පූර්ණයෙන්ම අවලංගු සහ බල රහිත වන බවට කීමට මම නොපැකිළ වෙමි.

එබැවින්, "සැබෑ" විත්තිකරුට "ඔහුගේම දිස්ත්‍රික්කයේ නඩු පැවරීමට "පොකට්ටු" විත්තිකරුවකු ඉදිරිපත් කිරීමෙන් විත්තිකරුවෙකුට හිරිහැර කිරීම වැළැක්වීම 9(අ) මුල් වගන්තියේ අදහස බව පැහැදිලි වේ.

තවද, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9 වැනි වගන්තියේ අනෙකුත් ශීර්ෂ මත පදනම්ව අධිකරණය වෙත පැවරෙන අධිකරණ බලය සඳහා විවිධ මූලධර්ම අදාළ වන බැවින් එම අධිකරණ ශීර්ෂයන්ගේ ඇති තාර්කිකත්වය නව සංශෝධනයෙන් පසුව අතිරික්ත වනු ඇත.

9(ආ) වගන්තිය ප්‍රකාරව, ඉඩම පිහිටි ස්ථානය තුළ නිශ්චල දේපළ සම්බන්ධ නඩුවක් ගොනු කළ හැකිය. 9(ඇ) වගන්තිය මගින් නඩු නිමිත්ත පැන නැගුණු ස්ථානය මත පදනම්ව අධිකරණ බලය ලබා දෙනු ලබයි.

[සෙනෙවිරත්න එදිරිව තාහා (1961) 65 න.නී.වා. 184] ; ප්‍රකාශිත ගිවිසුමක් නොමැති විට, ගනු දෙනුව සාකච්ඡා කළ හැකි භාණ්ඩ සම්බන්ධයෙන් වන්නාවූ මුදල් අය කර ගැනීමේ නඩු "ණය ගැතියා විසින් ණය හිමියා සෙවිය යුතුය" යන ඉංග්‍රීසි නීතියේ මූලධර්මය මගින් පාලනය වේ [ශ්‍රී ලංකා සමූපකාර සමිතිය එදිරිව සුසෙයි [2009] 1 ශ්‍රී ලංකා නී.වා. 67]. 9(ඇ) වගන්තිය ප්‍රකාරව, ඉටු කරවා ගැනීමට අපේක්ෂිත ගිවිසුම ඇති කර ගනු ලැබූ ස්ථානය මත පදනම්ව අධිකරණ බලය පැවරේ.

කෙසේවෙතත්, ඉහත සඳහන් 34 න.නී.වා. නඩුවේ පැහැදිලි කර ඇති පරිදි, (බෙදීමට අපේක්ෂිත ඉඩම පිහිටි ස්ථානය මත පදනම්ව නඩුව ගොනු කිරීම අනිවාර්ය කරනු ලබන බෙදුම් නීතිය වැනි) නිශ්චිත ප්‍රඥප්තියකින් අධිකරණ බලය පාලනය කරන්නේ නම් මිස, කෙනෙකුට අධිකරණ බල අවශ්‍යතාව ඉටුකර ගැනීම සඳහා 9 වගන්තිය යටතේ වන ඕනෑම ශීර්ෂයක් යටතේ නඩුවක් ගොනු කිරීම මගින් සහ සියලු අවස්ථාවලදී, විත්තිකාර පාර්ශ්වකරුවකු පදිංචිව සිටින ප්‍රදේශයේ නඩුවක් ගොනු කිරීම මගින් හැකිවනු ඇත.

සිවිල් නඩු විධාන සංග්‍රහයක් භාවිතා කරන වෙනත් අධිකරණ බල ප්‍රදේශවලින් තාර්කිකත්වය සඳහා සැසඳීමක් ඇවශ්‍ය නම්; ඉන්දියාව, පාකිස්ථානය, කැනඩාව සහ ස්විට්සර්ලන්තය උපුටා දැක්විය හැක. මෙම අධිකරණ බල ප්‍රදේශවල ඉහත දක්වා ඇති තාර්කිකත්වය මත අනුමාන වශයෙන් පැමිණිලිකරුගේ පදිංචිය මත පදනම්ව අධිකරණයේ අධිකරණ බලය ඉල්ලා සිටීමට අයිතිය ලබා දී නොමැත.

නිදසුනක් වශයෙන්, ඉන්දියාවේ 1908 අංක 5 දරන සිවිල් නඩු විධාන සංග්‍රහයේ 17 වගන්තිය ප්‍රකාරව ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ නඩු පැවරීම කළ යුතු නිශ්චල දේපළ සම්බන්ධ නඩු හැර, පුද්ගලයාට හෝ චංචල භාණ්ඩවලට සිදුවන වැරදි සඳහා වන්දි ගෙවීම සම්බන්ධ නඩු පැවරීම් වරද සිදුකළ ප්‍රදේශයේ හෝ විත්තිකරු පදිංචි ප්‍රදේශයේ සිදුකළ යුතුය (වග.19) සහ අනෙක් සියලු අවස්ථාවලදී, විත්තිකරුගේ පදිංචි ප්‍රදේශයේ හෝ නඩු නිමිත්ත පැන නැගුණු ප්‍රදේශයේ (වග. 20) නඩු පැවරීම් සිදුකළ යුතු වේ. විශේෂයෙන්ම, වග. 20(ආ) නිදර්ශනය මගින් අධිකරණ බලයට විරෝධයක් දැක්වීමට පදිංචිකරුවකු-නොවන විත්තිකරුවකු හට අවස්ථාවක් ලබාදී ඇත.

"(ආ) ඒ, සිම්ලා හී පදිංචිව සිටී. බී, කල්කටාහිත් සී, දිල්ලියේහිත් පදිංචිව සිටී. ඒ,බී සහ සී බෙනරාස් හි එකට සිටීම, බී සහ සී ඉල්ලුම මත ගෙවිය යුතු ඒකාබද්ධ පොරොන්දු නෝට්ටුවක් සාදා, ඒ වෙත එය භාර දෙනු ලබයි. ඒ විසින් බී සහ සී ට බෙනරාස් හිදී නඩු නිමිත්ත පැන නැගුණු ස්ථානයේදී වීම නිසා නඩුවක් දැමිය හැකිය. ඔහුට ඔවුන්ට එරෙහිව බී පදිංචි කල්කටාවේදීද නැත්නම් සී පදිංචි දිල්ලියේදීද නඩු දැමිය හැකිය. නමුත්, මෙම එක් එක් නඩුවේදී, පදිංචිකරුවකු-නොවන විත්තිකරු විරුද්ධ වන්නේ නම්, අධිකරණයේ අවසරයකින් තොරව නඩුව ඉදිරියට ගෙන යා නොහැක.

2022.8.4 වන දින තීරණය කරන ලද ෆොමෙන්ටෝ සම්පත් පුද්ගලික සමාගම එරෙහිව ගයාත්‍රි බර පාලම් C/SCA/11233/2021 නඩුවේදී කොන්ත්‍රාත්තුවේදීම කිසිදු ප්‍රකාශිත ගිවිසුමකින් තොරව "ණය ගැතියා විසින් ණය හිමියා සෙවිය යුතුය" යන මූලධර්මය යෙදීම ඉන්දීය සිවිල් නඩු විධාන සංග්‍රහයේ 20 වගන්තියට පටහැනි බව ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේය. ඒ, "ණයහිමියකු විසින් කරනු ලබන නඩු දැමීමකදී, සියලු නඩු වලදී, පැමිණිලිකරුගේ පදිංචි ස්ථානයේ හෝ ව්‍යාපාරික ස්ථානයේ ගොනු කළ යුතුය" යනුවෙන් ඇති බැවිණි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 20 වගන්තියේ පරමාර්ථය දක්වමින්, "නීත්‍යානුකූලව ආරක්ෂා කිරීමේදී විත්තිකරුවන් දුෂ්කරතාවට පත් නොකිරීම" සහ "සෑම මිනිසකුගේම දැවෙන හදට හැකිතාක් ළං කිරීමට හැකි වන සේ සුරක්ෂිතව නිර්මාණය කර ඇති යුක්තිය සහ විත්තිකරු විසින් තමාව ආරක්ෂා කර ගැනීම සඳහා කරදරවලට නොවැටීම, දුර ගමන් සඳහා ගමන් වියදම් නොදැරීම" (35 ඡේදය).

පාකිස්ථාන සිවිල් නඩු විධාන සංග්‍රහයේ 20 වගන්තියේ ඉන්දීය සිවිල් නඩු විධාන සංග්‍රහයේ තාර්කිකත්වය තහවුරු කරන විධිවිධානයන් අඩංගු වේ.

ස්විට්සර්ලන්ත සම්මේලනයේ ෆෙඩරල් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) ව්‍යවස්ථාව මගින්, නීතිය මගින් අන්‍යාකාරයකින් සපයා නොමැතිනම්, සිවිල් නඩු විභාගයක් ඇති ඕනෑම පුද්ගලයෙකුට ඔහු පදිංචි අධිකරණ බල සීමාව තුළ වන්නාවූ අධිකරණයකින් තම නඩුව තීරණය කර ගැනීමට අයිතිය ඇත.

කැනඩාවේ **<u>ඒකාකාර අධිකරණ බලය සහ නඩු පැවරීම් පනතේ (2021)</u>** 3 වගන්තිය නියම කරනුයේ, "පුද්ගලයෙකුට එරෙහිව ගෙන එනු ලබන නඩුවකදී අධිකරණයකට භෞමික හැකියාවක් ඇත්තේ නම් :

අ) එම පුද්ගලයා අධිකරණයේ වෙනත් නඩු විභාගයක පැමිණිලිකරු වන අතර, අදාළ නඩු විභාගය ප්‍රතිප්‍රකාශයක් වේ.

ආ) නඩු විභාගය අතරතුර එම පුද්ගලයා අධිකරණයේ අධිකරණ බලය ඉදිරිපත් කරයි.

ඇ) නඩු විභාගයේදී අධිකරණයට අධිකරණ බලය ඇති බවට පැමිණිලිකරු සහ එම පුද්ගලයා අතර එකඟතාවයක් තිබේ.

ඇ) එම පුද්ගලයා නඩුව ආරම්භ කරන අවස්ථාවේ (නඩුව පනවන පළාතේ හෝ ප්‍රදේශයේ) සාමාන්‍යයෙන් පදිංචිව සිටී.

ඇ. 1) එම පුද්ගලයා අධිකරණයට භෞමික හැකියාවක් ඇති වෙනත් පුද්ගලයෙකුට එරෙහිව පවතින නඩු විභාගයක අනිවාර්ය පාර්ශ්වකරුවකු වේ ; හෝ

ඉ) [නඩුව පනවන පළාත හෝ ප්‍රදේශය] සහ එම පුද්ගලයාට එරෙහි නඩුව සඳහා පදනම් වන කරුණු අතර සැබෑ සහ සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇත.

ඉහතකී කොටසට අදාළ විවරණයේ දැක්වෙනුයේ, (ඇ) ඡේදය මගින් එම සංසද පළාතේ හෝ ප්‍රදේශයේ නඩු කටයුතු සමග සේවය කරන ඕනෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් අධිකරණයකට අධිකරණ බලයක් ඇතැයි යන සම්ප්‍රදායික රීතිය ප්‍රතිස්ථාපනය කරඇති බවත්, එය පළාතේ තාවකාලිකව පදිංචිව සිටින පුද්ගලයෙකු බලපෑමක් ඇති කරන බවත් අධිකරණ බලය අධිකරණයේ අධිකරණ බලයට යටත් නොවීම : සාම්ප්‍රදායික පාලනයේ මෙම වෙනස සාධාරණත්වය මත සිදු කරනු ලැබේ. මන්දයත්, විත්තිකරුවෙකු පළාතක භෞතිකව සිටීම හෝ විත්තිකරු සම්බන්ධයෙන් අධිකරණ බලය තහවුරු කිරීමට පළාතකට හෝ ප්‍රදේශයකට ප්‍රදේශය ප්‍රමාණවත් පදනමක් නොවිය යුතුය.

(ඇ.1) වගන්තිය, විත්තිකරුවෙකුට වඩා භෞමික හැකියාවක් සඳහා වෙනත් පදනමක් නොමැති තත්ත්වයක් තුළ පරතරය පිරවීම සඳහා අනිවාර්ය පාර්ශ්වයක් සපයයි. නිදසුනක් ලෙස, සම-හිමිකරුවකු විදේශයක පිහිටි වැටලයකට හානි කිරීම සම්බන්ධයෙන් නේවාසික විත්තිකරුවෙකුට නඩු පවරන විට සහ අනෙක් සම-හිමිකරු හිමිකම් පෑමට සම්බන්ධවීම ප්‍රතික්ෂේප කරන විට, එම සම-හිමිකරු නඩු විභාගයේදී විත්තිකරුවකු විය යුතුය [3.5 විවරණය].

කැනඩාවේ භාවිත වන **සැබෑ සහ සැලකිය යුතු සම්බන්ධතා පිළිබඳ පරීක්ෂණය** මගින් නඩු විභාගයේ විෂය කරුණු සංසදයට සම්බන්ධ කරන අනුමාන සම්බන්ධක සාධක හඳුනා ගැනීම සිදු කරනු ලබයි. **<u>සීමාසහිත ක්ලබ් රිසෝර්ට්ස් ලිමිටඩ් එදිරිව වැන් බ්‍රෙඩා [2012] 1SCR 572</u>** හිදී පවත්වන ලද පරිදි, උදාහරණයක් ලෙස, වධහිංසාවකදී ප්‍රතික්ෂේප කළ හැකි අනුමාන සම්බන්ධක සාධක වනුයේ ; (අ) විත්තිකරුගේ වාසස්ථානය හෝ පදිංචිය එම පළාතේ වීම (ආ) විත්තිකරු එම පළාතේ ව්‍යාපාරය කරගෙන යාම (ඇ) වධහිංසාව එම පළාත තුළ සිදු කිරීම ; සහ (ඇ) ආරවුල සම්බන්ධ කොන්ත්‍රාත්තුව පළාත තුළ සිදු කර ඇති අතර ඒවා පරිපූර්ණ නොවන සාධක වේ. නව සම්බන්ධක සාධකයක් උපකල්පිත බලපෑමක් ලබාදිය යුතු ද යන්න සලකා බැලීමේදී " පිළිවෙල, සාධාරණත්වය සහ සහයෝගීතාවයේ අගයන් ප්‍රශ්නයේ සාධකය යොමු කරන සංසදයක් සමග ඇති සම්බන්ධතාවයේ ශක්තිය තක්සේරු කිරීමට ප්‍රයෝජනවත් විශ්ලේෂණ මෙවලම් ලෙස සේවය කළ හැක". පැවැත්ම සහ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම අතර පැහැදිලි වෙනසක් පෙන්නුම් කරමින් අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ, "අධිකරණ බලය ස්ථාපිත වූ පසු, විත්තිකරු වැඩිදුර විරෝධතා ඉදිරිපත් නොකරන්නේ නම්, නඩු විභාගය සංසදයේ අධිකරණයේදී ඉදිරියට ගෙන යනු ලබයි. විත්තිකරු අපහසු සංසද ඉල්ලා සිටියහොත් මිස, අධිකරණයට එහි අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කළ නොහැකිය".

එබැවින්, මෙම සංශෝධනය අවලංගු කිරීමට නීති කොමිෂන් සභාව ඉතා මැනවින් නිර්දේශ කරයි.

කිසියම් හේතුවක් නිසා එසේ කිරීමට අකමැත්තක් වේ නම්, විකල්පයක් වශයෙන්, විත්තිකරුවකුට ඇති වන බලවත් අපහසුතාවය සහ පීඩාව සහ නඩුවකදී පැමිණිලිකරුවෙකුට අණ කළ හැකි සාපේක්ෂ සහ අනවශ්‍ය වාසිය නැති කර දැමීමට ප්‍රතිපාදන සීමා කිරීම කළ හැකිය.

මේ සම්බන්ධයෙන් උදාහරණ අවශ්‍ය නම්, කුලී පනත යටතේ ආරක්ෂාව ඇති මඩකලපුවේ දූප්පත් කුලී නිවැසියෙකු කොළඹට ගෙන ඒම හෝ යාපනයේ ඉඩමකට බලපත්‍ර හිමිකම් කියන ගොවියෙකු මාතරට ගෙන ඒම පිළිබඳව සලකා පලන්න.

මීට අමතරව, සමීක්ෂණ, කොමිෂන් සභා ආදිය ක්‍රියාත්මක කිරීමේදී නිශ්චල දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන අවස්ථාවලදීද මෙම සංශෝධන ප්‍රායෝගික නොවේ.

සැමවිටම (නිශ්චල දේපළ පිහිටි ස්ථානය වෙත) වෙනත් අධිකරණ බල ප්‍රදේශයකින් සාක්ෂිකරුවන් කැඳවීමට සිදු වීමෙන්, නඩු පැවරීමේ පිරිවැයද සැලකියයුතු ලෙස වැඩි වනු ඇත.

සම්පූර්ණයෙන් අවලංගු කිරීමක් කළ නොහැකි නම්, තනි විත්තිකරුවකු සිටින අවස්ථාවකදී ඔහුගේ පදිංචි ස්ථානයට නඩුව මාරු කර ගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට අවසර දීමට අමතරව අවම වශයෙන් නිශ්චල දේපළ සම්බන්ධයෙන් ව්‍යතිරේකයක් සිදු කරන ලෙසට යෝජනා කර සිටින්නෙමු.

ඉන්දියාව සහ පාකිස්ථානය වැනි අනෙකුත් අධිකරණ බල ප්‍රදේශවල සපයා ඇති පරිදි, විත්තිකරුට විරුද්ධ වීමේ අවස්ථාවක් ලබාදීමක්ද සලකාබැලිය හැකිය.

කෙසේවෙතත්, අපේ රටේ සන්දර්භය තුළ, විත්තිකරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවන්හිදී, එවැනි සංශෝධනයක් මගින් සංකූලතා සහ අනවශ්‍ය ප්‍රමාදයන් ඇති කරනු ඇත.

මේ අනුව, විකල්ප ලෙස, අවම වශයෙන් නිශ්චල දේපළ සම්බන්ධ නඩුවලදී හෝ ඒ හා සම්බන්ධ ඕනෑම කරුණකදී, නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේදී නඩු ගොනු කරන ලෙස නියෝග කළ යුතු අතර එමගින් කොටස් කිරීමේ ක්‍රියාවලියට සමාන කරුණු සම්බන්ධයෙන් ව්‍යතිරේකයක් ඇති කරයි.

ඉහත උත්සුකයන් සහ ප්‍රායෝගික නොවන කරුණු සැලකිල්ලට ගෙන, මෙම ප්‍රතිපාදනය තර්කයෙන් හෝ හේතුවෙන් අනුනාද නොවන බැවින්, එය අවලංගු කිරීමට නීති කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලෙසට යෝජනා කෙරේ.

සමන්ත රත්වත්තේ.

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

මෙම දෙපාර්තමේන්තුව සඳහා අදාළ නොවේ.

## 1.6 අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ පළාත් සභාව යටතේ පවතින ආයතන අරමුදල්

මෙම දෙපාර්තමේන්තුව සඳහා අදාළ නොවේ.

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

| | | |
|---|---|---|
| අ) | ව්‍යාපෘතියේ නම | මෙම දෙපාර්තමේන්තුව සඳහා අදාළ නොවේ. |
| ආ) | දායක නියෝජිතායතනය | |
| ඇ) | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - (රු.මි) | |
| ඈ) | ව්‍යාපෘති කාල සීමාව | |

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2024 වර්ෂයේ නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව වෙත 2023 ජුනි 07 දින දරන කැබිනට් මණ්ඩලය විසින් 2023/Cab Memo/J/L60 අංක දරණ 2023 ජුනි 07 දින දරන කැබිනට් පත්‍රිකාව මගින් පවරන ලද, රටේ උද්ගතව පවතින ආර්ථික අරබුදය හමුවේ ජාත්‍යන්තර ආයෝජකයන් මෙරටට ආකර්ශණය කර ගැනීමෙහිලා වඩාත් ශක්තිමත් බංකොලොත්භාවය පිළිබඳ නීතිමය රාමුවක් යෝජනා කිරීමේ කර්තව්‍යයට ප්‍රමුඛතාවය දෙන ලදී.

ඒ අනුව, රටේ මූල්‍යමය ආයතන, සමාගම් හා ආයෝජන සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, අධිකරණ නිළධාරින් හා නීති වෘත්තිකයින් සමග සාකච්ජා කොට නීති කොමිෂන් සභාව සහ ලෝක බැංකුවේ නියෝජතයින් විසින් යෝජනා එකගත්වයෙන් සකසන ලද උක්ත නීති සංශෝධන යේජනාවලිය 2024 අගෝස්තු 02 වන දින නීති කොමිෂන් සභාව විසින් අවසානාත්මක අනුමත කරන ලදී.

එම යෝජනා මත නීති කොටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද බේරාගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්වය (ආයතනික හා පුද්ගලික) පනත හා සම්බන්ධ අධිකරණ අමාත්‍යාංශය මගින් (24/1714/614/039-1) අංක දරණ කැබිනට් පත්‍රිකාවට 2024.08.26 දින කැබිනට් අනුමැතිය හිමිවිය.

ඉතා සංකීර්ණ හා තාක්ෂණික කරුණු වලින් සමන්විත වු නීති ක්ෂේත්‍ර සම්බන්ධව ඉතා සීමිත කාලයක් තුල ප්‍රශස්ත නීති සංශෝධන යෝජනාවලියක් ඉදිරිපත් කිරිමට හැකිවීම 2024 වර්ෂයේ නීති කොමිෂන් සභාව විසින් තම කාර්යසාධන ඉලක්කයන් ප්‍රශස්ත ලෙස, සැපිරීමක් බව සතුටින් දන්වමි. එම කර්තව්‍යයේ ලා තම වටිනා කාලය හා විශේෂඥ දැනුම වැය කරමින් කටයුතු කල බංකොලොත්භාවය පිළිබඳ සංශෝධන සම්බන්ධ නීති කොමිෂන් සභාවේ අනුකමිටු සභාපති ජනාධිපති නීතිඥ චානක සිල්වා මහතා ඇතුලු සියළුම අනුකමිටු සාමාජිකයින්ට නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව වෙනුවෙන් මාගේ කෘතඥතාවය පුද කරමි. තවද එම අනු කමිටුවේ කටයුතු වලට සහයෝගය දක්වමින් තම අදහස් හා යෝජනා සමගින් එම කර්තව්‍ය සඳහා සහාය දුන් නීති කොමිෂන් සභාවේ සභාපති ජනාධිපති නීතිඥ ඉක්රම් මොහොමඩ් මහතා ඇතුළු සියළුම සාමාජිකයින්ටද මාගේ හද පිරි ස්තූතිය පිරිනමමි.

තවද නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ අනෙකුත් මූල්‍ය සහ පරිපාලන කටයුතු ප්‍රශස්ත ලෙස පවත්වා ගනිමින් නීති කොමිෂන් සභාවේ කර්තව්‍යයන් සාර්ථක කර ගැනීමෙහි ලා අවශ්‍ය සහාය ලබාදුන් දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන්ට ද මාගේ හද පිරි ප්‍රණාමය පිරිනමමි.

........................................

සී.එස්.අබේසේකර
ලේකම්,
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

## 03. පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | තත්‍ය 2024 රු. | තත්‍ය 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 16,898,000 | 14,353,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | - | - | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | | 973,738 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | 16,898,000 | 15,326,738 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **16,898,000** | **15,326,738** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 35,950 | 45,093 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **16,862,050** | **15,281,645** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 13,460,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 11,491,955 | 9,927,473 | ඒසීඒ-2(ii) |
| 12,200,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 9,036,542 | 6,276,508 | ඒසීඒ-2(ii) |
| 200,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,491 | 22,875 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **25,860,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **20,529,988** | **16,226,856** | |
| | **මූලධන වියදම්** | | | | |
| 850,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 583,987 | - | ඒසීඒ-2(ii) |
| 350,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 293,105 | 266,353 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 100,000 | හැකියා වර්ධනය | 14 | 93,648 | 36,000 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| **1,300,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **970,740** | **302,353** | |
| | තැන්පතු ගෙවීම් | | - | - | ඒසීඒ-4 |
| 2,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 773,473 | 1,629,087 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **773,473** | **1,629,087** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 22,274,201 | 18,158,296 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(5,412,151)** | **(2,876,651)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (5,412,151) | (2,876,651) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | ඒසීඒ-3 |
| | | | **(5,412,151)** | **(2,876,651)** | |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 46,784,790 | 24,906,562 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 2,909,110 | 2,943,555 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **49,693,900** | **27,850,117** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 2,909,110 | 2,943,555 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 46,784,790 | 24,906,562 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **49,693,900** | **27,850,117** |

පිටු අංක…1…….සිට …30…… දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක …31…. සිට …38…. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදු කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ………………… | ………………… | ………………… |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම: ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන | නම: නීතිඥ සී.එස්. අබේසේකර | නම: නීතිඥ සී.එස්. අබේසේකර |
| තනතුර: ලේකම් | තනතුර: ලේකම් | ලේකම් |
| අධිකරණ ... අමාත්‍යාංශය | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව |
| අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. | අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත, කොළඹ 12. | අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත, කොළඹ 12. |
| දිනය: 2025/02/28 | දිනය: 2025/02/24 | දිනය: 2025/02/24 |

2

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 614,243 | - |
| අග්‍රිම ලැබීම් | | 16,898,000 | 14,353,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 807,918 | - |
| තැන්පතු ලැබීම් | | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **18,320,161** | **14,353,000** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 16,505,829 | 12,847,296 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 1,491 | 22,875 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 32,678 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 35,950 | 45,093 |
| අත්තිකාරම් ගෙවීම් | | 773,473 | 1,135,383 |
| තැන්පතු ගෙවීම් | | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **17,349,420** | **14,050,648** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **970,740** | **302,353** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | | |
| පොළී | | | |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | | - | - |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | 970,740 | 302,353 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **970,740** | **302,353** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | | **(970,740)** | **(302,353)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | - | - |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | - | - |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | - | - |

3

## 1.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (i)

### පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය
(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය: අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:

වැඩසටහන් අංකය හා නාමය :

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | | නැත |
| රු | 25,000.01 | වැඩි | | නැත |
| | එකතුව | | | නැත |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | | නැත |
| 2 | | නැත |
| 3 | | නැත |
| 4 | | නැත |
| එකතුව | | නැත |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | | නැත |
| රු | 25,000.01 | වැඩි | | නැත |
| | එකතුව | | | නැත |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | | නැත |
| 2 | | නැත |
| 3 | | නැත |
| 4 | | නැත |
| එකතුව | | නැත |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | නැත |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | නැත |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | නැත |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

..........................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025/02/24

ඇමුණුම -(ii)

# පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය :

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :

වැඩසටහන් අංකය හා නාමය:

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| (i) | රු. 25,000.00 අඩු | .............. | නැත | ......... ........ |
| (ii) | රු. 25,000.01 වැඩි | .............. | නැත | ................... |
| | එකතුව | | - | නැත |

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

| අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොහල ශේෂය රු. | අලාභයේ වටිනාකම රු. | අයකර ගැනීම් රු. | පොතෙන් කපා හල අගය රු. | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු. | පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| 6 | | | | | | |
| එකතුව | | | | | | නැත |

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.......................................................

ප්‍රධාන මුල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025/02/24

නීතිඥ සී.එස්. අබේසේකර
ලේකම්
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත
කොළඹ 12.

* නම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

# දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:

වියදම් ශීර්ෂ අංකය:

වැඩසටහන් අංකය හා නාමය:

| පුද්ගලයාගේ/ආයතනයේ නම | බැදීම් අංකය | දිනය | ශීර්ෂය | වැඩසටහන | ව්‍යාපෘතිය | උප ව්‍යා | වැය විෂයය | අයිතම අං | මූල්‍යාකරණය | බැදීම් (රු) (1) | බැදීම් ශේෂය (රු.) (2)=(1)-(3) | බැරකම්වලට ඇතුළත් වූ දිනය | බැරකම් වටිනාකම (රු.) (3) | සංශෝධිත බැරකම (4) | බැරකම් නිදහස් කිරීම (5) | බැරකම් ශේෂය (රු.) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | | | | | | | | | |
| තැපැල් දෙපාර්තමේන්තුව | | 2024 දෙසැම්බර් | 235 | 01 | 01 | | 1402 | | 11 | | | 2024 දෙසැම්බර් | 7,100 | | | 7,100 |
| එකතුව | | | | | | | | | | | | | **7,100** | | | **7,100** |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | | | | | | | | | |
| ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් | | 2024 දෙසැම්බර් | 235 | 01 | 01 | | 1402 | | 11 | | | 2024 දෙසැම්බර් | 19,064 | | | 19,064 |
| මොබිටෙල් ප්‍රයිවට් ලිමිටඩ් | | 2024 දෙසැම්බර් | 235 | 01 | 01 | | 1402 | | 11 | | | 2024 දෙසැම්බර් | 1,749 | | | 1,749 |
| නිපුනි ක්ලීනින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් | | 2024 දෙසැම්බර් | 235 | 01 | 01 | | 1405 | | 11 | | | 2024 දෙසැම්බර් | 34,895 | | | 34,895 |
| ඇමරිකන් ප්‍රිමියම් වෝටර් සිස්ටම් ලිමිටඩ් | | 2024 දෙසැම්බර් | 235 | 01 | 01 | | 1409140 | | 11 | | | 2024 දෙසැම්බර් | 4,919 | | | 4,919 |
| එකතුව | | | | | | | | | | | | | **67,727** | | | **67,727** |

ගෙවීම්/බැදීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැදීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025/02/24

නීතිඥ සී.එස්. අබේසේකර
ලේකම්
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත
කොළඹ 12.

# බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

## මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:
වියදම් ශීර්ෂ අංකය:
වැඩසටහන් අංකය හා නාමය:

| පුද්ගලයාගේ/ආයතනයේ නම | බැඳීම් පිළිබඳ විස්තරය | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.) | මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.) | බැඳීම් හා බැරකම් වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | |
| .................................... | | | | | | | | නැත |
| .................................... | | | | | | | | නැත |
| එකතුව | | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | |
| .................................... | | | | | | | | නැත |
| .................................... | | | | | | | | නැත |
| එකතුව | | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | |
| .................................... | | | | | | | | නැත |
| .................................... | | | | | | | | නැත |
| එකතුව | | | | | | | | |
| මුළු එකතුව | නැත | නැත | නැත | නැත | නැත | නැත | නැත | නැත |

...................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025/02/24

නීතිඥ ඩී.එස්. අබේසේකර
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත
කොළඹ 12.

34

# බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (ii)

## මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:

වියදම් ශීර්ෂ අංකය:

වැඩසටහන් අංකය හා නාමය:

| පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය) | වගකීම් පිළිබඳ විස්තරය | ණයවර ලිපි අංක ආදිය | ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද | | | | තැන්පතු ගිණුම් අංකය | මාරු කරන ලද මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | වැඩසටහන | උප වැඩසටහන | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | | |
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු<br>..........................<br>..........................<br>එකතුව | | | | | | | | නැත<br>නැත |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල<br>..........................<br>..........................<br>එකතුව | | | | | | | | නැත<br>නැත |
| 3. වෙනත් (පෞද්ගලික අංශය)<br>..........................<br>..........................<br>එකතුව | | | | | | | | නැත<br>නැත |
| මුළු එකතුව | | | | | | | | |

* නම වාර්තාකරණ ආයතනයට අදාළ නම් පමණක් ආකෘතිය භාවිත කළ යුතු ය.

..............................................
ප්‍රධාන මුල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025/02/24

... අබේසේකර
මුදල්
හිමි කොමිසන් සභා දෙපාර්තමේන්තුව
අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත
කොළඹ 12.

ඇ.මු

# ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :

වැඩසටහන් අංකය හා නාමය :

| | | රු. |
|---|---|---|
| (1) | ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2024 ඇස්තමේන්තුගත වෙන්කිරීම | නැත |
| (2) | ඉහත (1) ට අදාළ 2024 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම | නැත |
| (3) | 2024 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව | නැත |
| (4) | 2023 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2024 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (ඇත්නම්) | නැත |
| (5) | 2024 වර්ෂය සම්බන්ධයෙන් 2024 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව | නැත |
| (6) | 2023 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2024 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව | නැත |
| (7) | 2024 වර්ෂය සම්බන්ධයෙන් 2024 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව | නැත |
| (8) | 2023 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2024 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව | නැත |
| (9) | 2024 වර්ෂය වෙනුවෙන් 2024 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | නැත |
| (10) | 2024 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව {(3+4+5) - (6+7)} - (8+9) | නැත |
| (11) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2024 වර්ෂය සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව | නැත |
| (12) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2024 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | නැත |
| (13) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (10 + 11 - 12) | නැත |

............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්) / කොමසාරිස් (මුදල්)

දිනය : 2025/02/24

නීතිඥ සී.එස්. අබේසේකර
ලේකම්
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත
කොළඹ 12.

* නම වාර්තාකරණ ආයතනයට අදාළ නම් පමණක් ආකෘතිය භාවිත කළ යුතු ය.

ඇමුණුම - (vii)

# අස්ථානගත චවුචර් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:

වියදම් ශීර්ෂ අංකය:

වැඩසටහන් අංකය හා නාමය:

| දිනය | චවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන (රු) |
|---|---|---|---|---|
| නැත | නැත | නැත | නැත | නැත |

.......................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025/02/24

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

[illegible]. අබේසේකර
ලේකම්
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත
කොළඹ 12.

ඇමුණුම - (viii)

## 2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2024.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.) | 2024.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.) | 2024.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| | ලංකා බැංකුව - අළුත් කඩේ ශාඛාව | 7041539 | 292,587 | - | - | 2024 දෙසැම්බර් |
| | | | | | | |
| | | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

.................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025/02/ 24

නීතිඥ සී.එස්. අබේසේකර
ලේකම්
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
අංක. 80, 04 වන මහල, අධිකරණ මාවත
කොළඹ 12.

38

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

*** මෙම දෙපාර්තමේන්තුව ආදායම් එකතු කිරීමේ කාර්ය සිදු නොකරන බව කාරුණිකව දන්වමි.**

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල්‍ය ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 24,700,000 | 25,860,000 | 20,529,988 | 79.39% |
| ප්‍රාග්ධන | 1,300,000 | 1,300,000 | 970,740 | 25.33% |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | | | | | | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | **578,000** | **578,000** | | **100%** |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |
| | වාහන | **12,000,000** | **12,000,000** | | **100%** |
| | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | **34,206,790** | **34,206,790** | | **100%** |

**3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව****

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/A/DLC/FA/2024/20 — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date 2025 මැයි 30 දින

ලේකම්
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, ඉංග්‍රීසි, දෙමළ) මේ සමඟ එවා ඇත.

යූ.එන්. අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට (වැ.බ)

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
02 JUN 2025

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } JLO/A/DLC/FA/2024/20 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

ලේකම්
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු

ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කළින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන, පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 ආදායම් නොවන ලැබීම්

භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව අත්තිකාරම් ලැබීම් රු.807,918ක් වුව ද, එම වටිනාකම් සටහන් නොකිරීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම්හි මුළු වටිනාකම එම අගයෙන් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

#### 1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැරකිරීම් කිසිවක් නොමැති වුව ද, රු.807,918ක් ලෙස අග්‍රිම ගැළපුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

#### 1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 04 වන වගන්තිය අනුව සියලුම රජයේ ආයතන මූල්‍ය නොවන වත්කම් වාර්තාකරනයේදී රු.5,000 හෝ ඊට වැඩි වටිනාකමක් සහිත මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන වාර්තා කළ යුතු වුව ද, රු.5,000ට අඩු රු.229,160ක් වටිනා පාරිභෝගික භාණ්ඩ අයිතම 501ක් මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ආ) නව CIGAS වැඩසටහන දෙපාර්තමේන්තුව තුළ 2024 වර්ෂයේ සිට භාවිතා කිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු මූල්‍ය නොවන වත්කම් තක්සේරුකර තිබුණි. ඒ අනුව, විගණනය වෙත ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාව අනුව වෙනත් යන්ත්‍ර හා උපකරණවල එකතුව රු.34,495,611ක් වුව ද, රු.33,947,340ක් ලෙස රු.548,271ක් අඩුවෙන් භාණ්ඩාගාර මුද්‍රිත SA 82හි දක්වා තිබුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත SA 82 අනුව පොත්පත් වාරසඟරා සහ සඟරාහි වටිනාකම රු.27,388,342ක් වුව ද, දෙපාර්තමේන්තුවේ New CIGAS වැඩසටහනෙන් ලබාගත් උපලේඛනය අනුව එය රු.27,377,550ක් වූයෙන් රු.10,792ක් අඩුවෙන් New CIGAS වැඩසටහනෙහි දක්වා තිබුණි.

1.6.4 අග්‍රිම ශේෂය

(අ) භාණ්ඩාගාර මුද්‍රිත SA 71 අනුව වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම් රු.875,852ක් වුව ද, ACA 3 ආකෘතියෙහි එම අගය ඇතුළත්කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත SA 71 අනුව වියදම් මඟින් අග්‍රිම පියවීම රු.17,737,902ක් වුව ද, රු.16,862,050ක් ලෙස රු.875,852ක් අඩුවෙන් ACA 3 ආකෘතියෙහි දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 16ක හා මූලධන වැය විෂයයන් 02ක ප්‍රතිපාදිත රු.24,360,000කින් රු.5,424,385ක් ඉතිරි වී තිබුණු අතර, එය සියයට 12 සිට සියයට 99 දක්වා වූ පරාසයක විහිදී තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයය 02ක එකතුව රු.100,000ක් වූ ප්‍රතිපාදන මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ඇ) 235-1-1-0-1403/0-11 වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් යටතේ රු.500,000ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රමාණය සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. ඒ අනුව එම වැය විෂයයෙහි වියදම් නොවී ඉතිරි වූ මුළු ප්‍රතිපාදනය රු.570,190ක් වී තිබුණු අතර, වියදම් කළමනාකරණය කිරීමේ චක්‍රලේඛනයට අනුගතව වියදම් සීමාකිරීම් ලෙස හේතු දක්වා තිබුණ ද, මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීමේදී අවශ්‍යතාව නිවැරදිව හඳුනානොගෙන ප්‍රතිපාදන මාරුකර තිබුණි.

(ඈ) වැය විෂයයන් 05ක එකතුව රු.3,105,694ක ඉතිරිවීම් සඳහා 2024 වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයෙන් ඉතිරි වූ ප්‍රමාණය ලෙස හේතු දක්වා තිබුණ ද, මෙම වැය විෂයයන්හි ඉතිරිවීම්වලට හේතු සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් කරුණු

මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත්කර නොතිබුණු අතර, අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.

(ඉ) 235-1-1-0-1203-002/11 වැය විෂයයෙහි රු.30,000ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 60ක ඉතිරිවීම සඳහා 2024 වර්ෂයේ වෙන්කළ ප්‍රතිපාදනයෙන් වැය වූ ප්‍රමාණය ලෙස හේතු දක්වා තිබුණි. නිලඇඳුම් දීමනාව සඳහා හිමිකම් සහිත අනුමත නිලධාරීන් සංඛ්‍යාව 07ක් වුව ද, ඒ පිළිබඳ සලකාබැලීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.

(ඊ) 235-1-10-1506-0/11 වැය විෂයයෙහි ඉතිරිවීම සියයට 99.25ක් වූ අතර, එම ඉතිරිවීම්වලට හේතු ලෙස දැනට ඉල්ලුම්කර ඇති හා සුදුසුකම් සපුරා ඇති සියලු නිලධාරීන්ට ලබාදුන් පසු ඉතිරිය ලෙස දක්වා තිබුණි. ඒ අනුව, රජයේ සේවකයන් සඳහා දේපල ණයපොළී අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.

(උ) වැය විෂයයන් 03ක රු.447,381ක ඉතිරිවීම සඳහා දෙසැම්බර් මාසයට අදාළ වියදම් ලෙස හේතු දක්වා තිබුණ ද, දෙසැම්බර් මාසයට අදාළව එම වැය විෂයයන් 03 සඳහා එකතුව රු.65,253ක වියදම් දැරීමෙන් පසු රු.382,128ක ප්‍රතිපාදන කවදුරටත් ඉතිරි වී තිබුණි.

**3.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතෙහි 7(1) ඡේදය | අයකර ගන්නා ලද රු.3,975ක් වටිනා මුද්දර ගාස්තු සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සෑම කාර්තුවක් අවසන් වී දින 15ක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුව ද, එසේ කටයුතුකර නොතිබුණි. |
| (ආ) | 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024හි 3.1 වගන්තිය | CIGAS වෙබ්ස්ථාපිත යෙදුම මගින් උත්පාදනය කරන ශේෂ පිරික්සුම ඇමුණුමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබිය යුතු වුව ද, එය අමුණා නොතිබුණි. එමෙන්ම නව CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන |

| | | |
|---|---|---|
| | | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන වන SA 10, 12, 50, 51 හා 90 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර නොතිබුණු අතර, නව CIGAS වෙබ් යෙදුම මඟින් ජනනය කරන ලද සමුච්චිත බැදීම් හා බැරකම් වාර්තාව ඇමුණුම (iii) වෙනුවට ඇතුළත් කළ යුතු වුව ද, එසේ අමුණා නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 238 (5) | මාසික වැටුප් ලබාගන්නා එක් එක් නිලධාරියා විසින් පඩි සටහන්පත්‍රයේ අත්සන් තබා ඇති බව වැටුප් ගෙවන නිලධාරීන් විසින් තහවුරුකර ගත යුතු වුව ද, අවස්ථා 23කදී එකතුව රු.1,744,263ක වැටුප් ගෙවීම් වෙනුවෙන් නිලධාරීන් වැටුප් සටහන්පත්‍ර අත්සන්කර නොතිබුණි. |
| (ඈ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මුදල් රෙගුලාසි 371(2)(අ) ප්‍රකාරව | සුළුමුදල් අතුරු අග්‍රිමයෙන් එක්වරකදී එක් අවශ්‍යතාවයකට ගෙවිය හැකි උපරිම සීමාව රු.5,000 නොඉක්මවිය යුතු වුව ද, අවස්ථා 04කදී රු.5,000 ඉක්මවා රු.25,810ක මුදලක් වියදම් කර තිබුණි. |

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) 2024 වර්ෂය තුළ නීති ප්‍රතිසංස්කරණ කාර්යයන් 04ක් ක්‍රියාත්මකකර තිබුණු අතර, මෙය 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණි. මේ තුළ ඇතුළත් බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ කාර්යය ආරම්භකර තිබුණේ 2023 ජුනි 26 වන දින ය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ කාර්යභාරය හා අරමුණු ඇතුළත් වන පරිදි පිළියෙලකර නොතිබුණු අතර, කාර්යසාධන දර්ශක ආයතනයේ කාර්යභාරය හා අරමුණු මත පදනම්ව හඳුනාගැනීමට කටයුතුකර නොතිබුණි.

### 4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

1969 අංක 03 දරන නීති කොමිෂන් සභා පනතේ 05 වන වගන්තිය ප්‍රකාරව නීති අධ්‍යාපනය සම්බන්ධයෙන් නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව පනත ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

### 4.2 රජයේ නිලධාරීන් ඇපතැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද රජයේ ගිණුම්වලට අදාළ වවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අය ද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇපආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇපතැබිය යුතු නිලධාරීන් දෙදෙනෙකු ඇපතබා නොතිබුණි.

### 4.3 කළමනාකරණ දුර්වලතා

(අ) ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතේ විධිවිධාන සංශෝධනය කිරීම හා හවුල් ව්‍යාපාර නීතියට අදාළ සංශෝධන යන නීති ප්‍රතිසංස්කරණ කාර්යයන් දෙක 2024 වර්ෂයේ පළමු කාර්තුව තුළ ආරම්භ කර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් අවසන්කර නොතිබුණි.

(ආ) 2024 ජනවාරි 18 දින පවත්වනු ලැබූ කොමිෂන් සභා රැස්වීමේදී 2024 වර්ෂය සඳහා රැස්වීම් වාර 12ක් පැවැත්වීමට සාමාජිකයන් එකඟ වී තිබුණ ද, සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් වාර 08ක් පවත්වා තිබූ අතර, ඒ සඳහා කොමිෂන් සභා සාමාජිකයන් 14 දෙනාගෙන් 05 දෙනෙකු කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. මේ අනුව, රැස්වීම් සඳහා සාමාජික සහභාගීත්වය අවම වීම තුළින් නීති කොමිෂන් සභාවේ කාර්යයන් කඩිනමින් කරගෙන යාමට බාධාවක් වී තිබුණි.

(ඇ) වැටුප් රහිත නිවාඩු ලැබ සිටින නිලධාරියකුගෙන් වර්ෂ 1-3ත් අතර කාලයක සිට අයවිය යුතුව පවතින ආපදා ණයශේෂය රු.162,500ක් වී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්යමණ්ඩලය, තථ්‍ය කාර්යමණ්ඩලය

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු(අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 03 | 03 |
| තෘතීයික මට්ටම | 01 | 01 | - |
| ද්විතීක මට්ටම | 15 | 06 | 09 |
| ප්‍රාථමික මට්ටම | 07 | 05 | 02 |
| | 29 | 15 | 14 |

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ ඇතුළත් සහකාර ලේකම් තනතුරෙහි අනුමත සේවක සංඛ්‍යාව 04ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 01ක් වුයෙන් පුරප්පාඩු 03ක් පැවතිය ද, එම තනතුරු පිරවීම අවශ්‍ය නොවන බව ලේකම් විසින් දන්වා තිබුණි.

(ආ) ද්විතීක මට්ටම තුළ අනුමත සේවක සංඛ්‍යාව 15ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 06ක් වුයෙන් පුරප්පාඩු 09ක් පැවතුණි. මේ තුළ ගිණුම් සහකාර එක් තනතුරක් ද, සංවර්ධන නිලධාරී තනතුරු 01ක් ද, කළමනාකරණ සහකාර තනතුරු 06ක් ද, ලඝු ලේඛක තනතුර ද පුරප්පාඩු වී තිබුණි. නමුත් ලඝුලේඛක තනතුර යටපත් කළ හැකි තනතුරක් ලෙස ලේකම් විසින් දන්වා තිබුණි.

(ඇ) ප්‍රාථමික මට්ටම තුළ ඇතුළත් රියදුරු තනතුරෙහි අනුමත සේවක සංඛ්‍යාව 04ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 02 වුයෙන් පුරප්පාඩු 02ක් පැවතුණි.

යූ.එන් [illegible]ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට (වැ.බ)

## 04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1. යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | 92% | | |
| 2.වාහන | | | 67% |
| 3.ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම | | 84% | |
| 4.කාර්ය මණ්ඩල පුහුණු | 94% | | |

| අනු අංකය | දර්ශකය | ඒකකය | | කා1 | % | කා2 | % | කා3 | | කා4 | % | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති නීති ප්‍රතිසංස්කරණ ගණන. | අංකය | **T** | 5 | 100% | - | - | - | | - | | 5 |
| | | | **P** | **5** | | **-** | | | | **-** | | **5** |
| 02 | පවත්වන ලද රැස්වීම් ගණන | අංකය | **T** | 3 | 66% | 3 | 66% | 3 | 66% | 3 | 66% | 12 |
| | | | **P** | **2** | | **2** | | **2** | | **2** | | **8** |
| 03 | පවත්වන ලද පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් ගණන | අංකය | **T** | 3 | 100% | 2 | 50% | 2 | 100% | - | 100% | 7 |
| | | | **P** | **12** | | **1** | | **2** | | **2** | | **17** |
| 04 | අවසන් කරන ලද වාර්තා සහ සාකච්ඡා කරන ලද පර්යේෂණ වාර්තා ගණන | අංකය | **T** | - | - | 1 | 100% | - | | 5 | 100% | 5 |
| | | | **P** | - | | 1 | | | | **4** | | **5** |
| **සාමාන්‍ය භෞතික ප්‍රගතිය** | | | | | **89%** | | **72%** | | **83%** | | **100%** | |

**අවසන් කරන ලද වාර්තා සහ සාකච්ඡා කරන ලද පර්යේෂණ වාර්තා - එකතුව 05**

කා 1 - බුන්වත්භාවය පිළිබඳ නීතිය - අවසානයි 01

කා 4 - සාකච්ඡා කරන ලද පර්යේෂණ වාර්තා

- ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත } 03 04
- සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9(අ) වගන්තියට මැතකදීකරනලද සංශෝධන පිළිබඳ ගැටළු 01

**එකතුව** **<u>05</u>**

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| තිරසර සංවර්ධන අරමුණුවලට අනුව ප්‍රධාන අරමුණු තුනක් හඳුනාගෙන ඇත.<br>5 වන අරමුණ:<br>ස්ත්‍රී-පුරුෂ සමානත්වය ඇතිකිරීම සහ සියලු කාන්තාවන් හා ගැහැණු දරුවන් බලගැන්වීම.<br>10වන අරමුණ: රටවල් තුළ සහ රටවල් අතර අසමානත්වය අවම කිරීම.<br>16 වන  අරමුණ:<br>තිරසර සංවර්ධනය සඳහා සාමකාමීත්වය අන්තර්ගත සමාජ ප්‍රවර්ධනය කිරීම, සැමටම යුක්තිය සඳහා ප්‍රවේශ ලබාදීම සහ සියලු ප්‍රමිතීන් අන්තර්ගත කළ ඵලදායී, වගකිවයුතු ආයතන සැදීම. | 1. අසාධාරණ සාධක මත වෙන්කරගත හැකි අයුරින් වන සියලු ආකාරවල නීති ඉවත් කිරීම හා සමානාත්මක නෛතික ආරක්ෂාව සහතික වීම සහ අසාධාරණ සාධක මත වෙන්කරනු ලබන පරතර අවම කිරීම.<br>2. නව නීති පිළියම් හා සංකල්ප මගින් පවතින නීතිය ප්‍රගතිශීලී ජාත්‍යන්තර සම්මතිවලට අනුව යාවත්කාලීන කිරීම.<br>3. පවතින නීති පද්ධතියේ සංවර්ධනය කළ යුතු කරුණු හඳුනාගැනීම සහ වඩා උචිත නීති පිළියම් හඳුනාගැනීම.<br>4. නීතියේ රීති ප්‍රවර්ධනය කිරීම සහ සැමට යුක්තිය සඳහා සමාන ප්‍රවේශ සහතික වීම.<br>5.මහජනතාවට, ශිෂ්‍යයන්ට සහ අධ්‍යනය කරන්නන්ට තර්ක-විශ්ලේෂණ භාවිත කරමින් නීතිය සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම ඇතිකිරීම සඳහා නව නීති නිර්දේශ හඳුන්වා දීම. | 1. මහජනතාව සහ රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද නීති යෝජනා සහ ඉදිරිපත් කිරීම් සාකච්ඡා කිරීම.<br>2. ජාත්‍යන්තර නීති සම්මතීන්ට අනුකූලව පර්යේෂණ පත්‍රිකා සැකසීම සහ විශ්ලේෂණය කිරීම.<br>3. නීති කොමිෂන් සභාවේ අදහස් සහ ඉදිරිපත් කිරීම් ඇතුළත්කොට නීති නිර්දේශ සැදීම.<br>4. අධිකරණ අමාත්‍යාංශය හෝ අදාළ බලධාරීන් වෙත අවසානාත්මක කළ නීති නිර්දේශයන් ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කිරීම.<br>5. නීති කොමිෂන් සභාව විසින් අවසානාත්මක කරන ලද නීති ඉදිරිපත් කිරීම් සහ පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද පනත් , නීති කොමිෂන් සභා වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම. | | | ✓ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ශ්‍රී ලංකාව මුහුණ දී ඇති වත්මන් ආර්ථික අර්බුදය හමුවේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝගය ජය ගැනීම සඳහා නීති කොමිෂන් සභාව ලෝක බැංකු නියෝජිතයින් සමග සම්බන්ධිකරනයෙන් ඉදිරිපත් කරන ලද බංකොලොත්භාවය පිළිබඳව යෝජිත නීති ප්‍රතිසංස්කරණ යෝජනාවලිය ඉතා වැදගත් වේ. මෙම නීතිමය සංශෝධනය තුලින් රටේ බංකොලොත්භාවය පිලිබඳ නීතිමය රාමුව ශක්තිමත් කොට අන්තර්ජාතික ආයෝජකයින් මෙරටට ආකර්ශය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / **අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | |
| ලේකම් | 1 | 1 | - |
| නියෝජ්‍ය ලේකම් | 1 | 1 | - |
| සහකාර ලේකම් | 4 | 1 | 3 |
| තෘතියික මට්ටම | | | |
| භාෂා පරිවර්තක | 1 | 1 | - |
| ද්වීතීය මට්ටම | | | |
| ගිණුම් සහකාර | 1 | - | 1 |
| සංවර්ධන නිලධාරී | 4 | 3 | 1 |
| පුස්තකාලයාධිපති | 1 | 1 | - |
| කළමනාකරණ සේවා නිලධාරී | 8 | 2 | 6 |
| ලඝු ලේඛක | 1 | - | 1 |
| ප්‍රථමික මට්ටම | | | |
| රියදුරු | 4 | 2 | 2 |
| කාර්යාල සේවක සේවය | 3 | 3 | - |
| එකතුව | **29** | **15** | **14** |

## 06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

ආයතනයේ මාණ්ඩලික තනතුරුවල මෙන්ම අනෙකුත් තනතුරුවල පුරප්පාඩු පැවතියද තත්‍ය කාර්ය මණ්ඩලය යොදා ගනිමින් මානව සම්පත් වඩා ඵලදායී ලෙස කළමනාකරණය කොට ආයතනයේ කාර්යසාධනය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබී ඇත.

## 06.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | දින 10 | රු 40,000 | | දේශීය | රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආශිත දැනුම |
| විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම | 02 | දින 01 | රු 12,000 | | දේශීය | ආරක්ෂිතව රිය පැදවීම සම්බන්ධ දැනුම |
| වියදම් හා ගෙවීම් පටිපාටිය | 02 | දින 01 | රු 27,000 | | දේශීය | රාජ්‍ය වියදම් හා ගෙවීම් සම්බන්ධ දැනුම |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂනය | 01 | දින 01 | රු 13,500 | | දේශීය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂනය සම්බන්ධ දැනුම |
| දෙමළ භාෂා පාඨමාලාව | 02 | පැය 150 | රු 1,148 | | දේශීය | දෙමළ භාෂාව පිළිබඳ දැනුම |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

## 07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | මෙම දෙපාර්තමේන්තුව සඳහා අදාළ නොවේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | | |
| 1.6 | වෙනත් | | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම්කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක නොවන අතර එම කටයුතු අධිකරණ, අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ලබා දී තිබීම | | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක නොවන අතර එම කටයුතු අධිකරණ අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | ගර්හිත වූ වාහන මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැති බව කාරුණිකව දන්වමි. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | එවැනි වාහන මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැති බව කාරුණිකව දන්වමි. | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අක්‍රිය බැංකු ගිණුම් මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැති බව කාරුණිකව දන්වමි. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | යුතුව තිබූ ශේෂ මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැති බව කාරුණිකව දන්වමි. | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | | අනුකූල නොවේ | හදිසි අනතුරකට ලක් වීම හේතුවෙන් එම නිලධාරියා ප්‍රතිකාර ගනිමින් සිටියි. |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | පොදු තැන්පතු ගිණුමක් පවතවාගෙන නොයන අතර මෙම දෙපාර්තමේන්තුවට පොදු තැන්පතු ගිණුම පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැත. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | | අනුකූල නොවේ | තත්කාර්ය අතුරු අග්‍රිම අවශ්‍ය නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | | අනුකූල නොවේ | තත්කාර්ය අතුරු අග්‍රිම අවශ්‍ය නොවීය. |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | මෙම දෙපාර්තමේන්තුව ආදායම් රැස් කිරීමේ කටයුත්ත සිදු නොකරන බව කාරුණිකව දැනුම් දෙමි. | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | 2024 වර්ෂයේ ආදායම් ලැබීම් කිසිවක් නොමැත. | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | හිඟ ආදායම් වාර්තා නොමැති බව කාරුණිකව දන්වමි. | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමට පහසුකම් සලසා තිබීම | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**අවසානය.**